

වාර්ෂික වාර්තාව

2021

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

ජාතිය බල ගැන්වීම

වාර්ෂික වාර්තාව 2021

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වන අප, මහජන සහභාගීත්වය ඇතිව ප්‍රතිපත්තිමය වෙනස්කම් සඳහා පහසුකම් සැලසීම තුළින් විදුලිබල, ජල සේවා සහ ඛනිජ තෙල් කර්මාන්ත නංවාලීමේ ජාතික අරමුණක් සඳහා කැපවෙමින්, දීප්තිමත් අනාගතයක් කරා ළඟා වීමට අපේක්ෂාවෙන් පසුවන්නා වූ සමෘද්ධිමත් ජාතියක සිහින බල ගැන්වීමට උත්සාහ කරන්නෙමු.

ජාතිය බල ගැන්වීම

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (කොමිසම හෝ PUCSL) විදුලිබල කර්මාන්තයේ ආර්ථික, ආරක්ෂක සහ තාක්ෂණික නියාමකයා ලෙස හඳුන්වනු ලබන අතර ලිහිසි තෙල් වෙළෙඳපොළේ ඡායා නියාමකයා ලෙස ද ක්‍රියා කරනු ලබයි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත මගින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) විදුලි බල, ජල සේවා සහ ඛනිජ තෙල් කර්මාන්ත නියාමනය කිරීම සඳහා නම් කර ඇත. 2002 අංක 35 දරණ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත, 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනත සහ 2013 අංක 31 දරණ ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත යටතේ මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අරමුණු, කාර්යයන් සහ නීතිමය රාමුව අර්ථ දක්වා ඇත.

වසර 19 කට වැඩි කාලයක් පුරා ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තය නඟා සිටුවීම උදෙසා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නියාමන යාන්ත්‍රණයන් සකස් කර ඇති අතර අවසානයේ දී එය සාමාන්‍ය ජනතාව ඇතුළු එහි භාවිතා කරන්නන් හට ප්‍රයෝජනවත් වනු ඇත. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මඟින් විදුලිය ජනනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, සැපයුම සහ භාවිතය නියාමනය කරනු ලබයි. අප විසින් සපයනු ලබන බොහෝ වැදගත් සේවාවන් අතරින්, ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රයට ප්‍රමාණවත් ආයෝජනයක්, කාර්යක්ෂම සැපයුමක්, සහ විදුලි පාරිභෝගිකයින් සඳහා ගුණාත්මක සේවා තත්වයක් වැඩිදියුණු කර ඇති බව අපි සහතික කරමු.

ජල සේවා සහ ඛනිජ තෙල් කර්මාන්ත ද්විත්වය නියාමනය කිරීමට අදාළ පනත් තවමත් පාර්ලිමේන්තුව හරහා සම්මත වීමට නියමිත බැවින් මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ජල සේවා සහ ඛනිජ තෙල් කර්මාන්ත සමීපව අධීක්ෂණය කරනු ලබන අතර එහි පාර්ශ්වකරුවන් සමඟ කටයුතු කරමින් නියාමන උපදෙස් සපයනු ලබයි.

ඉදිරිය කරා ඇදෙමින්, අපගේ පාලන ප්‍රමිතීන් සහ නව්‍ය ප්‍රවේශය දියුණු කිරීම මඟින් නියාමන යන්ත්‍රණය හරහා අපගේ සියලුම පාර්ශවකරුවන් හට වඩා හොඳින් සේවය කිරීම සඳහා ඔවුන් හට වටිනාකමක් නිර්මාණය කිරීමට අපි දිගට ම කටයුතු කරන්නෙමු.

අන්තර්ගතය

සභාපතිවරයාගේ පණිවිඩය 5

අප පිළිබඳව 6

ආයතනික තොරතුරු 7

කොමිෂන් සභාවේ සාමාජිකයින් 8

අපගේ දැක්ම 9

අපගේ මෙහෙවර 9

මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ කාර්යයන් 10

වාර්තාව පිළිබඳ හැඳින්වීම 13

විදුලි බල කර්මාන්තය 14

01 වන ප්‍රතිඵලය - විදුලි පාරිභෝගිකයන් සඳහා වැඩි දියුණු කළ ඵලදායිතාව සහ පහසුව 15

2 වන ප්‍රතිඵලය - පාරිභෝගිකයින්ට දැරිය හැකි මිල සහ බලපත්‍රලාභීන් සඳහා තිරසාර මූල්‍ය ස්ථාවරත්වය 21

03 වන ප්‍රතිඵලය - මහජනතාවගේ, බලපත්‍රලාභීන්ගේ සහ මෙහෙයුම්කරුවන්ගේ දේපල සහ සෑම ජීවියෙකු සඳහා ම ඉහල ආරක්ෂාවක් වැඩි දියුණු කිරීම 23

04 වන ප්‍රතිඵලය - මිනිසුන්, සතුන් සහ ශාක සඳහා පාරිසරික තත්ත්වයන් වැඩිදියුණු කිරීම 28

ඛනිජ තෙල් කර්මාන්තය සහ ලිහිසි තෙල් වෙළෙඳපොළ 29

ජල සේවා කර්මාන්තය 31

වෙනත් ක්‍රියාකාරකම් 32

2022 වසර සඳහා අපගේ ක්‍රියාකාරකම් 38

2021 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව 103

2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශය 104

විගණන කමිටු වාර්ථාව 105

සභාපතිවරයාගේ පණිවිඩය

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2021 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කිරීමට මම සතුටු වෙමි. වසංගත සමයේ මෙන් ම සහ රට තුළ පවතින සාර්ව ආර්ථික අර්බුදය හමුවේ විදුලිය, ජලය සහ ඛනිජ තෙල් කර්මාන්තයන්හි අපගේ ක්‍රියාකාරකම් තුළින් කොමිෂන් සභාව විසින් සිදු කර ඇති වටිනාකම් නිර්මාණය පිළිබඳ ගැඹුරු අවබෝධයක් අපගේ වාර්තාව මඟින් ඔබට ලබා දෙනු ඇතැයි මම විශ්වාස කරමි.

බොහෝ හේතු නිසාවෙන් විදුලිබල කර්මාන්තය අභියෝගයට ලක් වූ නමුත් වඩාත් ම බලපෑමට ලක් වූයේ රටෙහි සාර්ව ආර්ථික අර්බුදය හේතුවෙනි. මුහුණ දුන් අභියෝග මධ්‍යයේ වුව ද, 2021 වර්ෂය තුළ දී කර්තව්‍යයන් රැසක් ඉටුකර ගැනීමටත් නව ව්‍යාපෘති රැසක් දියත් කිරීමටත් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට හැකි විය.

කොමිෂන් සභාව, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි (පුද්ගලික) සමාගම අතර ශක්තිමත් හවුල්කාරිත්වයක් සහ සහයෝගීතාවයක් ඇති බව අපි විශ්වාස කරන අතර සපයනු ලබන සේවාවන්ගෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට විදුලිබල අමාත්‍යාංශය පාර්ශ්වකරුවන්ට උපකාර කරනු ඇත. ජල විදුලි උත්පාදනයේ ඉහළ දායකත්වයත් සමඟ පෙර වසරට සාපේක්ෂ ව 2021 වර්ෂයේ දී විදුලි ජනනය ගිගාවොට් පැය 16,716 දක්වා සියයට 6.4 කින් වැඩි විය.

ශ්‍රී ලංකාව සඳහා අඛණ්ඩ විදුලි සැපයුමක් සහතික කිරීම උදෙසා විදුලිබල අංශයේ අධීක්ෂණ සහ නියාමන කටයුතු ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට හැකි විය. ජාතික වෘත්තීය සුදුසුකම් 03 (NVQ 3) නොමිලේ ලබා දීමෙන් අර්ධ නිපුණතා සහිත විදුලි කාර්මිකයන් වෘත්තීමය වශයෙන් හැඩ ගැන්වූ විදුලි කාර්මිකයන් බවට සවිබල ගැන්වීමේ කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට ද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට හැකි විය. මෙම ප්‍රයත්නය ජල නල, ඉදිකිරීම් ක්ෂේත්‍රය ආදී අනෙකුත් වෘත්තීන් වෙත ද ව්‍යාප්ත කිරීමට අපි සැලසුම් කරමින් සිටින්නෙමු.

ජාතිය උදෙසා අඛණ්ඩ ව විදුලිය සැපයීම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සිය අධීක්ෂණ කටයුතු සහ නියාමන ක්‍රියාකාරකම් ද අඛණ්ඩව කරගෙන යන ලදී. කෙසේ වෙතත්, අනාගත බලශක්ති අභියෝගවලට මුහුණ දීම සඳහා සහ අඛණ්ඩ විදුලි සැපයුමක් සැපයීම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවට අවම පිරිවැයක් සහිත දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම ක්‍රියාත්මක කිරීම අතිශයින් වැදගත් බව කොමිෂන් සභාව විසින් තරයේ විශ්වාස කරනු ලැබේ.

වසංගතය විසින් එල්ල කරන ලද අභියෝග මධ්‍යයේ වුව ද, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වන අපට අපගේ වටිනාකම් වලට අනුගතව මෙන් ම අපගේ උපාය මාර්ග හරහා අපගේ අරමුණු ඉටු කිරීමට හැකි විය. මෙම උපාය මාර්ගවල ප්‍රතිඵලය සමඟින්, අනාගතය නව්‍ය ආකාරයෙන් ප්‍රතිනිර්මාණය කිරීම සඳහා අපට ස්ථානගත වීමට හැකි වනු ඇතැයි මම විශ්වාස කරමි.

ජනක රත්නායක

සභාපති

අප පිළිබඳව

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ක්‍රියාත්මක වූයේ 2003 වසරේ පළමු කොමසාරිස්වරුන් කණ්ඩායම සහ එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කිරීමත් සමඟ ය. ප්‍රතිපත්ති සම්පාදන විෂය භාර අමාත්‍යවරයා විසින් පංච පුද්ගල කොමිසම පත් කරනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට එකඟව වසර පහක කාලයක් සඳහා ය. 2002 අංක 35 දරණ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත, 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනත සහ 2013 අංක 31 දරණ ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත මගින් කොමිෂන් සභාව පාලනය වේ. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මඟින් විදුලි බල කර්මාන්තය නියාමනය කරන අතර ලිහිසි තෙල් වෙළඳපොළ සඳහා ඡායා නියාමක ලෙස ද ක්‍රියා කරනු ලබයි.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව යනු එමගින් ගනු ලබන සියලු තීරණ ගැඹුරින් විශ්ලේෂණය කර සභාපති, උප සභාපති සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පත් කරන ලද සාමාජිකයින්ගෙන් සමන්විත කොමිෂන් සභා සාමාජිකයින් විසින් අනුමත කරනු ලබන්නා වූ ස්වාධීන කොමිෂන් සභාවකි.

විදුලිය, ජල සේවා, ඛනිජ තෙල් කර්මාන්ත සහ ලිහිසි තෙල් වෙළඳපොළ ආශ්‍රිත කර්මාන්තවල ඉහළ දක්ෂතා ඇති වෘත්තිකයන්ගෙන් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සමන්විත වේ.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ආර්ථික, ආරක්ෂාව සහ තාක්ෂණික නියාමකයා ලෙස විදුලිබල කර්මාන්තය නියාමනය කරනු ලබන අතර ලිහිසි තෙල් වෙළෙඳපොළේ ඡායා නියාමකයා ලෙස ද ක්‍රියා කරනු ලබයි.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ජල සේවා සහ ඛනිජ තෙල් කර්මාන්ත සමඟ සමීප ව කටයුතු කරමින් ඒවාට නියාමන උපදෙස් ලබා දීමට කටයුතු කරනු ලබන අතර ම කර්මාන්ත දෙක ම නියාමනය කිරීමට අදාළ පනත් තවමත් පාර්ලිමේන්තුව හරහා සම්මත වීමට නියමිත ව ඇත.

ආයතනික තොරතුරු

කොමිෂන් සභාවේ නම - ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

නෛතික තත්ත්වය - 2002 අංක **35** දරණ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලදී.

කොමිෂන් සභා සාමාජිකයන්

ජනක රත්නායක මහතා - සභාපති

මහාචාර්ය ජානක ඒකනායක - උප සභාපති

චතුරිකා විජේසිංහ මහත්මිය - කොමිෂන් සභාවේ සාමාජිකා

උදේනි වික්‍රමසිංහ මහතා - කොමිෂන් සභාවේ සාමාජික

මොහාන් සමරනායක මහතා - කොමිෂන් සභාවේ සාමාජික

අධ්‍යක්ෂ ජනරාල්
දමිත කුමාරසිංහ මහතා

කොමිෂන් සභාවේ ලේකම්
ජානකී එම් විතානගම මිය

විගණකවරුන්
විගණකාධිපති දෙපාර්තමේන්තුව, 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

ලියාපදිංචි කාර්යාලය
6 වන මහල, BOC වෙළඳ කුළුණ ශාන්ත මයිකල් පාර, කොළඹ 3, ශ්‍රී ලංකාව.
විද්‍යුත් තැපෑල: info@pucsl.gov.lk
දුරකථන: +9411 239 2607/8
ෆැක්ස්: +9411 239 2641
වෙබ් අඩවිය: www.pucsl.gov.lk

බැංකුකරු
ලංකා බැංකුව 1 වන සහ 2 වන මහල, BOC වෙළඳ කුළුණ, අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ.

කොමිෂන් සභාවේ සාමාජිකයින්



ඉදිරිපස වම් කෙළවරේ සිට

ජනක රත්නායක මහතා, මහාචාර්ය ජානක ඒකනායක

මොහාන් සමරනායක මහතා, චතුරිකා විජේසිංහ මහත්මිය, උදේනි වික්‍රමසිංහ මහතා

අපව මෙහෙයවනු ලබන්නේ....

අපගේ දැක්ම

තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයේ සීමාවන් තුළ ශ්‍රී ලංකාවේ සියලු ම වැසියන්ට සහ එහි සංවර්ධනයට දායක වන්නන්ට අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සහ උපයෝගිතා සේවා වඩාත් පිරිමැසුම්දායි ප්‍රවේශයකින් ලබා දිය හැකි වාතාවරණයක් නිර්මාණය කිරීම.

අපගේ මෙහෙවර

වර්තමාන සහ අනාගත පාරිභෝගිකයන් වෙත වඩාත් සාධාරණ හා දිගුකල් පවත්නා ආකාරයට ආරක්ෂිත, විශ්වාසනීය සාධාරණ මිලකට යටිතල පහසුකම් සේවා සහතික කිරීම සඳහා, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ විෂය පථයට ඇතුළත් වන සියලු ම උපයෝගිතා නියාමනය කිරීම.

මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ කාර්යයන්

2002 අංක 35 දරණ මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ දක්වා ඇති පරිදි මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ කාර්යයන් පහත පරිදි වේ.

(අ) PUCSL පනත හෝ ඕනෑම කර්මාන්ත පනතක් මගින් හෝ යටතේ කොමිෂන් සභාව වෙත පිරිනමා ඇති හෝ පවරා ඇති බලතල, කාර්යයන් සහ රාජකාරි ක්‍රියාත්මක කිරීම, ක්‍රියාවේ යෙදීම සහ ඉටු කිරීම.

(b) කොමිෂන් සභාවේ තීරණ මගින් බලපෑමක් ඇති වීමට ඉඩ ඇති යම් තැනැත්තකු හෝ කණ්ඩායමක් සමඟ, කොමිෂන් සභාව විසින් උචිත යැයි සලකන ප්‍රමාණයට, සාකච්ඡා කිරීම.

(c) PUCSL පනතේ විෂය පථයට අයත් ඕනෑම කර්මාන්තයක් සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාව සුදුසු යැයි සලකන පරිදි රජයට උපදෙස් දීම.

(d) මහජන උපයෝගිතා පනතේ 15(4) වගන්තියට යටත් ව, මහජන උපයෝගිතා කර්මාන්ත පිළිබඳ තොරතුරු රැස් කිරීම, වාර්තා කිරීම සහ බෙදා හැරීම.

(e) කොමිෂන් සභාවේ කාර්යයන් පාලනය කරන යහපත් පරිචයන් පිළිබඳ සංග්‍රහයක් ඇතුළත් නියාමන අත්පොතක් කොමිෂන් සභාව පිහිටුවා මාස හයක් ඇතුළත සකස් කර අවශ්‍ය විට දී එය සංශෝධනයට ලක් කිරීම.

(f) යම් කර්මාන්ත පනතක සපයා ඇති සියලු ම කරුණු සම්බන්ධයෙන් බලපත්‍ර ලබා දීම, නියාමන සහ පරීක්ෂණ කටයුතු සිදු කිරීම.

(g) යම් කර්මාන්ත පනතක අධිකාරිය යටතේ නිකුත් කරන ලද බලපත්‍ර, කොන්ත්‍රාත්තු සහ වෙනත් සාධන පත්‍රවල විධිවිධාන බලාත්මක කිරීම.

(h) යම් කර්මාන්ත පනතක් මගින් නියමිත අවස්ථාවල දී, නියාමනය කරන ලද ආයතන විසින් අය කරනු ලබන තීරු බදු සහ අනෙකුත් ගාස්තු නියාමනය කිරීම.

(i) යම් මහජන උපයෝගිතා කර්මාන්තයක පැන නගින ආරවුල් මැදිහත් වී විනිශ්චය කිරීම.

(j) මහජන උපයෝගිතා කර්මාන්තවල ආරක්ෂාව, ගුණාත්මකභාවය, අඛණ්ඩතාව සහ විශ්වසනීයත්වය සම්බන්ධ තාක්ෂණික සහ අනෙකුත් ප්‍රමිතීන් සකස් කර බලාත්මක කිරීම.

(k) කොමිෂන් සභාව විසින් එහි කිසියම් කාර්යයක් ඵලදායි ලෙස ඉටු කිරීම සඳහා සුදුසු යැයි සලකනු ලබන වෙනත් ආනුෂංගික හෝ උපයෝගී ක්‍රියාකාරකම් සිදු කිරීම.

ප්‍රතිඵල සඳහා අපගේ ඉලක්ක - විදුලිබල කර්මාන්තය

1. 01 වන ප්‍රතිඵලය - විදුලි පාරිභෝගිකයන් සඳහා වැඩි දියුණු කළ ඵලදායිතාව සහ පහසුව

2. 02 වන ප්‍රතිඵලය - පාරිභෝගිකයින්ට දැරිය හැකි මිල සහ බලපත්‍රලාභීන් සඳහා තිරසාර මූල්‍ය ස්ථාවරත්වය

3. 03 වන ප්‍රතිඵලය - මහජනතාවගේ, බලපත්‍රලාභීන්ගේ සහ මෙහෙයුම්කරුවන්ගේ දේපල සහ සෑම ජීවියෙකු සඳහා ම ඉහල ආරක්ෂාවක් වැඩි දියුණු කිරීම

4. 04 වන ප්‍රතිඵලය - මිනිසුන්, සතුන් සහ ශාක සඳහා පාරිසරික තත්ත්වයන් වැඩිදියුණු කිරීම

ප්‍රතිදානය සඳහා අපගේ ඉලක්ක

බලශක්ති ගුණාත්මකභාවය

1. පාරිභෝගිකයින් වෙත කෙරෙන ව්‍යවස්ථාපිත විදුලි බල සැපයුම් වෝල්ටීයතා මට්ටම් මත බලපත්‍රලාභීන්ගේ අනුකූලතාව ඉහළ යාම.
   එනම් වෝල්ටීයතාව සඳහා 230 V ± 6% සහ සංඛ්‍යාතය සඳහා 50 Hz ± 0.5%

සැපයුම් ගුණාත්මකභාවය

2. වසරක් තුළ පාරිභෝගිකයකු අත්විඳින සාමාන්‍ය විදුලිය ඇනහිටීම් කාලය සඳහා සේවා සපයන්නන් විසින් ඉලක්කවලට අනුකූල වීමේ ඉහළ යාම.
3. වසරක් තුළ පාරිභෝගිකයෙකු අත්විඳින සාමාන්‍ය විදුලිය විසන්ධි කිරීම් සංඛ්‍යාව සඳහා සේවා සපයන්නන් විසින් ඉලක්කවලට අනුකූල වීමේ ඉහළ යාම.
4. පාරිභෝගික සේවා මාර්ග දෝෂ යථා තත්වයට පත් කිරීමේ ප්‍රතිස්ථාපන කාලය සඳහා සේවා සපයන්නන් විසින් ඉලක්කවලට අනුකූල වීමේ ඉහළ යාම.

සේවා ගුණාත්මකභාවය

5. විදුලි සැපයුම් සේවා හා සම්බන්ධ ඔවුන්ගේ අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබඳව පාරිභෝගිකයින් සඳහා දැනුවත්භාවය ඉහළ යාම.
6. පාරිභෝගික විමසීම්/ ඉල්ලීම්/ පැමිණිල්ලක් සඳහා සේවා සම්පාදනයට ගතවන සාමාන්‍ය කාලය සඳහා වන ඉලක්ක කෙරෙහි සේවා සපයන්නා විසින් දක්වන අනුකූලතාව වැඩි වීම.

7. පාරිභෝගික පැමිණිලි/ ආරවුල් සඳහා සේවා සම්පාදනයට ගත වන සාමාන්‍ය කාලය කෙරෙහි ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් දක්වන අනුකූලතාව වැඩි වීම

සැපයුම් ප්‍රමාණවත් බව

8. රටේ විදුලි ඉල්ලුම සෑම විට ම සපුරාලීම සහතික කිරීම සඳහා විදුලි උත්පාදන සැලසුම්වලට අනුකූල වීමේ ඉහළ යාම.
9. බලශක්ති කාර්යක්ෂමතාව සහ සංරක්ෂණ කටයුතු පිළිබඳ සියලු පාර්ශ්වකරුවන් සඳහා දැනුවත් කිරීමේ සහ දැනුම ඉහල යාම.
10. විදුලිය බෙදාහැරීමේ සේවා සපයන්නන් විසින් උපයෝගිතා මත පදනම් වූ ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ රෙගුලාසිවලට අනුකූල වීමේ ඉහළ යාම.

විදුලි ගාස්තු සහ සේවා ගාස්තු

11. විදුලිය සැපයීමේ දී දැරීමට සිදුවන පිරිවැය සහ පනවන ලද තීරුබදු සම්බන්ධයෙන් සියලු පාර්ශ්වකරුවන් සඳහා විනිවිදභාවය සහ සාධාරණත්වය වැඩි කිරීම
12. පාරිභෝගිකයින්ට පිරිනමනු ලබන සේවාවන් සඳහා සේවා සපයන්නන් විසින් අය කරනු ලබන ගාස්තු පිළිබඳ විනිවිදභාවය සහ සාධාරණත්වය වැඩි කිරීම

විදුලි ආරක්ෂාව

13. ඉලක්කයට වඩා අඩු විදුලි කම්පන සහ මාරක විදුලි අනතුරු සංඛ්‍යාව අවම කිරීම සඳහා සියලු ම පාර්ශවකරුවන් සඳහා දැනුවත් කිරීම සහ දැනුම වැඩි කිරීම
14. විදුලි කම්පන සහ මාරක විදුලි අනතුරු සංඛ්‍යාව අවම කිරීම සඳහා සියලු ම පාර්ශවකරුවන් විසින් රෙගුලාසිවලට අනුකූල වීම වැඩි කිරීම

පරිසරය

15. විදුලිබල කර්මාන්තයේ බලපත්‍රලාභීන් විසින් පාරිසරික රෙගුලාසිවලට අනුකූල වීමේ ඉහළ යාම.
16. පුනර්ජනනීය බලශක්ති ඉලක්ක පිළිබඳ රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල වීමේ ඉහළ යාම.

වාර්තාව පිළිබඳ හැඳින්වීම

2021 වාර්ෂික වාර්තාව මඟින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව 2021 වර්ෂය තුළ ලබා ඇති සවිස්තරාත්මක ප්‍රගතිය ලබා දීමට උත්සාහ කෙරෙන අතර එමඟින් බහු කර්මාන්ත සහ වෙලඳපොලවල් හරහා සංකීර්ණ සහ විවිධ නියාමන මෙහෙයුම් සඳහා පැහැදිලි බවක් ගෙන එනු ඇත.

මෙම වාර්තාව මඟින්,

- බහු කර්මාන්ත සම්බන්ධයෙන් ඇති කරන ලද නියාමන බලපෑම
- පර්යේෂණ සොයාගැනීම්
- ඉදිරි වසර සඳහා සැලසුම්
- මූල්‍ය තත්ත්වය

පිළිබිඹු කරනු ලබයි.

විදුලිබල කර්මාන්තයේ සමතුලිත හා අදාළ තොරතුරු ලබා දීමත් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් වසර පුරාවට සිදු කර ඇති නියාමන බලපෑම මෙන් ම ජල සේවා සහ ඛනිජ තෙල් කර්මාන්ත සඳහා සහාය දැක්වීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීමත් මෙම වාර්තාවෙන් සිදු කෙරේ. කොමිෂන් සභාවේ සවිස්තරාත්මක මූල්‍ය තත්ත්වය ද වාර්තාවේ දක්වා ඇත.

එලඹෙන වර්ෂයේ දී විවිධ කර්මාන්තයන්හි සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් ද 2021 වාර්ෂික වාර්තාව මඟින් ඉදිරිපත් කරනු ලබයි.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව දැනට විදුලි කර්මාන්තය නියාමනය කරනු ලබන අතර ලිහිසි තෙල් වෙළඳපොලේ ඡායා නියාමකයා ලෙස ද ක්‍රියා කරනු ලබයි. ඛනිජ තෙල් හා ජල සේවා කර්මාන්ත කොමිෂන් සභාවේ නියාමන විෂය පථය යටතට ගැනීමට අවශ්‍ය කර්මාන්ත පනත් තවම පාර්ලිමේන්තුව හරහා සම්මත කර ගැනීමට නො හැකි වී ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මෙම කර්මාන්ත දෙකම නුදුරු අනාගතයේ දී නියාමනය කිරීමේ අපේක්ෂාවෙන් එහි අවශ්‍ය මූලික වැඩ කටයුතු සිදු කරමින් සිටී.

විදුලි බල කර්මාන්තය

විදුලි උත්පාදනය

වසර 2021

ගිගා වොට් පැය 16,716

6.4 % ↑

පාරිභෝගිකයින් සංඛ්‍යාව (LECO පාරිභෝගිකයින් ඇතුළු ව)

වසර 2021
7,401 ↑

වසර 2020
7,213

ස්ථාපිත ධාරිතාව (මෙගා වොට්)

	2020	2021
ජල විදුලි	1,383	1383
ඉන්ධන තෙල්	1268	1087
ගල් අඟුරු	900	900
පුනර්ජනනීය බලශක්තිය (NCRE)	715	817

උත්පාදනය (ගිගා වොට් පැය)

	2020	2021
ජල විදුලි	3,911	5,640
ඉන්ධන තෙල්	4,182	2,634
ගල් අඟුරු	5,754	5,519
පුනර්ජනනීය බලශක්තිය (NCRE)	1,866	2,922

විදුලි අලෙවිය
වසර 2021
ගිගා වොට් පැය 15,214 ↑
6.5 %

විදුලි බල කර්මාන්තය

01 වන ප්‍රතිඵලය - විදුලි

පාරිභෝගිකයන් සඳහා වැඩි දියුණු කළ ඵලදායිතාව සහ පහසුව

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) බලපත්‍රලාභීන්ගේ ඵලදායිතාව ඉහළ නැංවීම උදෙසා මෙන් ම ශ්‍රී ලංකාවේ විදුලිය භාවිතා කරන්නන්ගේ පහසුව වැඩිදියුණු කිරීම උදෙසා ඔවුන්ගේ ගැටළු එක් පදනමකින් ආමන්ත්‍රණය කිරීම සහ වෙනත් විවිධ වේදිකා හරහා ආමන්ත්‍රණය කිරීම හරහා ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. මෙම ප්‍රතිඵලය යටතේ එන ඉතා තීරණාත්මක ක්‍රියාකාරකමක් වන්නේ පාරිභෝගික පැමිණිලි කොමිසමේ සමථ ක්‍රියාවලිය හරහා වර්ග කිරීම වන අතර එහි දී පාරිභෝගිකයාට විශාල මුදලක් වැය කර නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය නො වන අතර කොමිසමේ මැදිහත්වීමෙන් පාර්ශවයන් අතර ගැටලුව විසඳා ගත හැකි ය. පවතින ප්‍රතිපත්ති නැවත සලකා බැලීම, නව නියාමන මෙවලම් (ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ, රීති, ක්‍රමවේදයන්) අවශ්‍ය විට දී සහ අවශ්‍ය අවස්ථාවන්හි දී සකස් කිරීම සහ නියාමන මෙවලම් පිළිබඳ ව හා නියාමන රාමුව වඩා හොඳින් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ ව පාර්ශවකරුවන් දැනුවත් කිරීම ද ක්‍රියාකාරකම්වලට ඇතුළත් වේ.

මාර්ග පත්‍ර ගැටළු (Way leave issues) විසඳීම සඳහා සංශෝධිත මාර්ග පත්‍ර මාර්ගෝපදේශ පිළිබඳ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ දැනුවත්භාවය සහ අනුකූලතාව වැඩි දියුණු කිරීම පිළිබඳ සංවාදය

නියාමන රාමුව නිසියාකාර ව ක්‍රියාත්මක නො වන එක් කරුණක් වන්නේ විවිධ නියාමන මෙවලම්වලට සම්බන්ධ පාර්ශ්වකරුවන්ගේ දැනුවත් භාවය නොමැතිකම බව PUCSL විසින් හඳුනාගෙන ඇත. එබැවින්, මගපෙන්වීම් වලට අනුකූල වීමේ දැනුම වැඩි දියුණු කිරීම පිණිස මාර්ගපත්‍ර ගැටළු විසඳීම සඳහා සංශෝධිත මාර්ග පත්‍ර මාර්ගෝපදේශය පිළිබඳ ව ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීමේ සහ සංවාදයක් ඇති කිරීමේ වැඩසටහනක් 2021 වර්ෂයේදී මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් දියත් කරනු ලබයි. පාරිභෝගිකයින්ගේ මාර්ග පත්‍ර ගැටළු විසඳීම සඳහා සංශෝධිත මාර්ග පත්‍ර මාර්ගෝපදේශය කෙතරම් ඵලදායී ලෙස යොදා ගත හැකි ද සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් ගැටළු විසඳීමේදී මුහුණ දෙන ගැටළු මොනවා ද සහ කෙසේ ද යන්න පිළිබඳ ව මෙන් ම විදුලි පනතට අනුව ඒවා විසඳා ගත හැකි ආකාරය පිළිබඳ ව දිස්ත්‍රික්ක 25 පුරාවට ම ප්‍රාදේශීය ලේකම්වරුන් අමතා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

1. ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් මාර්ග පත්‍ර ගැටළු හැසිරවීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම
2. මාර්ග පත්‍ර පිළිබඳ පැමිණිලි අඩු කිරීම
3. පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කෙරෙන පාරිභෝගික පැමිණිලි ක්‍රමානුකූලව විසඳීම

සඳහා මෙම සංවාදය ප්‍රයෝජනවත් වනු ඇත.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	95%

(වෙන්දේසි කරන ලද) ඉඩම් කට්ටි කිරීමට විදුලි සම්බන්ධතාවය සැපයීම පිළිබඳ මාර්ගෝපදේශය

ඉඩම් සංවර්ධකයින් විසින් ඉඩම් වෙන්දේසි කිරීමට පෙර යටිතල පහසුකම් සපයා නොමැති කට්ටි කරන ලද ඉඩම් සඳහා විදුලි සම්බන්ධතා නොලැබීමේ ගැටළු පිළිබඳව පාරිභෝගිකයින්ගෙන් මහජන උපයෝගිතා කොමිසමට ඉහළ පැමිණිලි සංඛ්‍යාවක් යොමු වේ. එවැනි පැමිණිලිවලට අනුව, ඉඩම් හිමියන් හෝ දේපල සංවර්ධකයින් විසින් මිල දී ගත් ඉඩම් සමඟ විදුලි සම්බන්ධතා ලබා දෙන බවට පාරිභෝගිකයින්ට බොහෝ විට පොරොන්දු වී ඇත. එහෙත් තවමත් විදුලි සැපයුම් නොමැති ව පාරිභෝගිකයන් දැඩි දුෂ්කරතාවට පත් ව සිටිති. වයඹ පළාතේ

නාගරික සංවර්ධන අධිකාරී පනතේ සහ එහි සංශෝධන පනත්වල සහ ඒ සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාව ද ඔවුන්ට තම පාරිභෝගිකයින්ට විදුලි සම්බන්ධතාවයක් ලබා දීමට ප්‍රතිපාදන සහ වාණිජ තත්ත්වය (බෙදා හැරීමේ පද්ධති අලාභ සහ සේවා තත්ත්වය) මට්ටම් වැඩි දියුණු කිරීම සඳහා ඇතත්, 1960 නිවාස හා නගර වැඩිදියුණු කිරීමේ ආඥාපනත යටතේ, ප්‍රධාන ගැටළුව වනුයේ තමන්ගෙන් කට්ටි කරන ලද ඉඩම් මිල දී ගත් පාරිභෝගිකයින්ට විදුලි සම්බන්ධතාවයක් සැපයීමට ඉඩම් හිමියන්ට හෝ දේපල සංවර්ධකයින්ට කොන්දේසියක් දක්වා නොමැති වීමයි. තත්ත්වය සැලකිල්ලට ගෙන, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය, පළාත් සභා, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි (පුද්ගලික) සමාගම වැනි අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් කට්ටි කර බෙදන ලද ඉඩම් සඳහා විදුලි සම්බන්ධතා සැපයීම පිළිබඳ ව මාර්ගෝප දේශයක් සැකසීමට PUCSL විසින් කටයුතු ආරම්භ කරන ලදී.

සැපයුම් ලබා දිය යුතු පදනම්, අවශ්‍යතා, කාල රාමුව යනාදිය ඇතුළත් කෙටුම්පත් මාර්ගෝපදේශ සම්පූර්ණ කරන ලද අතර කෙටුම්පත් මාර්ගෝපදේශ සඳහා අනෙකුත් පාර්ශව කරුවන්ගෙන් කැමැත්ත ලබා ගන්නා ලදී. මාර්ගෝපදේශය ක්‍රියාත්මක කරනු ලහන පාර්ශ්වකරුවන් සමඟ අවබෝධතා ගිවිසුමක් ද අත්සන් කරන ලදී. 2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත මාර්ගෝපදේශය නිල වශයෙන් නිකුත් කිරීමට PUCSL විසින් සැලසුම් කරනු ලබයි.

භෞතික ප්‍රගතිය	70%
මූල්‍ය ප්‍රගතිය	30%

ලංකා විදුලිබල මණ්ඩලයේ පාරිභෝගික සේවා කාර්ය සාධනය මැනීම

නියාමන අධිකාරියක් ලෙස සේවා සපයන්නන්ගේ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම PUCSL හි වගකීම ක් වේ. 2016 ජූලි 13 වැනි දින ප්‍රකාශයට පත් කරන ලද අංක 1975/44 දරන ගැසට් නිවේදනය යටතේ විදුලිය (බෙදාහැරීමේ) කාර්ය සාධන ප්‍රමිති කොන්දේසිය මත ඉඩම් හිමියන්ට හෝ දේපළ සංවර්ධකයින්ට රෙගුලාසි සැපයීම සඳහා, බලශක්ති ගුණාත්මකභාවය, සැපයුම් තත්ත්වය බලපත්‍රලාභීන්ගේ කාර්ය සාධනය කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලැබේ. ඒ අනුව, වාණිජ ගුණාත්මකභාවයට අදාළ පාරිභෝගික සේවා කාර්ය සාධනය මැනීම පාරිභෝගික කටයුතු අංශය විසින් සිදු කරනු ලබන අතර බලශක්තියේ ගුණාත්මකභාවය සහ සැපයුම් ගුණාත්මකභාවය සම්බන්ධයෙන් කාර්ය සාධනය මැනීම බලපත්‍ර අංශය විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව, ලංකා විදුලිබල මණ්ඩලය විසින් එකඟ වූ කාර්ය සාධන දර්ශක මාසික පදනමින් ගණනය කර ඉදිරිපත් කළ යුතු අතර එහි කාර්ය සාධනය තක්සේරු කර මාසික වාර්තාවක් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

විදුලි බල (බෙදා හැරීමේ) කාර්ය සාධන සම්මත රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන පරමාර්ථය වන්නේ බලපත්‍රලාභීන්ගේ වාණිජ ගුණාත්මකභාවය (බෙදාහැරීමේ පද්ධති අලාභ සහ සේවා ගුණාත්මකභාවය) වැඩි දියුණු කිරීම සහ විදුලි සැපයුම් භාවිතයේ දී පාරිභෝගිකයින්ට වඩා හොඳ සේවාවක් සැපයීමයි. කෙසේ වෙතත්, සිහි කැඳවීම් හරහා දන්වා ඇති පරිදි ලංකා විදුලි බල මණ්ඩලය (CEB) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා අවශ්‍ය ලියකියවිලි තවමත් ඉදිරිපත් කර නැත.

භෞතික ප්‍රගතිය	20%
මූල්‍ය ප්‍රගතිය	අදාල නොවේ

පාරිභෝගික පැමිණිලි කාර්යක්ෂම ව විසඳීම සඳහා නියාමන මෙවලම් (රෙගුලාසි, නීති සහ මාර්ගෝපදේශ) සම්බන්ධ අනුකූල බව සහතික කිරීම සඳහා බෙදා හැරීමේ බලපත්‍රලාභීන් සමඟ සංවාදය

පාරිභෝගික අයිතීන් මෙන්ම බලපත්‍රලාභීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා බලපත්‍රලාභීන්

විසින් නියාමන මෙවලම්වලට අනුකූල වීම සහතික කිරීම අත්‍යවශ්‍ය වේ. PUCSL විසින් නියාමන මෙවලම් සම්බන්ධ බෙදා හැරීමේ බලපත්‍රලාභී නිලධාරීන්ගේ දැනුමේ අඩුවක් හඳුනා ගෙන ඇති අතර එම හිඩැස පිරවීම සඳහා ශ්‍රී ලංකාවේ සියලු ම බෙදා හැරීමේ කාර්යාල ආවරණය වන පරිදි මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් දියත් කරන ලදී. ලංකා විදුලිබල මණ්ඩලයට අනුයුක්ත විදුලි ඉංජිනේරුවන් 1500 කට අධික සංඛ්‍යාවක් සහ පළාත් නවයේ ම සියලු ම බෙදා හැරීම් බලපත්‍ර ලාභී (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - විධායක සේවා මට්ටමේ) නිලධාරීන් ව කොමිෂන් සභාව විසින් අදාළ නීති, රෙගුලාසි, රීති, මාර්ගෝපදේශ ආදිය පිළිබඳ ව දැනුවත් කරන ලදී.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	96%

පළාත් හතෙහි (බස්නාහිර, වයඹ, සබරගමුව, මධ්‍යම, උතුර, නැගෙනහිර, ඌව) විදුලි පාරිභෝගික පැමිණිලි විසඳීම සඳහා ජංගම සේවාව

ඉහළ පාරිභෝගික - උපයෝගිතා තෘප්තිය ළඟා කර ගැනීමේ දී විසඳිය යුතු / දැනුවත් කළ යුතු පුළුල් පරාසයක ගැටළු / ප්‍රශ්න විදුලි පාරිභෝගිකයින්ට ඇත. මෙම ප්‍රමාණවත් නොවීම සඳහා ප්‍රධාන හේතුව වනුයේ පාරිභෝගික - උපයෝගිතා හෝ වෙනත් අදාළ නියෝජිතායතන අතර නිසි දැනුවත්භාවයක් සහ එලදායී ලෙස මෙහෙයවීමක් නොමැතිකම ය.

පාරිභෝගිකයින්ට ඔවුන්ගේ පොරොත්තු දුක් ගැනවිලි / අපැහැදිලි ගැටළු අදාළ / වගකිව යුතු බලධාරීන් හෝ නිලධාරීන් සමඟ මුහුණට මුහුණ රැස්වීමක් සඳහා ආරාධනා කිරීම මඟින් පාරිභෝගිකයින්ට අවශ්‍ය මග පෙන්වීම / විසඳුම් ලබා දෙනු ඇත.

ඒ අනුව, අදාළ රාජ්‍ය නිලධාරීන්, සේවා නියෝජිතයන් හට මුහුණට මුහුණ රැස්වීමක් සඳහා ආරාධනා කරමින් පළාත් පහක ජංගම සේවා සැසඳුම් සංවිධානය කිරීමට මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමත් වූ අතර එහි දී පාරිභෝගිකයන් වෙත නිසි දැනුවත් කිරීමක් සමඟ විසඳුම් කඩිනමින් ලබා දුන් අතර දිනක් ඇතුළත ගැටලු විසඳා ගත නොහැකි වූ ගැටළු මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ කඩිනම් පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලියකට යොමු කෙරිණි. තව දුරටත් බලපත්‍රලාභීන්ට සහ පාරිභෝගිකයින්ට එකිනෙකා අතර සුහද සබඳතාවක් ගොඩ නගා ගැනීමට හැකි විය. අභියෝගාත්මක කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ වුව ද උතුරු මැද, මධ්‍යම සහ සබරගමුව පළාත් ආවරණය කිරීමට මහජන උපයෝගිතා කොමිෂන් සභාවට හැකි විය.

භෞතික ප්‍රගතිය	45%
මූල්‍ය ප්‍රගතිය	65%

2021 වසරේ පැමිණිලි 650ක් විසඳා ඇත
උතුරු මැද
මධ්‍යම
සබරගමුව

අදාළ නීති සහ මාර්ගෝපදේශවලට අනුකූල ව පාරිභෝගික දුක් ගැනවිලි සහ බලපත්‍රලාභී උපදෙස් ඉල්ලීම් සඳහා පහසුකම් සැලසීම

පාරිභෝගික පැමිණිලිවලට පෙනී සිටීම PUCSL හි තීරණාත්මක වගකීමකි. PUCSL හි මැදිහත්වීම මත, නීතිමය ක්‍රියාපටිපාටිය හරහා නොගොස් තම ගැටළු විසඳා ගැනීමට පාරිභෝගිකයාට හැකි වේ. PUCSL නියාමන මෙවලම් පිළිපැදීම වැඩි දියුණු කිරීම සඳහා නියාමන ආශ්‍රිත කරුණු පිළිබඳ ව බලපත්‍රලාභීන්ට උපදෙස් දෙනු ලබයි. PUCSL නියාමන මෙවලම් පිළිපැදීම වැඩි දියුණු කිරීම සඳහා නියාමන ආශ්‍රිත කරුණු පිළිබඳ ව බලපත්‍රලාභීන්ට උපදෙස් දෙනු ලබයි. 2021 දී PUCSL වෙත අලුත් පැමිණිලි 437 ක් ලැබිණි. වසර ගණනාවක් පුරා වැඩි ම පැමිණිලි ලැබී ඇත්තේ එකම කාරණයක් වන මාර්ග පත්‍ර ගැටළු සම්බන්ධයෙනි.

PUCSL වෙත ලැබුණු පාරිභෝගික පැමිණිලි - 2021 වසර

	2019 වසර		2020 වසර		2021 වසර	
ප්‍රවර්ගය	නව සිද්ධීන් ප්‍රමාණය	ලිපි හුවමාරු ප්‍රමාණය	නව සිද්ධීන් ප්‍රමාණය	ලිපි හුවමාරු ප්‍රමාණය	නව සිද්ධීන් ප්‍රමාණය	ලිපි හුවමාරු ප්‍රමාණය
නව සම්බන්ධතා	61	159	54	115	103	132
විසන්ධි කිරීම් සහ නැවත සම්බන්ධ කිරීම්	16	30	15	36	24	36
බිල්පත් සම්බන්ධ	36	73	105	168	62	98
මනු සම්බන්ධ	22	72	13	37	1	21
මාර්ග -පත්‍ර	163	431	102	267	123	235
ගුණාත්ම කභාවය සම්බන්ධ	36	85	30	70	43	54
ගාස්තු කාණ්ඩයේ වෙනස	11	43	12	26	5	13
එකතුව	**463**	**1199**	**410**	**905**	**437**	**717**
වෙනත්	118	306	79	186	76	128

විදුලි (ආරවුල් විසඳීම) රීතියට අනුකූලව ආරවුල් විසඳීම

පළමු පාර්ශ්ව ද්විත්වය අතර සාකච්ඡාවකින් පැමිණිල්ලක් විසඳීමට නොහැකි වූ විට එය ආරවුලක් බවට පත් වේ. 2021 දී මහජන උපයෝගිතා කොමිෂන් සභාවට ආරවුල් 05 ක් ලැබුණු අතර එකක් විසඳා ඇති අතර අනෙකුත් ආරවුල් 04 ක් සාකච්ඡා මට්ටමේ පැවතුණි. PUCSL විසින් පාරිභෝගිකයින් සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් (විදුලිය බෙදාහරින බලපත්‍රලාභීන්) සඳහා ආරවුල් විසඳීමේ ක්‍රියා පටිපාටිය සහ ආරවුල් විසඳීමේ රීතිය වඩා හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහා වන නීති රීති පිළිබඳ අධ්‍යාපන ව්‍යාපාරයක් ද සිදු කරන ලදී.

භෞතික ප්‍රගතිය	60%
මූල්‍ය ප්‍රගතිය	20%

පාරිභෝගික උපදේශක කමිටුව (CCC) සම්බන්ධීකරණය

PUCSL පනතේ 29 වගන්තියට අනුව, පාරිභෝගික උපදේශක කමිටුවක් (CCC) පත් කළ යුතු ය. පාරිභෝගික උපදේශක කමිටුවෙහි කාර්යයන් වන්නේ;

01. සුදුසු ප්‍රමිතීන් පිළිබඳ ව කොමිෂන් සභාවට උපදෙස් ලබා දීම,

02. සපයා ඇති භාණ්ඩ හෝ සේවා සම්බන්ධ පාරිභෝගික අවශ්‍යතා මොනවා ද යන්න නිරීක්ෂණය කිරීම

03. ප්‍රමිතීන් පිළිබඳ දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම.

ඒ අනුව රැස්වීම් 08 ක් පවත්වන ලදී. පාරිභෝගික උපදේශක කමිටුව විසින් ඉහළ පාරිභෝගික - උපයෝගිතා තෘප්තියක් ලබා ගැනීම සඳහා නියාමන මෙවලම් පිළිබඳ ව පාරිභෝගිකයා දැනුවත් කිරීමේ අවශ්‍යතා සාකච්ඡා කරන ප්‍රතිපත්ති නිර්දේශ 02 ක් නිර්දේශ කරන ලදී. පාරිභෝගික උපදේශක කමිටුව විසින් සොයා ගන්නා පරිදි විදුලි පාරිභෝගිකයාගේ අතෘප්තියට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ ඔවුන්ගේ පවතින නියාමන මෙවලම් පිළිබඳ දැනුවත්භාවය නොමැතිකමයි.

භෞතික ප්‍රගතිය	67%
මූල්‍ය ප්‍රගතිය	47%

ලංකා විදුලි සමාගම (පුද්ගලික) සමාගමේ පාරිභෝගික සේවා කාර්ය සාධනය මැනීම.

LECO හි පාරිභෝගික සේවා කාර්ය සාධන දර්ශක මාසික, කාර්තුමය සහ වාර්ෂික පදනමින් ගණනය කිරීම් පරීක්ෂා කිරීම, අධීක්ෂණය සහ ඇගයීම. සම්පූර්ණ කරන ලද පාරිභෝගික සේවා කාර්ය සාධනය මැනීමට අදාළ දත්ත පරීක්ෂා කිරීම. LECO මගින් දත්ත ඉදිරිපත් කර ඇගයීම් සිදු කෙරෙමින් පවතී. සම්පූර්ණ කරන ලද කාර්ය සාධන දත්ත පරීක්ෂා කිරීම

භෞතික ප්‍රගතිය	25%
මූල්‍ය ප්‍රගතිය	අදාල නොවේ

ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද සම්ප්‍රේෂණ සැලැස්ම සමාලෝචනය කර කොමිෂන් සභා තීරණය නිකුත් කිරීම

බලපත්‍රලාභී ලංකා විදුලිබල මණ්ඩලය සෑම වසරක ම අවම පිරිවැය දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්මට අනුව විදුලි සම්ප්‍රේෂණ සැලැස්ම මහජන උපයෝගිතා කොමිසමේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබයි. 2021 වර්ෂයේ දී, PUCSL විසින් 2022 -41 අවම පිරිවැය දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම කොන්දේසි සහිත ව අනුමත කරන ලද අතර 2022 ජූනි මාසයේ දී අපේක්ෂා කරන බලශක්ති ප්‍රතිපත්තියට අනුව සැලැස්ම සංශෝධනය කිරීමට ලංකා විදුලිබල මණ්ඩලයට උපදෙස් දෙන ලදී.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	අදාල නොවේ

ආපදා කළමනාකරණ සැලසුම් - විදුලිබල අංශය

2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනත, ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් නිශ්චිත ව දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූල ව, සෑම අමාත්‍යාංශයක් ම, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථාවක් ම ඕනෑ ම ආපදාවක් හෝ ඉදිරියේ දී ඇති විය හැකි ව්‍යසනයකට මුහුණ දීම සඳහා ආයතනික ආපදා කළමනාකරණ සැලැස්මක් සකස් කළ යුතු ය. ආපදා තත්ත්වයක දී මූලික උපයෝගිතා සේවාවල තිරසාර ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා ආපදා කළමනාකරණ සැලැස්මක් (DMP) තිබීම ප්‍රධාන අවශ්‍යතාවයක් ලෙස හඳුනා ගෙන ඇත. උපයෝගිතා සේවා සපයන්නන් විසින් ආපදා කළමනාකරණ සැලසුම් සකස් කළ යුතු අතර සැලැස්ම සකස් කිරීම සඳහා ජාතික මට්ටමේ සැලැස්මකට අනුකූල ව කර්මාන්ත-විශේෂිත වූ මාර්ගෝපදේශයක් මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නිකුත් කළ යුතු ය. 2021 වර්ෂයේ දී, ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීම සඳහා උපදේශන සේවා ප්‍රසම්පාදනය සඳහා ටෙන්ඩරයක් ඉදිරිපත් කරන ලද අතර ලංකා විදුලි බල මණ්ඩලය සහ ලංකා විදුලි සමාගම පුද්ගලික සමාගම වෙතින් මෙහෙයුම් කමිටු පත් කරන ලදී. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මෙම ව්‍යාපෘතිය 2022 වර්ෂයේ දී නිම කිරීමට සැලසුම් කරයි.

භෞතික ප්‍රගතිය	20%
මූල්‍ය ප්‍රගතිය	වෙනත් ක්‍රියාකාරකමක් සඳහා භාවිතා කරන ලදී.

නිදහස් කරන ලද (විදුලිය ජනනය කිරීමට/ බෙදා හැරීමට සහ සැපයීමට බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති) පාර්ශ්වයන්ගේ නියාමන රාමුව නැවත සලකා බැලීම පිළිබඳ උපදේශනය

නිදහස් කරන ලද පාර්ශ්වයන් (විදුලිය උත්පාදනය කිරීමට/ බෙදා හැරීමට සහ සැපයීමට බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති පාර්ශ්වයන්) නිදහස් කිරීමේ සහතිකයක් සහ එහි පනවා ඇති අදාළ කොන්දේසි මගින් මේ මොහොතේ සරල ව නියාමනය කරනු ලැබේ. පසුගිය කාලය තුළ මහල් නිවාස හා මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති අංශයේ ශීඝ්‍ර සංවර්ධනයක් සිදු වූ අතර, දැනට පවතින නියාමන රාමුවෙන් විදුලිය බෙදා හැරීම සහ සැපයීම නිදහස් කළ නොහැකි ආකාරයේ නව ව්‍යාපාර ආකෘති කිහිපයක් සංවර්ධනය වෙමින් පවතී. එසේ ම, නිදහස් පාර්ශවයන් සම්බන්ධයෙන් පවතින ආර්ථික, ආරක්ෂක සහ තාක්ෂණික නියාමන මෙවලම් මේ මොහොතේ ඉතා සීමිතය. විදුලිය උත්පාදනය/ බෙදාහැරීම සහ විකිණීම සම්බන්ධයෙන් පවතින නියාමන රාමුව සියලු පාර්ශ්වකරුවන්ගේ වර්තමාන සහ අනාගත අවශ්‍යතා සලකා බලා සුදුසු පරිදි සංශෝධනය කළ යුතු ය. තව ද, ආර්ථික, ආරක්ෂක සහ තාක්ෂණික රෙගුලාසි සම්බන්ධයෙන් අවශ්‍ය නියාමන මෙවලම් ද හඳුන්වා දිය යුතු ය. එබැවින්, නව වර්ධනයන්ට අනුකූල ව සකස් කර ගත යුතු අඩුපාඩු හඳුනා ගෙන ඒවා හඳුන්වා දීම සඳහා පවතින නියාමන රාමුව අධ්‍යයනය කිරීම අවශ්‍ය බව PUCSL විසින් හඳුනා ගෙන ඇත. වඩාත් ඵලදායී නියාමන මෙවලම් හඳුන්වාදීමත් සමඟ නිදහස් කරන ලද පාර්ශ්වයන් සහ ඔවුන්ගේ කුලී නිවැසියන් ගුණාත්මකභාවය, විශ්වසනීයත්වය, තරඟකාරිත්වය, පාරිභෝගික අයිතිවාසිකම් සහ බැඳීම් යනාදිය සම්බන්ධයෙන් ඔවුන් මේ මොහොතේ නියාමනය කරනු ලබන ආකාරය වඩා ඵලදායී ලෙස නියාමනය කරනු ලැබේ. 2021 වර්ෂයේ දී PUCSL විසින් සමීක්ෂණය පවත්වා වාර්තාව අවසන් කරන ලදී. වාර්තාව 2022 වසරේ එළිදැක්වීමට නියමිත ය.

භෞතික ප්‍රගතිය	90%
මූල්‍ය ප්‍රගතිය	100%

බෙදාහැරීමේ පද්ධතියේ බලශක්ති ගුණාත්මකභාවය සහ සැපයුම් තත්ත්ව මට්ටම ඉහළ නැංවීම

බෙදාහැරීමේ කාර්ය සාධන ප්‍රමිති රෙගුලාසියට අනුව, එම රෙගුලාසිය ක්‍රියාත්මක කිරීම සඳහා පෝෂක වර්ගීකරණය (feeder class classification) සම්පූර්ණ කිරීම අවශ්‍ය වේ. එබැවින්, PUCSL විසින් ලංකා විදුලිබල මණ්ඩලය බෙදාහැරීමේ අංශවල පෝෂක වර්ගීකරණය අවසන් කරන ලදී.

භෞතික ප්‍රගතිය	90%
මූල්‍ය ප්‍රගතිය	අදාල නොවේ

2 වන ප්‍රතිඵලය - පාරිභෝගිකයින්ට දැරිය හැකි මිල සහ බලපත්‍රලාභීන් සඳහා තිරසාර මූල්‍ය ස්ථාවරත්වය

විදුලිය ලබා ගැනීමේ හැකියාව පිළිබඳ ප්‍රතිපත්තිමය උපදෙස්

පවතින පරිශීලක විදුලි ගාස්තු (end-user tariffs) විදුලිය ලබා ගැනීමේ හැකියාව පිළිබඳ පැරණි දත්ත මත පදනම් වන අතර මෑත වසරවල සිදු වූ ජන විකාස සහ සමාජ - ආර්ථික වෙනස්කම්වලට ප්‍රමාණවත් ලෙස නො ගැලපේ. මෙම ක්‍රියාකාරකම 2020 දී නිම කරන ලද විදුලිය දැරිය හැකි බව පිළිබඳ සමීක්ෂණයේ නිමැවුම් දත්ත මත පදනම් වනු ඇති අතර, පාරිභෝගිකයින්ට සහ ජාතික ප්‍රතිපත්ති අරමුණුවලට වඩා හොඳින් සේවය සැපයෙන විදුලි ගාස්තු ව්‍යුහයේ අවශ්‍ය වෙනස්කම් පිළිබඳ තක්සේරුවක් සමඟ ම නව දැරිය හැකි දත්ත සම්බන්ධ වර්තමාන විදුලි ගාස්තු ව්‍යුහය හා අඩු පරිභෝජන පාරිභෝගිකයින් සඳහා සහනාධාර පිරිවැය විශ්ලේෂණය කිරීම එයට ඇතුළත් වේ. PUCSL විසින් වත්මන් ගාස්තු ව්‍යුහය පිළිබඳ සමීක්ෂණයක් සිදු කරන ලද අතර සමීක්ෂණ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 83% ක් වත්මන් ගාස්තු දැරිය හැකි බව සොයා ගෙන ඇත. සොයාගැනීම් මත පදනම් ව, මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් විදුලි ගාස්තු සංශෝධනය සම්බන්ධයෙන් රජයට ප්‍රතිපත්තිමය උපදේශයක් අවසන් කර ඇති අතර එය ලබන වසරේ දී අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට නියමිත ය.

භෞතික ප්‍රගතිය	70%
මූල්‍ය ප්‍රගතිය	අදාල නොවේ

තොග සේවා සම්බන්ධතා (bulk service connections) සැපයීම සහ සම්බන්ධතා වැඩි දියුණු කිරීම සඳහා මාර්ගෝපදේශය

තොග සේවා සම්බන්ධතා ලබාදීමේ දී බලපත්‍රලාභීන්ගේ අනනුකූල පරිවයන් සහ අක්‍රමිකතාවලට තුඩුදී ඇති සම්බන්ධතා වැඩිකිරීම පිළිබඳ ව පාරිභෝගික අංශයට විවිධ ප්‍රදේශවලින් පැමිණිලි ලැබී ඇත. ඒ අනුව, පරිවයන් විධිමත් කිරීම සඳහා තොග සේවා සම්බන්ධතා සැපයීම සහ සම්බන්ධතා වැඩිදියුණු කිරීම, පරීක්ෂක අංශයේ නියාමන අධීක්ෂණයට යටත් ව කොට්ඨාශ ඉංජිනේරුවන්ට ප්‍රමාණවත් අභිමතය ලබා දීම සහ තොග සේවා සම්බන්ධතා ලබා දීමේ දී උපයෝගිතා කළමනාකරුවන්ට මාර්ගෝපදේශ සැපයීම සඳහා PUCSL විසින් මාර්ගෝපදේශයක් සම්පාදනය කරන ලදී. මාර්ගෝපදේශය සැකසීම අවසන් කර ඇති අතර එය ලබන වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ය. මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම මඟින් බලපත්‍රලාභීන්ගේ නොගැලපෙන භාවිතයන් විධිමත් කරන අතර පාරිභෝගික ආරවුල් අවම කර විදුලි පාරිභෝගිකයින්ට වඩා සාධාරණ හා අපක්ෂපාතී ගාස්තු ඇති කරයි.

භෞතික ප්‍රගතිය	90%
මූල්‍ය ප්‍රගතිය	අදාල නොවේ

අවසර ලත් ගාස්තු ක්‍රමවේදය සමාලෝචනය

බෙදාහැරීමේ ජාලයන්හි මෑත කාලීන වර්ධනයන්ට අනුකූල ව ගාස්තු තීරණය කිරීමේ පිරිවැය පරාවර්තක ක්‍රමවේදය සංශෝධනය කළ යුතු ය. වත්මන් යෝජනා ක්‍රමය කෙටි සම්බන්ධතා සඳහා සහ සේවා සම්බන්ධතාවයේ සුළු සංශෝධනයන් සඳහා අසාධාරණ ගාස්තු අය කරනු ලබයි. හදුනා ගත් ගැටළු විසඳීම සඳහා පවතින අවසර ලත් අයකිරීම් ක්‍රමවේදය ඉදිරි දැක්මකින් සමාලෝචනය කර සංශෝධනය කළ යුතු ය. ක්‍රියාකාරකම යනු බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් ගනුදෙනු කරුවන්ගෙන් අය කරන ගාස්තු තීරණය කිරීමේ නියාමන ක්‍රියාවලියේ දී දැනටමත් භාවිතා කරන පවතින නියාමන මෙවලමක සංශෝධනයකි.

මීළඟ ගාස්තු සංශෝධනය මෙම ක්‍රමවේදයට අනුකූල ව සිදුවනු ඇති අතර එහිදී පාරිභෝගිකයින්ට වඩාත් සාධාරණ සහ සාධාරණ ගාස්තු ගෙවීමට හැකි වන බැවින් එම සංශෝධනය විදුලිබල කර්මාන්තයේ ආර්ථික නියාමන ක්ෂේත්‍රයට සෘජු බලපෑමක් ඇති කරනු ඇත.

භෞතික ප්‍රගතිය	90%
මූල්‍ය ප්‍රගතිය	අදාල නොවේ

2019 වර්ෂය සඳහා බෙදා හැරීමේ විගණනය

විදුලිය පිරිවැය අඩු කිරීමට හේතු වන උත්පාදන බෙදා හැරීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා බෙදා හැරීමේ විගණනය (Dispatch Audit) අත්‍යවශ්‍ය වේ. නිකුත් කරන ලද බෙදා හැරීමේ විගණන මාර්ගෝපදේශ සහ 2020 දී සංවර්ධනය කිරීමට නියමිත බෙදා හැරීමේ ක්‍රියා පටිපාටි මත පදනම් ව බෙදා හැරීමේ විගණනයක් සිදු කරනු ලැබේ. ආර්ථික නියාමකයා වශයෙන්, PUCSL විසින් අංශයේ ආර්ථික ස්ථාවරත්වය සහතික කරන අතරම පාරිභෝගිකයාට දැරිය හැකි මිලකට විදුලිය සැපයීම සහතික කළ යුතුය. 2020 වර්ෂයේ දී, PUCSL විසින් ඉදිරි ක්‍රියාත්මක කිරීම සහ යොමු කිරීම් සඳහා කුශලතා ඇණවුම් මත පදනම් වූ බෙදා හැරීමේ විගණන වාර්තාවක් (merit order dispatch audit report) සකස් කරන ලදී.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	60%

යොදා නොගත් බලශක්ති පිරිවැය ඇස්තමේන්තු කිරීම සඳහා පර්යේෂණ

යොදා නොගත් බලශක්ති පිරිවැය (ENS) මඟින් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ජනන සැලසුම් කේතය අර්ථ දක්වා ඇති අතර එම අගය විද්‍යාත්මකව සකසා නොමැත.

යොදා නොගත් බලශක්ති පිරිවැය ස්ථාපිත කිරීමට සහ නිතිපතා යාවත්කාලීන කිරීමට ක්‍රමයක් යෝජනා කිරීමට මොරටුව විශ්ව විද්‍යාලය සමඟ සහයෝගයෙන් පර්යේෂණ සිදු කෙරේ. මෙම පර්යේෂණය 2022 අවසන් වන විට අවසන් කිරීමට බලාපොරොත්තු වන අතර ඉන් අනතුරු ව සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගේ ජාල කේතය / සංවර්ධන සැලසුම් සඳහා අවශ්‍ය සංශෝධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කරනු ඇත. එබැවින්, PUCSL විසින් නියමු සමීක්ෂණය සම්පූර්ණ කර 2021 වර්ෂයේ බලශක්ති පිරිවැය සඳහා දත්ත සපයන ප්‍රධාන වාර්තාවේ වැඩ ආරම්භ කරන ලදී.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	100%

බෙදා හරින ලද උත්පාදනය සමඟ ජාල ක්‍රියාකාරිත්වය පිළිබඳ පර්යේෂණ

2030 වන විට 80% ක පුනර්ජනනීය ද්‍රව්‍ය වෙත යාම රාජ්‍ය ප්‍රතිපත්තිය වන අතර සහ බෙදාහැරීමේ මට්ටමින් අතරමැදි මූලාශ්‍ර මහා පරිමාණයෙන් ඒකාබද්ධ කිරීමත් සමඟ ජාල ක්‍රියාකාරිත්වය සහ ස්ථාවරත්වය ගැටළුකාරී විය හැක. ජාල කේතය / බෙදාහැරීමේ කේතය සහ ජාලකය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනෙකුත් මෙවලම්වල අවශ්‍ය සංශෝධන හඳුනාගැනීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ එක් ව පර්යේෂණ සිදු කරන ලදී. බෙදා හැරීමේ කේතයට අනුව, බෙදා හැරීමේ කේතය බෙදා හැරීමේ ජාලයට බලශක්ති ගබඩාව ඒකාබද්ධ කිරීම සඳහා පහසුකම් සැලසිය යුතු බව සොයා ගන්නා ලදී. බැටරියේ ගබඩා කර ඇති ශක්තිය පාලනය කිරීම සඳහා පාලන ඇල්ගොරිතමයක් (control algorithm) සකස් කළ යුතු ය. තව ද, ප්‍රකාශ වෝල්ටීය (PV) පද්ධති සහ බැටරි ගබඩා කිරීම සමඟ අඩු වෝල්ටීයතා බෙදාහැරීමේ ජාලයට බලශක්ති ඉලෙක්ට්‍රොනික ඒකාබද්ධ කිරීම ඉහළ මට්ටමක පවතිනු ඇත. එබැවින්, බෙදා හැරීමේ කේතය විසින් බලශක්ති විද්‍යුත්-පදනම් වූ අන්තර් සම්බන්ධතාවයේ ඇති ගැටළු බෙදා හැරීමේ ජාලයට නිවැරදි ව ආමන්ත්‍රණය කළ යුතු ය.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	100%

සම්ප්‍රේෂණ පද්ධතිය පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය

සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් හදිසි උත්පාදන යන්ත්‍ර ප්‍රසම්පාදනයේ දී සහ ඒවායේ සංවර්ධන සැලසුම්වල දී සම්ප්‍රේෂණ පද්ධති ගැටලු නැවත නැවතත් අවධාරණය කර ඇත. බොහෝ විට, බලපත්‍රලාභියාගේ හිමිකම් ක්‍රියාත්මක නොවන බැවින් PUCSL විසින් ආකෘතිකරණ ධාරිතාව ගොඩ නගා ගැනීමට සහ මෙම හිමිකම් තහවුරු කිරීමට අවශ්‍ය වේ. සම්ප්‍රේෂණ පද්ධතියේ ගැටළු හඳුනා ගැනීමට සහ විසඳුම් යෝජනා කිරීමට PUCSL විසින් මොරටුව විශ්ව විද්‍යාලය සමඟ සහයෝගයෙන් පර්යේෂණ සිදු කරන ලදී. මෙම පර්යේෂණය 2021 අවසන් වන විට අවසන් කිරීමට බලාපොරොත්තු වන අතර ඉන් අනතුරු ව සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගේ ජාල කේතය / සංවර්ධන සැලසුම් සඳහා අවශ්‍ය සංශෝධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කරනු ඇත.

භෞතික ප්‍රගතිය	
මූල්‍ය ප්‍රගතිය	

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	100%

බලපත්‍රලාභීන් විසින් ගොනු කරන ලද අවසර ලත් ගාස්තු පිළිබඳ සමාලෝචනය

මෙය PUCSL හි සාමාන්‍ය ක්‍රියාකාරකමකි. ක්‍රියාකාරකම හරහා, කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ගාස්තු සඳහා පිරිවැය පරාවර්තක ක්‍රමවේදයට අනුකූල ව, ලංකා විදුලි බල මණ්ඩලය සහ ලංකා විදුලි (පුද්ගලික) සමාගම විසින් ගොනු කරන ලද වෝදනා ඉදිරිපත් කිරීම් සමාලෝචනය කිරීමට PUCSL සැලසුම් කරයි. ඉදිරිපත් කරන ලද අවසර ලත් ගාස්තු PUCSL විසින් අනුමත කරන ලදී.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	අදාල නොවේ

කුඩා බෙදාහැරීම් ගාස්තු සමාලෝචනය

බෙදාහැරීමේ සහ සැපයුම් බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති කුඩා බෙදාහරින්නන් නිදහස් කිරීමේ නියෝගය යටතේ තම පරිශ්‍රයේ බෙදා හරින විදුලිය සඳහා අය කිරීමට පෙර කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා විදුලි ගාස්තු යෝජනාවක් ඉදිරිපත් කළ යුතු ය. ඒ අනුව මෙම සාමාන්‍ය ක්‍රියාකාරකම සම්පූර්ණ කෙරිණි.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	අදාල නොවේ

තොග සැපයුම් ගාස්තු, ඒකාකාර ජාතික ගාස්තු සහ පරිශීලක ගාස්තු සමාලෝචනය

අවසර ලත් ආදායම් වාර්ෂික ව අනුමත කළ යුතු ය. තොග සැපයුම් ගාස්තු සහ පරිශීලක ගාස්තු අර්ධ වාර්ෂික ව සංශෝධනය කළ යුතු ය. ඒකාකාරී ජාතික ගාස්තු ගැලපීම් කාර්තුමය වශයෙන් සිදු කළ යුතු ය. කොමිෂන් සභාව විසින් සම්ප්‍රේෂණ බලපත්‍රලාභී (TL) සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් (DLs) සඳහා අවසර ලත් ආදායම් අනුමත කරන ලදී. ඒ අනුව සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් සහ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් ඒකාකාරී ජාතික ගාස්තු ගැලපීම් භාවිතා කිරීමට නියමිත ය.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	අදාල නොවේ

03 වන ප්‍රතිඵලය - මහජනතාවගේ, බලපත්‍රලාභීන්ගේ සහ මෙහෙයුම්කරුවන්ගේ දේපල සහ සෑම ජීවියෙකු සඳහා ම ඉහල ආරක්ෂාවක් වැඩි දියුණු කිරීම

පාරිභෝගිකයින් අත්විඳින වෝල්ටීයතා උච්චාවචන

ගැටළු ආවරණය කිරීම සඳහා රෙගුලාසි යාවත්කාලීන කිරීම

වෝල්ටීයතා ගුණාත්මකභාවය පිළිබඳ වත්මන් රෙගුලාසි ස්ථාවර තත්වයේ වෝල්ටීයතා සීමාවන් ආවරණය කරන නමුත් වෝල්ටීයතා උච්චාවචනයන් සම්බන්ධයෙන් අදාළ නොවේ. එබැවින් වෝල්ටීයතා උච්චාවචනයන් සම්බන්ධ වෝල්ටීයතා තත්ත්ව ගැටළුවලින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා වෝල්ටීයතා ගුණාත්මකභාවය පිළිබඳ පවත්නා රෙගුලාසි යාවත්කාලීන කිරීමට PUCSL විසින් පියවර ගන්නා ලදී. ඊට අදාළ කෙටුම්පත් වාර්තාව අවසන් කර ඇති අතර එය ක්‍රියාත්මක කරන පාර්ශ්ව සමඟ සාකච්ඡා කර අවසන් සංශෝධන ලබන වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ය.

භෞතික ප්‍රගතිය	50%
මූල්‍ය ප්‍රගතිය	

පුනර්ජනනීය බලාගාරවල නියැදි පරීක්ෂා කිරීම් (බලපත්‍රලාභීන්)

2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ 6 (අ) වගන්තියට අනුව බලපත්‍රයකින් බලයලත් පුද්ගලයන්ගේ විදුලි බලාගාර පරීක්ෂා කිරීමට විදුලි පරීක්ෂකවරුන් අවශ්‍ය වේ. එබැවින් බලපත්‍ර කොන්දේසි සමඟ අනුකූලතා අධීක්ෂණය පවත්වාගෙන යාම අවශ්‍ය වේ. ඒ අනුව, බලපත්‍ර කොන්දේසි සහිත බලපත්‍රලාභීන්ගේ අනුකූලතා අධීක්ෂණය ආවරණය වන පරිදි, ශ්‍රී ලංකා විදුලිබල පනතේ 6 (අ) වගන්තිය සපුරාලීම සඳහා උත්පාදන බලාගාරවල සාම්පල පරීක්ෂා කරන ලදී. සූර්ය බලාගාරවල ආරක්ෂාව සහ නිසි තාක්ෂණික කළමනාකරණය සහතික කිරීම සඳහා මෙම ක්‍රියාකාරකම සිදු කරන ලදී.

විදුලිය බෙදා හැරීම සහ සැපයීම සඳහා බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති පාර්ශ්වයන්ගේ පරිශ්‍ර පරීක්ෂා කිරීම

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 10 (2) වගන්තියට අනුව, යම් පුද්ගලයෙකු හෝ පුද්ගල කාණ්ඩයක් විසින් බෙදා හැරීමට නියමිත විදුලිය ප්‍රමාණය හෝ විදුලිය බෙදා හැරීමට නියමිත ආකාරය සම්බන්ධයෙන් සලකා බලා, යම් යම් කොන්දේසිවලට යටත් ව විදුලිය බෙදා හැරීමේ බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් අදාල පුද්ගලයා හෝ පුද්ගල කාණ්ඩය නිදහස් කිරීමක් ලබා දීමට කොමිෂන් සභාවට බලතල ඇත. එබැවින්, ඉහත කී නිදහස් කිරීම් කොන්දේසිවලට අනුකූල ද යන්න පරීක්ෂා කිරීම සඳහා එවැනි නිදහස් කරන ලද පාර්ශ්වයන්ගේ බෙදා හැරීමේ ජාල නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ. 2021 වර්ෂයේ දී, PUCSL විසින් නිදහස් කරන ලද පාර්ශ්වයන් සපයා ඇති නිදහස් කිරීමේ කොන්දේසි වලට අනුකූල ද යන්න සහතික කිරීම සඳහා පරීක්ෂණ 09 ක් පවත්වන ලදී.

භෞතික ප්‍රගතිය	
මූල්‍ය ප්‍රගතිය	

සාමාන්‍ය ජනතාව සඳහා සම්ප්‍රේෂණ මාර්ග පිවිසුම් පිළිබඳ තොරතුරු වෙත ප්‍රවේශ වීමේ හැකියාව ලබා දීම

සම්ප්‍රේෂණ මාර්ග පිවිසුම්වල නියමිත අවම ආරක්ෂිත නිෂ්කාශන සහතික කිරීම යන්න සාමාන්‍ය ජනතාවගේ ජීවිත හා දේපළවල ආරක්ෂාව සහ බලපත්‍රලාභීන්ගේ පද්ධති විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ දී වැදගත් වේ. දැනට පවතින සහ යෝජිත (සැලසුම් කර ඇති සහ ක්‍රියාත්මක වෙමින් පවතින) සම්ප්‍රේෂණ මාර්ගවල භූගෝලීය තොරතුරු දැනට සාමාන්‍ය ජනතාවට ලබා ගත නොහැක. එබැවින්, ICTA විසින් සකස් කරන ලද ශ්‍රී ලංකාවේ දැනට පවතින භූගෝලීය තොරතුරු සිතියමට (Geoportal) සම්ප්‍රේෂණ මාර්ග පිවිසුමේ භූගෝලීය තොරතුරු ඇතුළත් නව ස්ථරයක් ඇතුළත් කිරීමේ ව්‍යාපෘතිය PUCSL විසින් මෙහෙයවන ලදී. ව්‍යාපෘතිය සාර්ථකව නිම කර ඇති අතර ලංකා විදුලි බල මණ්ඩලය වෙතින් ලබා ගන්නා දැනට පවතින සම්ප්‍රේෂණ මාර්ගවල භූගෝලීය තොරතුරු සමඟ භූ ද්වාර සිතියම යාවත් කාලීන කෙරේ. දැනට පවතින සහ යෝජිත සම්ප්‍රේෂණ මාර්ග පිවිසුම් අසල නව ඉදිකිරීම් සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී රේඛීය නිෂ්කාශන පවත්වා ගැනීම සඳහා පූර්වාරක්ෂාකාරී ක්‍රියාමාර්ග ගැනීමට සාමාන්‍ය ජනතාවට හැකි වනු ඇතැයි PUCSL බලාපොරොත්තු වේ. සම්ප්‍රේෂණ මාර්ග පිවිසුමේ තොරතුරු සම්බන්ධයෙන් වැඩි දියුණු කළ ප්‍රවේශ්‍යතාව හරහා සාමාන්‍ය ජනතාවගේ ජීවිත සහ දේපළවල ආරක්ෂාව සහ බලපත්‍රලාභීන්ගේ පද්ධති විශ්වසනීයත්වය අවසානයේ සහතික කරන්නා වූ දැනට පවතින සහ යෝජිත සම්ප්‍රේෂණ මාර්ග පිවිසුම් අසල නව ඉදිකිරීම් සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී රේඛීය නිෂ්කාශන පවත්වා ගැනීම සඳහා පූර්වාරක්ෂාකාරී ක්‍රියාමාර්ග ගැනීමට සාමාන්‍ය ජනතාවට හැකි වනු ඇතැයි PUCSL බලාපොරොත්තු වේ

භෞතික ප්‍රගතිය	
මූල්‍ය ප්‍රගතිය	

පරීක්ෂණ හරහා ආරක්ෂිත නියාමනය සමඟ අනුකූල වීම

පාරිභෝගිකයා වෙත අඛණ්ඩ හා ආරක්ෂිත විදුලි සැපයීම තහවුරු කිරීම සඳහා 2016 වර්ෂයේ දී ආරක්ෂාව, තත්ත්වය හා අඛණ්ඩතාවය පිළිබඳ නියෝග ප්‍රකාශයට පත් කරන ලදී. බලපත්‍රලාභියාගේ අනුකූලතාවය සහතික කිරීම සඳහා පරීක්ෂා කිරීම්, සිද්ධීන් පටිගත කිරීම් ආදිය අත්‍යවශ්‍ය වේ. සංඥා සඳහා ආරක්ෂිත සැලසුම්, වර්ණ සහ සමානුපාතිකයන් දැනටමත් රෙගුලාසියේ සඳහන් කර ඇති අතර, එම නිසා ප්‍රමිතිය අනුගමනය කිරීමට පරීක්ෂණ අවශ්‍ය වේ. එබැවින්, ආරක්ෂක අත්පොතට අනුකූලදැයි තහවුරු කර ගැනීම සඳහා PUCSL විසින් ඇඹිලිපිටිය, උඩවලව බෙදා හැරීමේ පද්ධතිවල පරීක්ෂණ පවත්වන ලදී. ඒකාකාර මිනුම් සහ අනුකූලතාවය මඟින් ව්‍යාකූලත්වය, පෙනීමේ අපැහැදිලි බව සමනය කරන අතර ම ආරක්ෂාව වැඩි කරනු ලබයි.

භෞතික ප්‍රගතිය	
මූල්‍ය ප්‍රගතිය	

ගොඩනැගිලිවල ගිනි උවදුරුවලට හේතුව විශ්ලේෂණය කිරීම සහ ජාතික වැදගත් ස්ථානවලට තෝරාගත් සැනෙලි චාප ආරක්ෂණය (arc flash protection) හඳුන්වා දීම.

ශ්‍රී ලංකාවේ බොහෝ වාණිජ ගොඩනැගිලි විදුලි ගිනි උවදුරුවලට ගොදුරු විය හැකි බව පසුගිය කාලයේ නිරීක්ෂණය විය. විදුලි රැහැන් , විදුලි බෙදාහැරීමේ පද්ධති සහ ආලෝක උපකරණ මෙන් ම ඉවුම් පිහුම්, උණුසුම, කාර්යාල සහ විනෝදාස්වාද උපකරණ, රෙදි සෝදන යන්ත්‍ර සහ වියළන යන්ත්‍ර, මෙන් ම විදුලි බෙදා හැරීම හෝ ආලෝකකරණ උපකරණ වැනි විදුලි බලයෙන් ක්‍රියාත්මක වන ඕනෑ ම උපකරණයක විදුලි ගිනි ඇතිවිය හැක.ගිනි දැල්වීම සඳහා දායක වන සාධකයක් වන විදුලි බිඳ වැටීම හෝ අක්‍රිය වීම සහ විදුලි බෙදාහැරීම් සහ ආලෝක උපකරණ සම්බන්ධ ගිනි වශයෙන් මෙය ප්‍රධාන වශයෙන් ආකාර දෙකකට වර්ග කළ හැක . මෙම ගිනි ගැනීම් සිදු විය හැක්කේ විදුලි බිඳවැටීමක් හෝ අක්‍රියතාවක් නිසා වන අතර එය ප්‍රධාන වශයෙන් චාප ආකාරයක් සමඟ සම්බන්ධ වන අතර එය සන්නායක අතර නොදැනුවත්ව ම විදුලි ධාරාවක් මුදා හැරීමේ ප්‍රතිඵලයකි. ප්‍රමාණවත් කාලයක් සහ ධාරාවේ මට්ටම මත, චාප දෝෂ නිසා ගින්නක් දැල්වීමට ප්‍රමාණවත් තාපයක් නිපදවිය හැකි ය. චාප කාලය වඩාත් තීරණාත්මක සාධකය වන බැවින් පද්ධති තුළ වේගවත්, දෘශ්‍ය සංවේදක පදනම් කරගත් ආරක්ෂණ ක්‍රම භාවිතා කළ යුතු ය. අනෙකුත් වැදගත් ගැටළු වන්නේ ආරක්ෂණ පද්ධතියේ තේරීම සහ ස්වයං අධීක්ෂණය යි. PUCSL විසින් නිදහස් කරන ලද පාර්ශවීය පරිශ්‍රයන්හි හේතු සහ ආරක්ෂිත ක්‍රම විමර්ශනය කිරීම සඳහා පරීක්ෂණයක් සිදු කරන ලද අතර ගොඩනැගිලි හෝ පරිශ්‍ර නිරන්තර ව පරීක්ෂා කිරීම සහ පරිශ්‍ර පරීක්ෂා කිරීමට ක්‍රම සහ විධි ආදිය සහතික කිරීම සඳහා නියාමන උපකරණ කෙටුම්පත් කරන ලදී. පරීක්ෂණ වල දී රැස් කරගත් දත්ත සමඟින්, විදුලි ආරක්ෂාව සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ උනන්දුව සුරක්ෂිත කිරීම සඳහා PUCSL විසින් නියාමන උපකරණ කෙටුම්පත් කර යාවත්කාලීන කරන ලදී. අවසාන වාර්තාව සහ රෙගුලාසි 2022 වර්ෂයේ දී දියත් කෙරෙනු ඇත.

විදුලි ආරක්ෂාවට අදාළ ක්‍රියාකාරකම් අධීක්ෂණය - විදුලි සැර විශ්ලේෂණ වාර්තාව

මෙම වාර්තාව මඟින් ස්ථානය, වයස, ස්ත්‍රී පුරුෂ භාවය සහ සෘතුමය සාධක වැනි සාධක වලට අදාල ව පසුගිය වසර පහේ (05) විදුලි සැර වැදීමේ වාර්තා විශ්ලේෂණය කරයි. එම කාල සීමාව තුළ වාර්තා වූ මාරක මරණවලට මූලික හේතු පිළිබඳව ද වාර්තාව විමර්ශනය කරනු ලබයි. පවතින දත්ත වලට අනුව, ශ්‍රී ලංකාවේ වසරකට සිදු වන විදුලි සැර වැදීමේ සංඛ්‍යාව 2015 සිට 100 සීමාව ආසන්නයේ දෝලනය වෙමින් පවතින අතර, එය ආරම්භකව පෙර වසරවල 140-180 සීමාවේ පැවත ඇත. දැනට පවතින අගය ගෝලීය වශයෙන් පිළිගත හැකි සීමාවන්ට වඩා වැඩි වුව ද, 2012 වසරේ සිට, කලින් පැවති විදුලි සැර වැදීමේ ප්‍රවණතාවය වඩා නියත අඩු වූ සංඛ්‍යාවක් දක්වා සැලකිය යුතු ලෙස අඩු වී ඇති බව තව දුරටත් සඳහන් කළ හැකි ය. 2021 වසරේ වැඩි ම විදුලි සැර වැදීම මධ්‍යම පළාතෙන් වාර්තා වන අතර නැගෙනහිර පළාතෙන් අවමය වාර්තා වේ.

2021 දත්ත වලට අනුව, විදුලි සැර වැදීමට ගොදුරු වූවන්ගෙන් සියයට 21 ක් වයස අවුරුදු 51-60 වයස් කාණ්ඩයට අයත් වන අතර සියයට 21 ක් අවුරුදු 31 - 40 වයස් කාණ්ඩයට අයත් වේ. 2021 දී ලැබුණු දත්තවලට අනුව පිරිමි පුද්ගලයන්ට විදුලි සැර වැදීමේ අවදානම වැඩි වන අතර පසුගිය වසර පහ තුළ ද එම ප්‍රවණතාව දක්නට ලැබේ.

වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා හෝ වන සතුන් ඝාතනය කිරීම සඳහා නීති විරෝධී ලෙස විදුලි රැහැන්වලට තට්ටු කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වැඩිම විදුලි කම්පන සංඛ්‍යාවක් සිදුවන බව ද වාර්තාව වාර්තා කරයි. 2021 දී සුළු අඩුවීමක් දක්නට ලැබුණ ද, එම සංඛ්‍යාව තවමත් භයානක ලෙස ඉහළ ය. මීට අමතර ව, අත් වැරදීම් සහ නොසැලකිලිමත්කම හේතුවෙන් සැලකිය යුතු විදුලි කම්පන සංඛ්‍යාවක් සිදු වී ඇත. අක්‍රිය වූ විදුලි උපකරණ සහ ප්‍රමිතියෙන් තොර රැහැන් භාවිතයන් හේතුවෙන් ද බලගතු විදුලි කම්පන සංඛ්‍යාවක් සිදුවී ඇත. විදුලි සැර වැදීම අවම කිරීම සඳහා ප්‍රායෝගික ව පවතින රෙගුලාසි සාමාන්‍ය ජනතාව අනුගමනය කිරීමට සැලැස්වීම වඩා වැදගත් බව මහජන උපයෝගිතා කොමිසම නිරීක්ෂණය කරයි.



රූපය 3: පසුගිය වසර 14 තුළ විදුලි සැර වැදීමේ ප්‍රවණතාවය




2021 දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව විදුලි සැර වැදීම
10%
90%
Male
Female


2021 දී විදුලි සැර වැදීම සඳහා හේතු අනුපාතය
33%
33%
30%
4%
Illegal Power Tapping
Working Under Unfavourable Environment
Mistakes & Carelessness
Licensee Side Faults
Other/Not Reported

මහජන දැනුවත් කිරීමේ වැඩසටහන

මහජනතාව විදුලි සැර වැදීම් සහ අනෙකුත් විදුලිය ආශ්‍රිත උවදුරුවලට නිරාවරණය වීම අවම කිරීම සඳහා දැනුවත් කිරීම වැදගත් කාර්යභාරයක් ඉටු කරන බැවින්, විදුලි ආරක්ෂණ පියවර, මාර්ගෝපදේශ, නීතිරීති පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා විවිධ වයස් කාණ්ඩ සහ ප්‍රේක්ෂකයින් ඉලක්ක කර ගනිමින් PUCSL සිය විදුලි ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් ගුවන් විදුලිය, පුවත්පත් සහ ෆේස්බුක් හරහා සිදු කරන ලදී.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	90%

බලපත්‍රලාභීන්ගේ විදුලි සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ පද්ධතිය හරහා නීතිවිරෝධී ලෙස විදුලිය ලබා ගන්නා හෝ භාවිත කරන පුද්ගලයන්ට එරෙහිව නඩු පැවරීමට අනුමැතිය නිර්දේශ කිරීම

2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ 48 (4) උප වගන්තියට අනුව (සංශෝධිත පරිදි) එම පනත යටතේ වරදක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ ලිඛිත අවසරය ඇති ව හැර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීම සිදු නො කළ යුතු ය. එබැවින්, PUCSL විසින් බලපත්‍රලාභීන් විසින් ඉදිරිපත් කරන ලද අවසර අයදුම්පත් ඇගයීමට ලක් කර නිර්දේශ සපයනු ලබයි. (බලපත්‍රලාභීන්ගේ විදුලි සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ පද්ධතිය හරහා නීතිවිරෝධී ලෙස විදුලිය ලබා ගන්නා හෝ භාවිත කරන පුද්ගලයන්ට එරෙහිව නඩු පැවරීමට). 2021 වර්ෂයේ දී, සියලු ම අවසර අයදුම්පත් ඇගයීමට ලක් කර අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා සම්පූර්ණ කරන ලදී.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	100%

පාරිභෝගිකයින්ගේ ඉල්ලීම මත හෝ කොමිෂන් සභාවේ නියෝග මත පරීක්ෂණ පැවැත්වීම, විදුලි රැහැන් හෝ බලාගාර පරීක්ෂා කිරීම හෝ විදුලිය සැපයීම

පාරිභෝගිකයින්ගේ ඉල්ලීම මත හෝ කොමිෂන් සභාවේ නියෝග මත සාමාන්‍ය ක්‍රියාකාරකමක් ලෙස PBUSL විසින් විදුලි රැහැන්, බලාගාර සහ විදුලි සැපයුම පරීක්ෂා කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව 2021 වර්ෂය තුළ පරීක්ෂණ 13 ක් සිදු කරන ලදී.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	65%

විදුලි කාර්මික බලපත්‍රය

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) විදුලි අංශයේ නියාමකය, 2021 දී විදුලි කාර්මිකයන් සඳහා නොමිලේ ජාතික වෘත්තීය සුදුසුකම් 3 (NVQ 3) වැඩසටහන ප්‍රදානය කිරීමේ දෙවන අදියර ආරම්භ කරයි.

කොමිෂන් සභාව විසින් මෙම වැඩසටහන පසුගිය වසරේ මාර්තු මස දියත් කරන ලද අතර එම වැඩසටහන යටතේ විදුලි කාර්මිකයන් 2000කට අධික පිරිසක් NVQ 3 ලබාගෙන විදුලි කාර්මික බලපත්‍රය සහ සුදුසුකම් ලබා ඇත.

මෙම වැඩසටහන දිවයින පුරා දිස්ත්‍රික්ක වශයෙන් විදුලි කාර්මිකයන් ඉලක්ක කරගනිමින් පැවැත්විණි. NVQ3 යනු විදුලි කාර්මික බලපත්‍රය ලබා ගැනීමේ අවම සුදුසුකමයි. කොමිෂන් සභාව විසින් 2021 වර්ෂයේදී විදුලි කාර්මිකයන් 2,500ක් සඳහා සුදුසුකම් පිරිනමනු ලැබීය. විදුලි කාර්මිකයන් සඳහා NVQ 3 ප්‍රදානය කිරීම සඳහා PUCSL වෘත්තීය හා තෘතීයික අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC), වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සමඟ අවබෝධතා ගිවිසුමක් ද අත්සන් කළේය. මෙම අවබෝධතා ගිවිසුම්වලට අනුව, NVQ 3 හි විභාග සහ පාඨමාලා ගාස්තු විදුලි කාර්මිකයන් වෙනුවෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් දරනු ලැබේ.

මෙම වැඩසටහනේ විශේෂත්වය වන්නේ දින හතරක් ඇතුළත විදුලි කාර්මිකයන්ට පූර්ව ඉගෙනුම් (RPL පදනම් වූ ඇගයීම්) ක්‍රමය යටතේ NVQ 3 සඳහා සුදුසුකම් ලබා විදුලි කාර්මික බලපත්‍රය සඳහා සුදුසුකම් ලැබීමයි.

04 වන ප්‍රතිඵලය - මිනිසුන්, සතුන් සහ ශාක සඳහා පාරිසරික තත්ත්වයන් වැඩිදියුණු කිරීම

සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා ස්ථාපනයන් (Solar PV Installations) පිළිබඳ විදුලි කාර්මිකයන් පුහුණු කිරීම

පුනර්ජනනීය බලශක්තිය වෙත ගමන් කිරීමේ රජයේ ඉලක්කයට සහාය වීම සඳහා, PUCSL විසින් සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා ස්ථාපනය කිරීම පිළිබඳ ශ්‍රී ලංකාවේ සූර්ය තාක්ෂණ ශිල්පීන්ගේ දැනුම වැඩිදියුණු කිරීමේ වැඩසටහනක් දියත් කරන ලදී. මෙම වැඩසටහන මඟින් සෑම දිස්ත්‍රික්කයකට ම පහසුකම් සපයන අතර 2021 වසර අවසන් වන විට සූර්ය බලශක්ති තාක්ෂණ ශිල්පීන් 1500 කට වැඩි පිරිසක් මෙම වැඩසටහන හරහා සුදුසුකම් ලබා ගෙන තිබුණි.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	90%

ඛනිජ තෙල් කර්මාන්තය සහ ලිහිසි තෙල් වෙළෙඳපොළ

ඉන්ධන පිරවුම්හල් සඳහා ප්‍රමිති සකස් කිරීම

කලාපීය පාර්ශ්වකරුවන්ගේ උපදේශන අතරතුර ඉන්ධන පිරවුම්හල් (FFS) සම්බන්ධ පහත සඳහන් ගැටළු මතු කරන ලදී.

• සාධාරණ දුර පරාසයක් තුළ ඉන්ධන පිරවුම්හල් නොමැති වීම;
• ඉන්ධන පිරවුම්හල්වල ඛනිජ තෙල් ඉන්ධන නොමැතිකම; සහ
• ඉන්ධන පිරවුම්හල් අවශ්‍ය නිර්ණායක ආදිය සපුරාලන්නේ නැතිවීම.

ලේකම් කාර්යාලය විසින් නව ඉන්ධන පිරවුම්හල් පිහිටුවීම පිළිබඳ මාර්ගෝපදේශ සකස් කර 2007 දී ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත්, එවැනි මාර්ගෝපදේශවලට පූර්ණ අනුකූලතාවයක් ඇති බවක් නොපෙනේ. ඒ අනුව, PUCSL විසින් දැනට පවතින ඉන්ධන පිරවුම්හල් පිළිබඳ නියැදි අධ්‍යයනයක් සිදු කර සකස් කළ යුතු මාර්ගෝපදේශ හඳුනා ගෙන අවසන් කර ඇති අතර මෙම මාර්ගෝපදේශ 2022 වර්ෂයේ දී සකස් කෙරෙනු ඇත.

භෞතික ප්‍රගතිය	80%
මූල්‍ය ප්‍රගතිය	45%

නියාමන අත්පොත සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කළ යුතු සහ වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම

PUCSL හි නියාමන අත්පොත (RM) අවසන් වරට යාවත්කාලීන කරන ලද්දේ 2014 වර්ෂයේ දී ය.පසුව ඇතැම් නියාමන ක්‍රියාවලීන් සඳහා වෙනස්කම් සිදු කර ඇත. එබැවින්, PUCSL විසින් සාකච්ඡා පැවැත් වූ අතර වත්මන් අත්පොත පිළිබඳ ගැඹුරු අධ්‍යයනයකින් පසුව නියාමන අත්පොත යාවත්කාලීන කරන ලදී.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	අදාල නොවේ

ලිහිසි තෙල් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සමාලෝචනය කර යාවත්කාලීන කිරීම

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) විසින් වාහන ලිහිසි තෙල් සහ ග්‍රීස් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති 2007 වර්ෂයේ සිට ප්‍රකාශයට පත් කරන ලදී. 2018 වර්ෂයේදී පැවති ලිහිසි තෙල්වල ගුණාත්මකභාවය සහ මිල පිළිබඳ මහජන උපදේශනයේ දී ශ්‍රී ලංකා ප්‍රමිතීන්ගෙන් සමහරක් යාවත්කාලීන කිරීමට අවශ්‍ය බව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රකාශ කරන ලද අතර ස්කූටරය සඳහා හෝ ස්ට්‍රෝක් එන්ජින් ඔයිල් සඳහා අවම ප්‍රමිතියක් හඳුන්වා දීමට ක්ෂේත්‍ර විශේෂඥයින් නිර්දේශ කරන ලදී. ඒ අනුව 2021 වර්ෂයේ දී PUCSL විසින් ලිහිසි තෙල් සහ ග්‍රීස් සඳහා පවතින ශ්‍රී ලංකා ප්‍රමිති සමාලෝචනය කර යාවත්කාලීන කිරීම මෙන් ම නව වාහන කාණ්ඩ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සකස් කරන ලද අතර පාරිභෝගික කටයුතු අධිකාරිය හෝ වෙනත් අදාළ සංවිධාන හරහා ලිහිසි තෙල් සහ ග්‍රීස් සඳහා යාවත්කාලීන සහ නව ශ්‍රී ලංකා ප්‍රමිතීන් බලාත්මක කිරීම සම්බන්ධීකරණය කරන ලදී. පහත අයිතමයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති (SLS) යාවත්කාලීන/ සකස් කරන ලදී.

1. පෙට්‍රල් එන්ජින් ඔයිල්
2. ඩීසල් එන්ජින් ඔයිල්
3. 2 ස්ට්‍රෝක් එන්ජින් ඔයිල්
4. මෝටර් සයිකල් එන්ජින් ඔයිල්
5. ගියර් ඔයිල්
6. බේස් ඔයිල්
7. ග්‍රීස්

භෞතික ප්‍රගතිය	80%
මූල්‍ය ප්‍රගතිය	45%

ඛනිජ තෙල් ඉන්ධන සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතීන් සමාලෝචනය කර යාවත් කාලීන කිරීම

ලිහිසි තෙල් වෙළඳපොළ සම්බන්ධයෙන් පැවති මහජන අදහස් විමසීමේ දී ඛනිජ තෙල් සඳහා ප්‍රමිතීන් තිබීමේ වැදගත්කම පිළිබඳ ව කරුණු ඉදිරිපත් කරන ලදී. තව ද, පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, උදුන් තෙල් සහ ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් වලින් ආරම්භ වන පෙට්‍රෝලියම් ඉන්ධන සඳහා නව ශ්‍රී ලංකා ප්‍රමිතීන් යාවත්කාලීන කිරීමට හෝ සකස් කරන ලෙස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වෙතින් ද එය සම්බන්ධීකරණය කිරීමට PUCSL වෙතින් ද විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඉල්ලා සිටින

ලදී. ඒ අනුව, PUCSL විසින් 2021 වර්ෂයේදී පහතින් දැක්වෙන ශ්‍රී ලංකා ප්‍රමිතීන් සමාලෝචනය කර යාවත්කාලීන කරන ලදී.

1. පෙට්‍රල්
2. ඩීසල්

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	අදාල නොවේ

පෙට්‍රෝලියම් ඉන්ධන බෙදා හැරීමේ පොම්ප සඳහා ප්‍රමිතීන් සහ අධීක්ෂණය සඳහා යාන්ත්‍රණය සකස් කිරීම

ඛනිජ තෙල් ඉන්ධන බෙදා හැරීමේ පොම්ප සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතීන් සකස් කිරීම සහ අධීක්ෂණය සඳහා යාන්ත්‍රණය සම්බන්ධයෙන් තොරතුරු ආවරණය වන පරිදි වාර්තාවක් සකස් කරන ලදී.

භෞතික ප්‍රගතිය	70%
මූල්‍ය ප්‍රගතිය	60%

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ශ්‍රී ලංකා රේගුව විසින් ලිහිසි තෙල් අනිවාර්ය ආනයන පරීක්ෂාව සඳහා ක්‍රියා පටිපාටිය සකස් කිරීම

නුදුරු අනාගතයේ දී ඛනිජ තෙල් සහ ලිහිසි තෙල් අංශය සම්බන්ධයෙන් නියාමන බලතල PUCSL වෙත ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. තව ද, 2018 වර්ෂයේදී PUCSL විසින් පවත්වන ලද මහජන උපදේශනවලදී, මහජනතාව විසින් ලිහිසි තෙල්වල ප්‍රමිතිය සම්බන්ධ ගැටළු පෙන්වා දෙන ලදී.විශේෂයෙන්ම ප්‍රමිතියෙන් තොර ලිහිසි තෙල්, භාවිත කළ ලිහිසි තෙල් සමඟ මිශ්‍ර කළ ලිහිසි තෙල් අලෙවි කිරීම ගැටලු ලෙස හඳුනා ගන්නා ලදී. ආනයනික ලිහිසි තෙල්වල ගුණාත්මකභාවය පාලනය කිරීම සඳහා ලිහිසි තෙල් අනිවාර්ය ආනයන පරීක්ෂාව සඳහා යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම ඉහත කී ගැටලුවට පිළියමක් ලෙස හඳුනා ගැනේ.ඒ අනුව, ලිහිසි තෙල් සඳහා විශේෂිත ආනයන පරීක්ෂණ ක්‍රමවේදයක් PUCSL විසින් මෙම වසරේ සකස් කරන ලදී.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	අදාල නොවේ

ජල සේවා කර්මාන්තය

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා ආපදා කළමනාකරණ සැලැස්ම සකස් කිරීම

තෝරා ගත් ජල යෝජනා ක්‍රමයක් සඳහා ආපදා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම. 2021 ජූනි මාසයේ දී, උපදේශකයෙකු බඳවාගෙන ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට කොමිසම තීරණය කරන ලදී. ආපදා කළමනාකරණ සැලැස්ම. අභිලාශ ප්‍රකාශ කිරීම් සඳහා ආරාධනා කරමින් පත් කරන ලද DPC පත්‍රිකා නිවේදන ප්‍රකාශයට පත් කරන ලදී. 2020 ගෝලීය දේශගුණික අවදානම් දර්ශකයට අනුව, ශ්‍රී ලංකාව ආන්තික කාලගුණික සිදුවීම් වලින් වැඩිම බලපෑමක් ඇති රටවල් දහය අතරට ශ්‍රේණිගත කර ඇත.

භෞතික ප්‍රගතිය	20%
මූල්‍ය ප්‍රගතිය	වෙනත් ක්‍රියාකාරකමක් සඳහා භාවිතා කරන ලදී.

මහජන උපදේශනය සහ ජල සේවා නියාමනය පිළිබඳ ප්‍රතිපත්තිමය උපදෙස් සකස් කිරීම

ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයින්ට ජල සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපත්තිමය උපදෙස් සකස් කිරීම සඳහා PUCSL විසින් දිවයින පුරා මහජන උපදේශනයක් පවත්වන ලදී. දීප ව්‍යාප්ත මහජන උපදේශන ක්‍රියාවලියට සහභාගී වූ පාරිභෝගිකයින්ගෙන් සහ නිලධාරීන්ගෙන් සවිස්තරාත්මක ලිඛිත අදහස් 595 ක් ලැබිණි. පුද්ගලයන් 261 දෙනෙකු උපදේශන 10කට වැඩි ගණනකදී පුද්ගලිකව ද තවත් කුඩා කණ්ඩායම් සාකච්ඡා 15ක් පමණ ද අදහස් ඉදිරිපත් කර ඇත. උපදේශන ක්‍රියාවලිය හරහා පහත සඳහන් ගැටළු හඳුනා ගන්නා ලදී.

1.බොහෝ පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට වසර පුරා ප්‍රමාණවත් පානීය ජලය නො ලැබේ.
2.ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ ව සැලකිලිමත් වීම.
3. කාර්යක්ෂමතාව සඳහා දිරිගැන්වීම් සපයන ස්ථාවර ප්‍රතිපත්තියක් සහ නියාමන රාමුවක් මඟින් සැපයුම්කරුවන් සඳහා අවශ්‍ය ස්ථාවරත්වය ඇති කරයි.

ඒ අනුව, හඳුනාගත් ගැටළු සඳහා විසඳුම් නිර්දේශ කරන ප්‍රතිපත්තිමය උපදෙස් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය වෙත ඉදිරිපත් කරන ලදී.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	100%

වෙනත් ක්‍රියාකාරකම්

තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය

විදුලිය, ජලය සහ ඛනිජ තෙල් කර්මාන්ත සම්බන්ධයෙන් නියාමන මෙවලම් වඩා හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනය ඒකාබද්ධ කිරීමට සහය වීමට සහ ක්‍රියාකාරකම්වලට සහාය වීම සඳහා විවිධ තොරතුරු වේදිකා සංවර්ධනය කිරීමට සහ වැඩිදියුණු කිරීමට PUCSL සමත් විය.

කාර්මික තොරතුරු පද්ධතිය

PUCSL විසින් තාක්ෂණවේදීන්ට අන්තර්ජාල වේදිකාවක ලියාපදිංචි විය හැකි වෙබ් පාදක පද්ධතියක් ගොඩ නඟන අතර එමඟින් පාරිභෝගිකයින්ට තමන් ජීවත් වන ප්‍රදේශයේ රැකියාව සඳහා අවශ්‍ය වන්නා වූ NVQ 3 සුදුසුකම් ලත් කාර්මිකයන් සෙවීමට සහ ඔවුන් කරා ප්‍රවේශ වීමට පහසු වනු ඇත. අන්තර්ජාල වේදිකාවේ සංවර්ධන කටයුතු 2021 වර්ෂයේ දී අවසන් කරන ලද අතර එය ලබන වසරේ දියත් කෙරෙනු ඇත. අන්තර්ජාල වේදිකාවට ජංගම යෙදුමක් ද සහාය දක්වයි. සුදුසුකම් රහිත කාර්මික ශිල්පීන්ගේ වෘත්තීය නොවන කටයුතු නිසා සිදුවන අනතුරු අවම වන බැවින් රටේ විදුලි ආරක්ෂාව නඟා සිටුවීමට මෙම පද්ධතිය උපකාරී වනු ඇත.

සිදුවීම් වාර්තා කිරීමේ පද්ධතිය

මෙය වෙබ් පාදක පද්ධතියක් වන අතර විදුලි සැර වැදීම සහ අනෙකුත් විදුලිය ආශ්‍රිත අනතුරු PUCSL වෙත වාර්තා කිරීමට මෙය යොදා ගත හැකි අතර, එසේ රැස්කරගත් තොරතුරු විදුලි සැර වැදීම අවම කිරීමට සහ ආරක්ෂාව වැඩි දියුණු කිරීමට භාවිතා කිරීමට PUCSL හට හැකි ය. මෙම පද්ධතිය මඟින් මහජනතාවට සහ ලංකා විදුලි බල මණ්ඩලය, ලංකා විදුලි (පුද්ගලික) සමාගම, සෞඛ්‍ය අමාත්‍යාංශය, පොලිස් දෙපාර්තමේන්තුව වැනි නම් කරන ලද ආයතනවල කාර්ය මණ්ඩලයට විදුලි සැර වැදීම් සහ විදුලිය ආශ්‍රිත අනෙකුත් අනතුරු වාර්තා කිරීමට ඉඩ ලබා දී ඇත. අවධානය යොමු කළ යුතු හේතු, ගැටළු සහ ක්ෂේත්‍ර ආදිය මෙම පද්ධතිය හරහා හඳුනා ගැනීමට PUCSL සැලසුම් කර ඇත. මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ව්‍යාපෘතිය සම්පූර්ණ කරන ලද නමුත් අවශ්‍ය විටදී සහ අවශ්‍ය අවස්ථාවලදී වෙනස් කිරීම් සිදු කරනු ලැබේ.

භෞතික ප්‍රගතිය	50%
මූල්‍ය ප්‍රගතිය	50%

භෞතික ප්‍රගතිය	80%
මූල්‍ය ප්‍රගතිය	80%

බලපත්‍ර කළමනාකරණ පද්ධතිය

මෙම ක්‍රමය මඟින් බලපත්‍රලාභීන්ට PUCSL කාර්යාලයට නොපැමිණ අන්තර්ජාලය හරහා බලපත්‍ර සඳහා අයදුම් කිරීමට ඉඩ සලසන අතර ම PUCSL කාර්ය මණ්ඩලයට ලැබෙන අයදුම්පත් පරිගණකගත පද්ධතියක් භාවිතයෙන් සැකසීම සිදු වේ.පද්ධතියේ සංවර්ධනය 2021 වර්ෂයේ දී ආරම්භ වූ අතර ලබන වසරේ ආරම්භයේ දී දියත් කිරීමට නියමිත ය. වෙබ් පාදක පද්ධතිය මඟින් බලපත්‍රලාභීන්ගේ අයදුම් කිරීම සහ අයදුම්පත් සැකසීම ස්වයංක්‍රීය කරන අතර ප්‍රමාදයන් අඩු කරනු ලබයි. මෙම පද්ධතිය මඟින් බලපත්‍ර ඩිජිටල් යෙදුම් සඳහා සහය වන අතර අතින් සිදු කරන කාර්යයන් පරිගණකගත කිරීම හරහා යෙදුම් සැකසීම කඩිනම් කරන අතර ආයෝජකයින්ට ඔවුන්ගේ ව්‍යාපෘති වේගයෙන් ක්‍රියාත්මක කළ හැකි බව සහතික කරනු ලබයි. එසේ ම, පාර්ශවකරුවන්ට තමන් කරන ලද ආයෝජනවල ප්‍රතිලාභ ඉක්මනින් ලබා ගත හැකි බව සහතික කරමින් රටේ විදුලි කර්මාන්තයේ වර්ධනයට ව්‍යාපෘතිය දායක වේ.

භෞතික ප්‍රගතිය	90%
මූල්‍ය ප්‍රගතිය	90%

පවතින ව්‍යාපාරික යෙදුම් වැඩිදියුණු කිරීම

පුනර්ජනනීය බලශක්තිය රටේ බලශක්ති මිශ්‍රණයේ වැදගත් අංගයක් බවට පත්ව ඇති නමුත් මේ වන විට PUCSL වෙත ලැබෙන්නේ සම්ප්‍රදායික බලශක්ති උත්පාදනයට අදාළ දත්ත පමණි. එබැවින්, පුනර්ජනනීය බලශක්තියට අදාළ දත්ත PUCSL වෙත ඉදිරිපත් කිරීමට අවසර දීම සඳහා බලපත්‍රලාභී තොරතුරු ඉදිරිපත් කිරීම වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. මීට අමතර ව, වට්ස් ඇප් (WhatsApp), කෙටි පණිවිඩ (SMS), වැනි නව සන්නිවේදන මාධ්‍යයන්ට අනුගත වීම සඳහා ආරවුල් විසඳීමේ පද්ධතිය ද

වෙනස් වෙමින් පවතී.පුනර්ජනනීය බලශක්ති උත්පාදනයට අදාළ දත්ත ලබා ගැනීම සඳහා බලපත්‍රලාභී තොරතුරු ඉදිරිපත් කිරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම සහ වට්ස් ඇප් (WhatsApp) හරහා පැමිණිලි ඉදිරිපත් කිරීමට සහ වට්ස් ඇප් (WhatsApp), කෙටි පණිවිඩ (SMS) යනාදිය හරහා පැමිණිලිවල තත්ත්වය පරීක්ෂා කිරීමට හැකි වන පරිදි ආරවුල් විසඳීමේ ක්‍රමය වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතිය හරහා සිදු කෙරේ. මෙම අන්තර්ජාල වේදිකාවේ තාක්ෂණික ගොඩනැගීම අවසන් කර ඇති අතර එය ලබන වසරේ දියත් කිරීම සිදු වනු ඇත. සූර්ය බලශක්තිය, සුළං බලය වැනි පුනර්ජනනීය බලශක්ති වර්ග වඩාත් පරිසර හිතකාමී ලෙස පිළිගෙන ඇති අතර එබැවින් පාරිසරික අවශ්‍යතා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් බලශක්ති මිශ්‍රණයේ හරිත බල අනුපාතය සොයා ගැනීම වැදගත් වේ.

භෞතික ප්‍රගතිය	90%
මූල්‍ය ප්‍රගතිය	90%

දත්ත විශ්ලේෂණය

වඩාත් ඵලදායී නියාමන කාර්යභාරයක් ඉටු කිරීම සඳහා රටේ උපයෝගිතා කර්මාන්තවල යටිපෙළ අවබෝධ කර ගැනීමට PUCSL හට දත්ත විශ්ලේෂණය හරහා දැනුවත් තීරණ සහ තීක්ෂ්ණ බුද්ධිය, සහ දූරදර්ශී බව ලබා ගැනීමට මෙම ව්‍යාපෘතිය සහාය දක්වනු ලබයි. පාර්ශවකරුවන්ට උපරිම ප්‍රතිලාභ ලැබෙන බව සහතික කිරීම සඳහා කර්මාන්තවල අභ්‍යන්තර ගතිකතාවයන් හඳුනා ගැනීම වැදගත් වන අතර ම වත්මන් දත්ත විශ්ලේෂණ හැකියාවන් භාවිතා කිරීම එය කිරීමට සුදුසුම මාර්ගය වේ. අනෙකුත් රටවල බොහෝ

ඩිජිටල් මාධ්‍ය වේදිකාව

ආයතනික සන්නිවේදනය සඳහා ඩිජිටල් මෙවලම් භාවිතා කිරීමට හැකියාව සැපයීම.ශ්‍රී ලංකාවෙන් මිල දී ගැනීමට අවශ්‍ය සියලු ම මෙවලම් ලබාගෙන ඇත. හැකි හොඳම ඩිජිටල් මෙවලම් මගින් ආයතනික සන්නිවේදනයට සහාය දක්වන බව ක්‍රියාකාරකම්වල ප්‍රතිදානය විසින් සහතික කරනු ලබයි. ඵලදායී සන්නිවේදනය සඳහා ඩිජිටල් මෙවලම් භාවිතය. PUCSL එහි පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම සඳහා අති නවීන තාක්ෂණයන් යෙදවීම තහවුරු කිරීම.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	50%

නියාමන ආයතන, තමන් විසින් නියාමනය කරනු ලබන උපයෝගිතා කර්මාන්ත අනාගත අභියෝගවලට මුහුණ දීම සඳහා සකස් කර ඇති බව සහතික කිරීම සඳහා ඔවුන්ගේ යෙදුම් ගොඩ නැගීම සඳහා දත්ත-අභිමුඛ වේදිකා සංවර්ධනය කරනු ලබන අතර මෙම ව්‍යාපෘතිය මගින් ද ශ්‍රී ලංකාවේ උපයෝගිතා කර්මාන්ත ඔවුන්ගේ විදේශීය සගයන් හා සම මට්ටමක පවතින බව සහතික කිරීමට අදහස් කරනු ලබයි.

භෞතික ප්‍රගතිය	25%
මූල්‍ය ප්‍රගතිය	25%

බලපත්‍රලාභී තොරතුරු ඉදිරිපත් කිරීමේ පද්ධතිය (LISS) ප්‍රතිසංස්කරණය කිරීම

බලපත්‍රලාභී දත්ත සමුදායන් තත්‍ය කාලීන ව ප්‍රවේශ වීමට බලපත්‍රලාභී තොරතුරු ඉදිරිපත් කිරීමේ පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම. බලපත්‍රලාභී දත්ත සමුදායන් වෙත තත්‍ය කාලීන ව ප්‍රවේශ වීමට PUCSL හට අවසර දීම සඳහා බලපත්‍රලාභීන්ගේ කැමැත්ත ලබා ගැනීමට උත්සාහ කරන ලදී. ක්‍රියාකාරකම්වල ප්‍රතිදානය යනු දත්ත මත පදනම් වූ සහ විශ්ලේෂණ සඳහා සහාය දක්වන පද්ධතියකි. කර්මාන්තයේ වත්මන් තත්ත්වය සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන්ට අවබෝධයක් ලබා ගත හැකි වන පරිදි තත්‍ය කාලීන දත්ත සඳහා නියාමකයාට ප්‍රවේශ වීමේ වැදගත්කම සම්බන්ධයෙන් බලපත්‍රලාභීන් දැනුවත් කර ඇත. වත්මන් තාක්ෂණික ප්‍රවණතා අනුව බලපත්‍රලාභී තොරතුරු ඉදිරිපත් කිරීමේ පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීම.

භෞතික ප්‍රගතිය	10%
මූල්‍ය ප්‍රගතිය	

අන්තර් ජාලයක් (Intranet) සහ බාහිර ජාලයක් (Extranet) ක්‍රියාත්මක කිරීම

මෙය අභ්‍යන්තර සන්නිවේදනය සඳහා පහසුකම් සැලසීම සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා අන්තර් ජාලයක් ගොඩනැගීමට ය. මෙම ව්‍යාපෘතිය පසුගිය වසරේ අග භාගයේ දී දියත් කරන ලද අතර එය මෙම වසර තුළ අවසන් කිරීමට නියමිත ය. මෙහි ප්‍රතිඵලය යනු PUCSL හි ආයතනික සංස්කෘතිය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළ හැකි පද්ධතියකි. කාර්ය මණ්ඩල කටයුතු වැඩි දියුණු කිරීම සඳහා ආකෘති සංවර්ධනය කිරීම. ඩිජිටල් අත්දැකීම් වේදිකාවක් ක්‍රියාත්මක කිරීම.

භෞතික ප්‍රගතිය	25%
මූල්‍ය ප්‍රගතිය	25%

මානව සම්පත් සහ මූල්‍ය පද්ධති වැඩිදියුණු කිරීම

පවතින පද්ධති සහ වෙනස්වන අවශ්‍යතා අතර ඇති පරතරය පියවීම සඳහා මානව සම්පත් සහ මූල්‍ය පද්ධති වැඩිදියුණු කිරීම.පුහුණු මොඩියුලය ක්‍රියාත්මක කරන ලද අතර වාර්ෂික ක්‍රියාකාරකම් සැලසුම් අයවැය ආදිය සහ වාර්තාකරණය සඳහා පහසුකම් සැලසීම සඳහා මූල්‍ය පද්ධතියේ වෙනස් කිරීම් ක්‍රියාත්මක කෙරේ. ප්‍රතිඵලය යනු අදාළ ව්‍යාපාර ක්‍රියාවලීන් ස්වයංක්‍රීය කිරීම හරහා කාර්ය මණ්ඩල ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා පවතින පද්ධති වැඩිදියුණු කිරීමකි. මානව සම්පත් හා මූල්‍ය අංශවල ඵලදායිතාව වැඩිදියුණු කිරීම. වාර්තාකරණයේ වැඩිදියුණු කිරීම් මඟින් මානව ප්‍රාග්ධන සංවර්ධනය සහ සංවිධානයේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ අවබෝධයක් ලබා ගනී.

යටිතල පහසුකම් සංවර්ධනය

ව්‍යාපාරික යෙදුම් සත්කාරකත්වය සඳහා අවශ්‍ය තාක්ෂණික වේදිකාව සංවර්ධනය කිරීමට මෙම ව්‍යාපෘතියෙන් අදහස් කෙරේ. PUCSL සතු ව එහි ව්‍යාපාරික යෙදුම් සඳහා ප්‍රමාණවත් සහ විශ්වාසනීය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ඇති බව සහතික කිරීම සඳහා තාක්ෂණ වේදිකාවේ සියලු ම තීරණාත්මක අංගයන් අලුත් / උත්ශ්‍රේණි කර ඇත. ක්‍රියාකාරකම්වල ප්‍රතිදානය වන්නේ PUCSL සතු ව එහි අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් පරිගණක බලයක් සහිත බව සහතික කිරීම සඳහා පවතින දෘඪාංග වේදිකාව සංවර්ධනය කිරීමයි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සිදු කරනු ලබන්නේ ව්‍යාපාරික යෙදුම් විශ්වාසදායක වේදිකාවක් මත ක්‍රියාත්මක වන බව සහ අක්‍රිය කාලය අවම බව සහතික කිරීම සඳහා ය. පරිගණක සම්පත්වල ධාරිතාව නොමැතිකම හේතුවෙන් PUCSL හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මූලෝපායට ඍණාත්මක බලපෑමක් ඇති නොවන බව සහතික කිරීම.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	75%

භෞතික ප්‍රගතිය	75%
මූල්‍ය ප්‍රගතිය	75%

ප්‍රසම්පාදන කාර්ය ප්‍රවාහය ස්වයංක්‍රීය කිරීම

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ප්‍රසම්පාදන කටයුතුවලට අදාළ ව්‍යාපාරික ක්‍රියාවලීන් ස්වයංක්‍රීය කිරීමයි. මෙම ව්‍යාපෘතිය පසුගිය වසරේ අග භාගයේ දී දියත් කරන ලද අතර එය මෙම වසර තුළ අවසන් කිරීමට නියමිත ය. ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය වන්නේ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් විධිමත් කිරීමට සහ ප්‍රමාදයන් අඩු කිරීමට හැකි පද්ධතියක් නිර්මාණය වීමයි. අදාළ ව්‍යාපාර ක්‍රියාවලීන් කඩිනම් කිරීම සහතික කිරීම පිණිස දැනුම් දීමේ පද්ධතියක් සමඟ ප්‍රසම්පාදන කාර්ය ප්‍රවාහය සැලසුම් කිරීම. ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සඳහා හැකි හොඳම තාක්ෂණයෙන් සහය ලැබෙන බව සහතික කිරීම.

භෞතික ප්‍රගතිය	25%
මූල්‍ය ප්‍රගතිය	25%

කාර්යාල ස්වයංක්‍රීයකරණය

සාමාන්‍ය කාර්යාල කාර්යයන් ස්වයංක්‍රීය කිරීම. අවශ්‍ය සියලු ම කාර්යාල ස්වයංක්‍රීයකරණ කාර්යයන් සම්පූර්ණ කර ඇත.ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය වන්නේ කාර්ය මණ්ඩලය ඵලදායී සහ ස්වයංක්‍රීය පරිසරයක වැඩ කරන බව සහතික කිරීමයි.කාර්ය මණ්ඩලයට තම රාජකාරි බාධාවකින් තොර ව කරගෙන යාමට හැකි බව සහ අවශ්‍ය සම්පත් නොමැතිකම හේතුවෙන් ඔවුන්ගේ වැඩ ප්‍රමාද කිරීමට සිදු නොවන බව සහතික කිරීම. PUCSL හි කාර්යාල ස්වයංක්‍රීයකරණයේ මට්ටම ඊට සමාන ජාතික හා ජාත්‍යන්තර සංවිධාන හා සම මට්ටමක පවතින බව සහතික කිරීම.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	75%

ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණ සහ ආපදා ප්‍රතිකර්මය (BCP/DR) + ආරක්ෂාව

මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ සයිබර් තර්ජන සහ යටිතල පහසුකම් අසාර්ථකවීම්වලට එරෙහි ව ආරක්ෂාව වැඩි දියුණු කිරීම මගින් ව්‍යාපාරික ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමයි. ව්‍යාපාරික වශයෙන් ඔරොත්තු දීමේ උපාය මාර්ගයට

අවශ්‍ය සියලු ම ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ඇත. බාහිර තර්ජන සහ අභ්‍යන්තර අසාර්ථකත්වයන්ගෙන් PUCSL ප්‍රමාණවත් ලෙස ආරක්ෂා වී ඇති බව සහතික කිරීම ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයයි. PUCSL හි ඩිජිටල් වත්කම් ආරක්ෂා කර ඇති බව සහ කාර්ය මණ්ඩලයට ආරක්ෂිත සහ හොඳ පරිසරයක වැඩ කළ හැකි බව සහතික කිරීම. PUCSL හි ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණ සහ ආපදා ප්‍රතිකර්මය (BCP/DR) + ආරක්ෂක අංශය සමාන ආකාරයේ ජාතික සහ ජාත්‍යන්තර සංවිධාන සමග සම මට්ටමක පවතින බව සහතික කිරීම.

භෞතික ප්‍රගතිය	100%
මූල්‍ය ප්‍රගතිය	75%

මානව සම්පත් සහ පරිපාලනය

කොමිෂන් සභාවේ දැක්ම සාක්ෂාත් කර ගනිමින් ජාතියට ආදර්ශමත් සේවාවක් සපයන කැපවූ ශ්‍රම බලකායක් ගොඩ නැගීම සඳහා කොමිෂන් සභාවට සහාය වීම සඳහා කාර්ය මණ්ඩලය සහ සම්පත් පෙළ ගැස්වීමට මානව සම්පත් සහ පරිපාලන අංශය උපාය මාර්ගික මඟ පෙන්වීමක් සපයනු ලබයි. එබැවින්, Covid 19 වසංගතය සමඟ මුළු රට ම අනපේක්ෂිත පසුබෑමකට ලක් වුව ද ඉහළ කාර්ය සාධනයක් ලබා දීම සඳහා විවිධාකාර ශ්‍රම බලකායක් කාලෝචිත ලෙස බඳවා ගැනීම් හා රඳවා තබා ගැනීම සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීම, සංරක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීම යනාදිය මානව සම්පත් අංශය විසින් අඛණ්ඩ ව අරමුණු කරනු ලබයි.

තව ද, නව්‍ය මානව සම්පත් ප්‍රතිපත්ති සහ භාවිතයන් සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සඳහා රැකියා සම්බන්ධ පැහැදිලි අපේක්ෂාවන්, ක්‍රියා පටිපාටි සහ රීති සහතික කිරීම සහ අපේක්ෂිත නිපුණතාවයන්ට ගැලපෙන කාර්ය මණ්ඩල අවශ්‍යතා කාලානුරූපව තෘප්තිමත් කිරීම, වන්දි සහ ප්‍රතිලාභ කළමනාකරණය කිරීම, සේවක පුහුණු සහ සංවර්ධන අවශ්‍යතා සහ නිවසේ සිට වැඩ කරන කාලය තුළ පවා පරිපාලන හා සම්බන්ධ දෛනික කාර්යයන් හා වෙනත් දෑ සමඟ කටයුතු කිරීම වැනි සේවා මානව සම්පත් අංශය විසින් සපයනු ලබයි.



අපගේ වටිනා ශ්‍රම බලකාය විවිධ මට්ටම්වලට සහ විවිධ විෂයයන් සඳහා විවිධ වන අතර එහි දී බහුතරයක් තාක්ෂණික වෘත්තිකයන් ලෙස සලකනු ලබන අතර මෙලෙසින්, අපි සෑම විටම සමානාත්මතාවය අගය කරමු.

අපගේ වටිනා ශ්‍රම බළකාය විවිධ මට්ටම්වලට සහ විවිධ විෂයයන් සඳහා විවිධ වන අතර එහිදී බහුතරයක් තාක්ෂණික වෘත්තිකයන් ලෙස සලකනු ලබන අතර මෙලෙසින්, අපි සැමවිටම සමානාත්මතාවය අගය කරමු. ඉහළ මට්ටමේ වගකීම් පවරා දීමට හැකි වන පරිදි සේවකයින්ගේ තාක්ෂණික සහ මෘදු කුසලතා වර්ධනය කිරීම කෙරෙහි කොමිෂන් සභාව අඛණ්ඩව අවධානය යොමු කරනු ලබයි. අඩු ස්ථර සංඛ්‍යාවකින් හා සීමා සහිත සේවක මට්ටම් සංඛ්‍යාවකින් සමන්විත පැතලි ආයතනික ව්‍යුහය හරහා සේවක වගකීම් මට්ටම ඉහළ නැංවීම, පහසු තීරණ ගැනීම සහ වැඩි වගකීම් පැවරීම ඉහල නංවාලමින් අපගේ සේවකයින් සැලකිය යුතු ලෙස ප්‍රතිලාභ හිමි කර දේ.

2021 වසර අවසන් වන විට කොමිෂන් සභාව සංයුතිය තුළ කාන්තා පැවැත්ම දිරිමත් කරමින් ද සියලු ම අංශ හරහා ස්ථිර සහ කොන්ත්‍රාත් පදනම මත පුද්ගලයන් 47 ක් දක්වා සේවයේ යොදවා ඇත.

කාර්ය මණ්ඩලයේ සංයුතිය - ස්ත්‍රී පුරුෂ භාවය අනුව



කාර්ය මණ්ඩලයේ සංයුතිය - ශ්‍රේණිය අනුව

තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	
		ස්ථිර	කොන්ත්‍රාත්
අධ්‍යක්ෂ ජනරාල්	1	1	-
කොමිසමේ ලේකම්	1	1	-
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	2	2	-
අධ්‍යක්ෂ	10	9	
නියෝජ්‍ය අධ්‍යක්ෂ	14	3	
අභ්‍යන්තර විගණක	1	-	1
සහකාර අධ්‍යක්ෂ	20	16	-
කළමනාකරණ සහකාර	15	10	-
කළමනාකරණ විධායක	6	-	-
රියදුරු/කාර්යාල සහකාර	4	2	2
	74		**47**

ශක්‍යතා ගොඩනැගීම සහ පුහුණුව

මානව සම්පත් අංශය සෑම තරාතිරමක ම සේවකයින්ට ඔවුන්ගේ වෘත්තීය නිපුණතා වර්ධනය කිරීම, ඔවුන්ගේ දැනුම සහ කුසලතා ඉහළ නැංවීම සඳහා පුළුල් පරාසයක දේශීය හා විදේශීය පුහුණු අවස්ථා ලබා දෙමින් ඔවුන්ගේ වෘත්තීය ප්‍රගතිය සඳහා ඔවුන්ගේ පුද්ගල අවස්ථා වැඩි දියුණු කරමින් ආයතනික දැක්මට දායක වීමට පහසුකම් සපයනු ලබයි. Covid 19 සමාජ දුරස්ථ ක්‍රියාමාර්ග හේතුවෙන් බොහෝ සේවකයින්ට ඔවුන්ගේ විදේශ හා දේශීය සේවා ක්ෂේත්‍රවලට සම්බන්ධ මාර්ගගත පුහුණු අවස්ථා ලබා දී ඇත.

සේවක කාර්ය සාධන කළමනාකරණය

මානව සම්පත් අංශය විසින් එක් එක් පුද්ගලයාගේ පවතින සහ අපේක්ෂිත කාර්ය සාධන මට්ටම් අතර පරතරය තක්සේරු කිරීමට අදාළ පුද්ගලයාට සහ ඔවුන්ගේ අධීක්ෂණ අධිකාරියට වේදිකාවක් සපයමින් පුද්ගල ඇගයීම් සිදු කරමින් සමස්ත කාර්ය මණ්ඩලය සඳහා සේවක කාර්ය සාධන ඇගයීම් ක්‍රියාවලිය සාර්ථකව නිම කර ඇත. තව ද, පවරා ඇති බෙදාහැරීම් සාක්ෂාත් කර ගැනීම මත පදනම් ව සේවකයින්ට ඔවුන්ගේ වාර්ෂික වර්ධක ලබා දී ඇත.

සේවක නියැලීම සහ සුබසාධනය

සමස්ත ඵලදායිතාව ඉහළ නැංවීම පිණිස සේවා ස්ථානවල ගැටුම් අවම කරමින් සහ සේවකයින්ගේ චිත්ත ධෛර්යය ඉහළ නංවමින් ගෞරවනීය සේවක සබඳතා පවත්වා ගැනීමේ දී අපගේ වාර්ෂික මානව සම්පත් සැලැස්මේ ප්‍රධාන ස්ථම්භය ලෙස සේවකයින්ගේ සුභසාධනය සහ නියැලීම බව අපි වටහා ගෙන සිටිමු. ඒ අනුව අපි විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇති අතර, Covid-19 සමාජ සීමාවන් හේතුවෙන් එළිමහන් ක්‍රියාකාරකම් නොපැවැත්විණි.

මානව සම්පත් තොරතුරු පද්ධතිය

මානව සම්පත් අංශයට සම්බන්ධ ස්වයංක්‍රීය මානව සම්පත් සහ පරිපාලන ක්‍රියාවලියක් හඳුන්වාදීම තුළින් කණ්ඩායමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම කෙරෙහි මානව සම්පත් අංශය අඛණ්ඩව අවධානය යොමු කරයි, ඒ අනුව දැනට පවතින මානව සම්පත් තොරතුරු පද්ධතියට තව දුරටත් වර්ධනයන් හඳුන්වා දී ඇත.

අනෙකුත් සාමාන්‍ය මානව සම්පත් සහ පරිපාලක ක්‍රියාකාරකම්

තව ද, මානව සම්පත් අංශය විසින් නිවසේ සිට වැඩ කරන තත්වයන් මධ්‍යයේ, කොමිසමේ කාර්යාල පරිශ්‍රයේ සුමට දෛනික ක්‍රියාකාරිත්වයට අදාළ සියලු කටයුතු සිදු කරනු ලබයි.

2022 වසර සඳහා අපගේ ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් වාර්ෂික ව කොමිෂන් සභාවේ නියාමන විෂය පථය යටතේ එන කර්මාන්තවල අවශ්‍යතා සහ ඉල්ලීම් විශ්ලේෂණය කරමින් එහි ක්‍රියාකාරකම් සැලසුම් කරනු ලබයි. රටේ සහ සංවිධානයේ අරමුණු, ප්‍රතිදාන සහ ඉල්ලීම් සපුරාලීම සඳහා ක්‍රියාකාරකම් පහළ සිට ඉහළට ප්‍රවේශයක් ලෙස කෙටුම්පත් කර ඇත.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ඉලක්ක සහ ඉලක්ක අදාළත්වය සමීප ව නිරීක්ෂණය කරනු ලබන ඉදිරි වසර සඳහා ක්‍රියාකාරකම් සකස් කිරීමට සහ හඳුනා ගැනීමට පෙර පූර්ව වර්ෂය පුරා සිදු කරන ලද සියලු ම ක්‍රියාකාරකම් ඇගයීමට ලක් කරනු ලබයි.

යම් ක්‍රියාකාරකම් වසරකට වැඩි කාලයක් පුරා පැවතිය හැකි අතර සමහර ක්‍රියාකාරකම් වසරක් ඇතුළත නිම කළ හැක. මෙම ක්‍රියාකාරකම් විදුලි කර්මාන්තයෙහි සහ ඛනිජ තෙල් කර්මාන්තයෙහි, ජල සේවා කර්මාන්තයෙහි සහ ලිහිසි තෙල් වෙළෙඳපොළෙහි, සාමාන්‍ය ක්‍රියාකාරකම් සහ අනෙකුත් ක්‍රියාකාරකම් ප්‍රතිඵල හතරකට වර්ගීකරණය කර ඇත.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ එක් එක් අංශයේ ක්‍රියාකාරකම් පහත හඳුනා ගෙන ඇත.

විදුලි බල කර්මාන්තය
01 වන ප්‍රතිඵලය
විදුලි පාරිභෝගිකයන් සඳහා වැඩි දියුණු කළ ඵලදායිතාව සහ පහසුව

යොමු අංකය	ක්‍රියාකාරකමේ නම	ක්‍රියාකාරිත්වය පිළිබඳ විස්තරය	පාර්ශවකරුවන්ට ප්‍රතිලාභ	සෘජු පිරිවැය (රු.)
AP22/CP/CA/01	විදුලි පාරිභෝගික ගැටළු විසඳීම සඳහා පාරිභෝගික ජංගම සේවාව	ඉහළ පාරිභෝගික - උපයෝගිතා තෘප්තිය ලබා ගැනීමේ දී විදුලි පාරිභෝගිකයින්ට විසඳිය යුතු / දැනුවත් කළ යුතු ප්‍රශ්ල් පරාසයක ගැටලු / ප්‍රශ්න තිබේ. මෙම ගැටළු සඳහා ප්‍රධානව ම හේතු මතු වී ඇත්තේ පාරිභෝගික - උපයෝගිතා සහ/හෝ වෙනත් සම්බන්ධිත ආයතන අතර නිසි දැනුවත්භාවයක් සහ ඵලදායී සන්නිවේදනයක් නොමැතිකම හේතුවෙනි. විදුලිබල සැපයුම භාවිත කිරීමේ දී පාරිභෝගිකයන් මුහුණ දෙන ගැටලු විසඳීම සඳහා දිවයින පුරා ජංගම සේවා සැසි 57 ක් පැවැත්වීමට කොමිෂන් සභාව සැලසුම් කර ඇත. ඒ අනුව 2022 වර්ෂය තුළ දිස්ත්‍රික්කයක් සඳහා වැඩසටහන් 3ක් (උපරිම) පැවැත්වීමට කොමිෂන් සභාව සැලසුම් කරමින් තිබේ. පාරිභෝගිකයින්, බෙදාහැරීමේ බලපත්‍රලාභීන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සහ අනෙකුත් අදාළ අය විදුලිය භාවිතය සම්බන්ධයෙන් වන දුක් ගැනවිලි සඳහා විසඳුම් සෙවීම සඳහා මුහුණට මුහුණ හමුවීම් සඳහා කොමිෂන් සභාව හා සම්බන්ධ වනු ඇත. යෝජිත ක්‍රියාකාරකම මගින් පාරිභෝගිකයින්ට සේවා සපයන්නන් සහ ඊට සම්බන්ධ අනෙකුත් අදාළ බලධාරීන් සමඟ සෘජු සන්නිවේදනය හරහා ඔවුන්ගේ දුක්ගැනවිලි විසඳීමට හැකියාව ලැබේ. තව දුරටත් බලපත්‍රලාභීන්ට සහ පාරිභෝගිකයින්ට අන් අය අතර සාධාරණ සබඳතා ගොඩනගා ගැනීමට හැකි වනු ඇත. අවසාන වශයෙන්, මෙම ක්‍රියාවලිය	1. සේවා සපයන්නන් සහ ඊට සම්බන්ධ අනෙකුත් අදාළ බලධාරීන් සමඟ සෘජු සන්නිවේදනය හරහා පාරිභෝගික දුක් ගැනවිලි විසඳීම 2. විදුලි පාරිභෝගික ආරක්ෂාව සහතික කෙරේ. 3. බලපත්‍රලාභීන් සහ පාරිභෝගිකයින් අතර සාධාරණ සම්බන්ධතාවයක් ගොඩනැගීම. 4.පාරිභෝගික පහසුව සහ බලපත්‍රලාභියාගේ ඵලදායිතාව වැඩි කිරීම.	21,000,000

		පාරිභෝගික පහසුව සහ බලපත්‍රලාභියාගේ ඵලදායිතාව ඉහළ නැංවීමට සහ එමඟින් පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීමට ද උපකාරී වේ.		
AP22/CP/CA/02	විදුලි පාරිභෝගික අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබඳ කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි විදුලි කාර්මිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන	විදුලි පාරිභෝගික අයිතීන් හා බැඳීම් පිළිබඳ ව ඇතැම් පාරිභෝගිකයන් දැනුවත් ව නොසිටින බව පසුගිය වසරවල කොමිෂන් සභාවට ලැබුණු විදුලි පාරිභෝගික පැමිණිලිවලින් අනාවරණය විය. ඇතැම් පළාත්වල පවත්වනු ලබන පාරිභෝගික ජංගම දුරකථන සේවාවේ දී එය තවදුරටත් තහවුරු වන ලදී. එබැවින් විදුලි පාරිභෝගික අයිතීන් හා බැඳීම් පිළිබඳව අඛණ්ඩ ව දැනුවත් කිරීම සෑම විටම ඔවුන්ට ප්‍රයෝජනවත් වේ. තව ද, පැමිණිලිවලට අදාළ බිම් තොරතුරු ලබා ගත හැකි නම් පාරිභෝගික පැමිණිලි විසඳීමට සහභාගි වීම ඉතා ඵලදායී ආකාරයෙන් සිදු කළ හැකි බව කොමිෂන් සභාවේ අවධානයට ලක්ව ඇත. ඉහත අවශ්‍යතා දෙක සපුරාලීමේ දී ඉතා වැදගත් සම්පතක් ලෙස බලපත්‍රලාභී විදුලි කාර්මිකයන් හඳුනාගත හැකි ය. ඒ අනුව විදුලි කාර්මිකයන් තම වෘත්තියේ නියැලීමේ දී විදුලි පාරිභෝගිකයන් දැනුවත් කිරීමට හැකිවන පරිදි විදුලි පාරිභෝගික අයිතීන් සහ බැඳීම් සම්බන්ධයෙන් විදුලි කාර්මිකයන් දැනුවත් කිරීමට කොමිෂන් සභාව අපේක්ෂා කරනු ලබයි. තව ද, පාරිභෝගික පැමිණිලි විසඳීම සඳහා කොමිෂන් සභාවට වැදගත් වන පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කරුණු හෝ මූලික තොරතුරු ලබා ගැනීම සඳහා විදුලි කාර්මිකයන් යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.	1. බලපත්‍රලාභී විදුලි කාර්මිකයන් නියාමන ක්‍රියාවලිය පිළිබඳ ව දැනුවත් වීම 2. විදුලි පාරිභෝගික අයිතීන් සහ බැඳීම් පිළිබඳ පාරිභෝගිකයාගේ දැනුම වැඩි දියුණු කෙරේ 3. බෙදා හැරීමේ බලපත්‍රලාභීන් වඩා හොඳ පාරිභෝගික සේවාවක් සැපයීමට නැඹුරු වනු ඇත 4. පාරිභෝගික පැමිණිලි වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස විසඳා ගත හැක.	720,000
AP22/CP/CA/03	නිදහස් පාර්ශවයන් සඳහා සැපයුම් සේවා සංග්‍රහය සකස් කිරීම සහ නිදහස් පාර්ශවයන්ගේ විදුලි පාරිභෝගිකයින් සඳහා	පාරිභෝගිකයින්ට විදුලිය බෙදා හැරීම සඳහා ආසන්න වශයෙන් 100 බලපත්‍ර නිදහස් කිරීම් (බෙදා හැරීමක් ලබා ගැනීමේ දී) කොමිෂන් සභාව විසින් ලබා දී ඇත. මෙම නිදහස් කරන ලද	1. මෙහෙයුම් ප්‍රමිතීන් සහ තාක්ෂණික ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම තුළින් පාරිභෝගියින්ට	-

	අයිතිවාසිකම් සහ බැඳීම් ප්‍රකාශය සකස් කිරීම	පාර්ශ්වයන් තම භූමියේ පාරිභෝගිකයින්ට විදුලිය බෙදා හරිනු ලැබේ. නමුත් පාරිභෝගිකයින් සඳහා පිරිනමනු ලබන සේවා ප්‍රමිතීන්, සේවා ගුණාත්මකභාවය, සේවා නියමයන් සහ කොන්දේසි ආදිය නිසි ලෙස විස්තර කර නොමැත. ඒ අනුව විදුලි බිල්පත් ගණනය කිරීම, විදුලි බිල්පත් ගෙවීම, විසන්ධි කිරීමේ ක්‍රියා පටිපාටිය, සේවා බාධා කිරීම් ආදියේ දී නිදහස් පාර්ශවයන් විසින් අනුගමනය කරනු ලබන ක්‍රියා පටිපාටි පිළිබඳව පාරිභෝගිකයන් නොදනී. මෙම අක්‍රමිකතා මඟින් සාමාන්‍යයෙන් විදුලි පාරිභෝගික අයිතිවාසිකම් සහ බැඳීම් උල්ලංඝනය කිරීම් නිර්මාණය කර ඇත. දහස් කරන ලද පාර්ශ්වවල පාරිභෝගිකයින් මුහුණ දෙන ගැටළු සොයා බැලීම සඳහා 2021 වර්ෂයේ දී සිදු කරන ලද සමීක්ෂණය මත පදනම් ව 2022 වර්ෂයේ දී උපදේශනයක් පිරිනැමීමට කොමිෂන් සභාව සැලසුම් කරනු ලැබේ. මෙම උපදේශනය හරහා, "විමුක්ති පාර්ශවයන් සඳහා සැපයුම් සේවා සංග්‍රහයක් (SSC)" සහ "නිදහස් පාර්ශවවල විදුලි පාරිභෝගික අයිතීන් සහ පාරිභෝගිකයින් සඳහා වන වගකීම් සඳහා ප්‍රකාශයක් (SCR&O)" සංවර්ධනය කිරීමට කොමිෂන් සභාව අපේක්ෂා කරනු ලබයි. මෙම ක්‍රියාකාරකමෙහි ප්‍රතිඵලය වනුයේ නිදහස් පාර්ශවයන් තුළ පාරිභෝගිකයන් සඳහා වන සැපයුම් සේවා සංග්‍රහය සහ විදුලි පාරිභෝගික අයිතිවාසිකම් සහ වගකීම් ප්‍රකාශය සංවර්ධනය කිරීමයි. ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල මඟින් බෙදා හැරීමේ බලපත්‍රයෙන් නිදහස් කරන ලද පාර්ශ්වවල වාණිජ තත්ත්වය, බලයේ ගුණාත්මකභාවය සහ සැපයුම්වල ගුණාත්මකභාවය සහතික කිරීම සහ පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහතික කරනු ඇතැයි කොමිෂන් සභාව අපේක්ෂා	බෙදා හැරීමේ බලපත්‍ර ලාභීන්ගෙන් (නිදහස් කරන ලද) වඩා හොඳ සේවාවක් ලැබෙනු ඇත. 2. සේවා නියමයන් සහ කොන්දේසි විධිමත් කිරීම තුළින් පාරිභෝගික අයිතීන් සුරක්ෂිත කෙරේ. 3.බෙදාහැරීමේ බලපත්‍රලා භීන්ගේ (නිදහස් කර ඇති)මෙහෙයුම් කාර්යක්ෂම තාව වැඩිදියුණු කෙරෙන අතර එමඟින් ඔවුන්ගේ පාර්ශ්වකරුවන්ගේ පහසුව ද වැඩිදියුණු කෙරේ.	

		කරනු ලබයි.		
AP22/CP/CA/04	ආපදා කළමනාකරණ සැලැස්ම (ජල සේවා) සකස් කිරීම	ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව, ජල සේවා සඳහා නම් කරන ලද නියාමකයා වන අතර පාරිභෝගිකයින්ට අඛණ්ඩ ව ජලය සැපයීමේ අඛණ්ඩ සේවා සැපයීම සහතික කිරීමේ වගකීමක් දරනු ලැබේ. ස්වාභාවික විපත් උපයෝගිතා පාලනයෙන් ඔබ්බට පවතින නමුත් අඛණ්ඩ සේවා සැපයීම කෙරෙහි ආපදා සැලකිය යුතු ලෙස බලපෑමක් ඇති කරනු ලබයි. එබැවින් ආපදා සූදානම, ආපදා අවම කිරීම සහ ප්‍රතිසාධන ක්‍රියාකාරකම් සඳහා උපයෝගිතා සඳහා දිරිගැන්වීම් සැකසීමට නියාමකයා සතු ව වගකීමක් ඇත. ආපදා කළමනාකරණ පනත යටතේ සියලු ම රාජ්‍ය ආයතන එක් ව ආපදා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමට නියමිත ය. ආපදා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමේ දී නියාමකයාගේ කාර්යභාරය වන්නේ උපයෝගිතා සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC) සමඟ සම්බන්ධීකරණය කිරීමයි. මෙම ක්‍රියාකාරකමේ අපේක්ෂිත ප්‍රතිඵලය වන්නේ උපයෝගිතා ආයතන විසින් ආපදා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමයි. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ සාකච්ඡා කර සැලසුම් සකස් කරන අවස්ථාවේ දී, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) නම් කරන ලද නියාමකයා (designated regulator) වශයෙන් ද, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC) ආපදා කළමනාකරණය සඳහා වගකිව යුතු නියෝජිතායතනය වශයෙන් ද, ආපදා කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය	ජල සේවාවේ ගුණාත්මක භාවය සහ වාණිජ ගුණාත්මක භාවය මඟින් බාධා කිරීම් සංඛ්‍යාව සහ බාධා කිරීම් කාලසීමාව අඩු කිරීම ආදිය වැඩිදියුණු කරනු ඇත. පාරිභෝගිකයින් සඳහා සේවා විශ්වසනීයත්වය වැඩි වනු ඇත. ආපදා අවස්ථාවක දී, ප්‍රතිසාධන කාලය අඩු වී පාරිභෝගිකයින්ට ප්‍රතිලාභ ලැබිය හැකි ය.	2,000,000

		කරනු ඇත. ජාත්‍යන්තර වශයෙන් හොඳම භාවිතයන්ට අනුකූල ව, ආපදා සඳහා සුදානම් වීමේ සහ ඒවා අවම කිරීමේ ක්‍රියාමාර්ග සඳහා වන පිරිවැය, ගාස්තු සැකසීමේ ක්‍රියාවලිය හරහා ඉඩ ලබා දීමට හැකි වේ. එවිට අංශ ක්‍රියාකාරකම් පමණක් ස්වයං මූල්‍යකරණය වනු ඇති අතර නියාමකයාගේ භූමිකාව මෙයට සම්බන්ධ වනු ඇත.		
AP22/RU/CA/01	බෙදාහැරීමේ බලපත්‍රලාභීන් (DLs) විසින් වාර්තා කරන ලද පාරිභෝගික දුක් ගැනවිලි සහ ගැටළු විසඳීම	මෙම ක්‍රියාකාරකමේ අරමුණ ප්‍රධාන වශයෙන් විදුලි පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ වගකීම් පිළිබඳ ව ඔවුන් දැනුවත් කිරීමයි. බලපත්‍රලාභීන්ගේ අයිතිවාසිකම් තවදුරටත් ආරක්ෂා කිරීම සහ විදුලිය සැපයීම සම්බන්ධ වගකීම් පිළිපැදීමට ඔවුන්ට මග පෙන්වීම ද අරමුණ වේ. 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලි බල පනතේ 4 (1) (අ) වගන්තිය මඟින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පිහිටුවීමේ එක් ප්‍රධාන අරමුණක් වන්නේ විදුලිය සැපයීම සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ උනන්දුව ආරක්ෂා කිරීම බව හඳුනා ගෙන ඇත. කොමිෂන් සභාව විසින් සකස් කරන ලද රෙගුලාසි, රීති, කේත සහ මාර්ගෝපදේශ වැනි නියාමන මෙවලම් සහ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බලපත්‍රලාභීන්ගේ සැපයුම් සේවා සංග්‍රහය යනාදිය පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා කොමිෂන් සභාව විසින් භාවිතා කරන අනෙකුත් ව්‍යවස්ථාපිත ලේඛන වේ. කොමිෂන් සභාවේ පාරිභෝගික කටයුතු අංශය මඟින් පාරිභෝගික දුක්ගැනවිලි සහ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් වාර්තා කරන ලද ගැටළු විසඳීමට සැලසුම් කරනු ලබයි. ඒ අනුව, කොමිෂන් සභාව විසින් සකස් කරන ලද නියාමන මෙවලම් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා පහත පියවර ගැනීමටත් එමඟින් නියාමන	1. විදුලි පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීම සහ විදුලි පාරිභෝගිකයන් ලෙස ඔවුන්ගේ වගකීම් පිළිබඳ ව දැනුවත් කිරීම 2. පාරිභෝගික දුක්ගැනවිලි සඳහා සාධාරණ විසඳුම් 3. බලපත්‍රලාභීන් හට තම පාරිභෝගිකයින්ට කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අවස්ථාව	240,000

		ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමටත් කොමිෂන් සභාව අපේක්ෂා කරයි. 1. බලපත්‍රලාභීන් සහ පාරිභෝගිකයින් නිකුත් කරන ලද නියාමන මෙවලම්වලට අනුකූලදැයි බැලීම සඳහා පාරිභෝගික දුක් ගැනවිලි සමාලෝචනය කිරීම. 2. පාරිභෝගික දුක් ගැනවිලි විසඳීමේ දී එවැනි නියාමන මෙවලම් යොදා ගැනීම සඳහා බලපත්‍රලාභීන් සහ පාරිභෝගිකයන් දැනුවත් කිරීම සහ උපදෙස් දීම. තව ද, පාරිභෝගික පැමිණිලිවලට අදාළ කරුණු සෙවීමේ වාර්තා කැඳවීමෙන් පැමිණිලි විසඳීමේ ක්‍රියාවලිය සඳහා ලියාපදිංචි වී ඇති විදුලි කාර්මිකයන්ගේ සේවය ලබා ගැනීමට සැලසුම් කර ඇත. තව ද, එවැනි විදුලි කාර්මිකයන් සඳහා එක් එක් කරුණු සෙවීමේ වාර්තා ඉල්ලීම් වෙනුවෙන් ගාස්තුවක් ගෙවීමට කොමිෂන් සභාව සැලසුම් කරයි.		
AP22/RU/CA/02	මැදිහත් වීමෙන් ආරවුල් විසඳීම	මෙම ක්‍රියාකාරකමේ අරමුණ වන්නේ බලපත්‍රලාභියා සහ ගාස්තු පාරිභෝගිකයා අතර බලපත්‍රලාභියා සහ තවත් බලපත්‍රලාභියෙක් අතර සහ බලපත්‍රලාභියා සහ වෙනත් බලපෑමට ලක් වූ පාර්ශවයක් අතර පැන නගින ආරවුල් සමථයකට පත් කර කොමිසමට වාර්තා කිරීමයි. 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලි බල පනතේ 39 වැනි වගන්තියේ දක්වා ඇති විධිවිධාන අනුව, එවැනි ආරවුල් විසඳීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි සඳහන් කරමින් කොමිෂන් සභාව විසින් 2016 වසරේ විදුලි (ආරවුල් විසඳීමේ ක්‍රියා පටිපාටිය) ගැසට් කර ඇත. කොමිෂන් සභාව විසින් ගැසට් කර ඇති විදුලි (ආරවුල් විසඳීම) නීති රීති සඳහා බලපත්‍රලාභීන්, පාරිභෝගිකයින් සහ අනෙකුත් බලපෑමට ලක් වූ පාර්ශ්වයන් විසින්	1. විදුලි පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීම සහ විදුලි පාරිභෝගිකයන් ලෙස ඔවුන්ගේ වගකීම් පිළිබඳ ව දැනුවත් කිරීම 2. බලපත්‍රලාභීන් සහ පාරිභෝගිකයින් සහ බලපත්‍රලාභීන් සහ වෙනත් බලපෑමට ලක් වූ පාර්ශ්වයන් අතර පැන නගින ආරවුල් සඳහා සාධාරණ විසඳුම් 3. බලපත්‍රලාභීන්ට තම පාරිභෝගිකයින්ට කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අවස්ථාව	200,000

		අනුකූල වීම එය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රධාන සාධකයකි. එබැවින් මෙම නීති රීති ක්‍රියාත්මක කිරීමත් සමඟ, කොමිෂන් සභාව විසින් එහි පාර්ශවකරුවන්ට වඩා හොඳ සේවාවක් සඳහා පහත පරිදි එය වරින් වර සමාලෝචනය කිරීමට සැලසුම් කරයි; 1. නීතිරීතිවලට අනුකූල වීම නිරීක්ෂණය කිරීම 2. නීතිරීතිවල I සහ II කොටස හරහා විසඳන ලද ආරවුල් ගණන අධීක්ෂණය කිරීම 3. පැන නගින ආරවුල් විසඳීම සඳහා නීති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට බලපත්‍රලාභීන් සහ පාරිභෝගිකයින් දැනුවත් කිරීම සහ උපදෙස් දීම.		
AP22/RU/CA/03	විදුලි පාරිභෝගික උපදේශන කමිටු (CCC) සම්බන්ධීකරණය	2002 අංක 35 දරණ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ (PUCSL) පනතේ 29 වැනි වගන්තියට අනුව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) මඟින් විදුලි පාරිභෝගික උපදේශක කමිටුවක් (CCC) පත් කිරීමට අවශ්‍ය වේ. විදුලි පාරිභෝගික උපදේශක කමිටුවෙහි කාර්යයන් වනුයේ: 1. PUCSL පනත යටතේ නියම කළ යුතු හෝ තීරණය කළ යුතු සුදුසු ප්‍රමිතීන් පිළිබඳ ව කොමිෂන් සභාවට උපදෙස් ලබා දීම. 2. කිසියම් මහජන උපයෝගිතා කර්මාන්තයක් විසින් සපයනු ලබන භාණ්ඩ හෝ සේවා මඟින් පාරිභෝගිකයින්ගේ අවශ්‍යතා තෘප්තිමත් වේ ද යන්න නිරීක්ෂණය කිරීම සහ, 3. මෙම පනත යටතේ නියම කර ඇති හෝ තීරණය කර ඇති ප්‍රමිතීන් සහ එම ප්‍රමිතීන් සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් කිරීම ප්‍රවර්ධනය කිරීම විදුලි පාරිභෝගික උපදේශන කමිටුවෙහි යොමු නියමයන්ට අනුව, එය සෑම මසක ම අවසාන සඳුදා කොමිෂන් සභාවේ දී මාසික ව රැස් වේ. විදුලි පාරිභෝගික	1. විදුලි පාරිභෝගික උපදේශක කමිටුව සක්‍රීය කිරීම. 2. පාරිභෝගික ආරක්ෂාව සහතික කිරීම 3. PUCSL පනත මගින් නියම කර ඇති හෝ තීරණය කර ඇති හඳුනාගත් සුදුසු ප්‍රමිතීන්	2,220,000

		උපදේශන කමිටුව මාසික රැස්වීම යනු සාමාජිකයින්ට PUCSL පනත මගින් පවරා ඇති ඔවුන්ගේ කාර්යයන් , අදාළ වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ එන ක්‍රියාකාරකම් සහ සහ කලාපීය සහ අංශ අනුව පාරිභෝගික ගැටළු සාකච්ඡා කිරීමට පවතින යාන්ත්‍රණයයි.		
AP22/RU/CA/04	CEB & LECO හි පාරිභෝගික සේවා කාර්ය සාධනය මැනීම	විදුලිබල (බෙදා හැරීමේ) කාර්ය සාධන ප්‍රමිති රෙගුලාසි පිළිබඳ 2016 ජූලි 13 වැනි දින ප්‍රකාශයට පත් කරන ලද අංක 1975/44 දරණ ගැසට් නිවේදනය යටතේ, බලපත්‍රවල ගුණාත්මකභාව, සැපයුම් ගුණාත්මකභාව සහ වාණිජ තත්ත්ව (බෙදාහැරීමේ පද්ධති අලාභ සහ සේවා ගුණාත්මකභාවය) මට්ටම් වැඩිදියුණු කිරීම සඳහා බලපත්‍රලාභීන්ගේ කාර්ය සාධනය කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලැබේ. ඒ අනුව, වාණිජ තත්ත්වයට අදාළ පාරිභෝගික සේවා කාර්ය සාධනය මැනීම පාරිභෝගික කටයුතු අංශය විසින් සිදු කරනු ලබන අතර බලශක්තියේ ගුණාත්මකභාවය සහ සැපයුම් ගුණාත්මකභාවය සම්බන්ධයෙන් කාර්ය සාධනය මැනීම බලපත්‍ර අංශය විසින් සිදු කරනු ලැබේ. කොමිෂන් සභාවෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමත් සමඟ ලංකා විදුලි (පුද්ගලික) සමාගම විසින් 2019 දී අනුවර්තන අදියර සම්පූර්ණ කරන ලදී. 2020 වර්ෂයේ දී, ඔවුන් ප්‍රායෝගික වේදිකාවට අදාළ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා කොමිෂන් සභාව සමඟ සම්බන්ධ විය. ඒ අනුව, කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආකෘතිවලට අනුව, LECO විසින් 2020 අග භාගයේ දී එකඟ වූ කාර්ය සාධන දර්ශක ගණනය කිරීම සහ ඉදිරිපත් කිරීම පරීක්ෂා කිරීම ආරම්භ කරන ලදී. 2021 වර්ෂයේදී ද LECO විසින් එකඟ වූ කාර්ය සාධන දර්ශකවලට අදාළ පරීක්ෂණ දත්ත (නිවැරදිතා පරීක්ෂණ අරමුණු	1. විදුලි සැපයුම භාවිතය පිළිබඳ පාරිභෝගිකයින් සඳහා වඩා හොඳ සේවාව 2. බලපත්‍රලාභියාට කාර්ය සාධන මට්ටම මැනීමට සහ කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට හැකි වේ. 3. පාරිභෝගික සේවයට අදාළව බලපත්‍රලාභියා සහ PUCSL විසින් ප්‍රකාශයට පත් කරන ලද දත්ත අනාගත පර්යේෂණ කටයුතු සඳහා උපකාරී වනු ඇත.	-

		සඳහා) යැවීම දිගටම කරගෙන යන ලදී. 2022 වර්ෂයේ දී කොමිෂන් සභාව සිය කාර්ය සාධනය ඇගයීමට ලක්කර කාර්තුමය වාර්තා කොමිසම වෙත ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත. අනුවර්තන අදියර ක්‍රියාත්මක කිරීම 2021 වසර අවසන් වන විට ලංකා විදුලි බල මණ්ඩලය විසින් සම්පූර්ණ කරනු ඇතැයි කොමිෂන් සභාව අපේක්ෂා කරයි. අනුවර්තන අදියර අවසන් වීමත් සමඟ කොමිෂන් සභාව සහ ලංකා විදුලි බල මණ්ඩලය ප්‍රායෝගික වේදිකාවේ පළමු වසර 2022 වර්ෂයේ දී සම්පූර්ණ කිරීමට අවශ්‍ය වේ. මෙම අදියරේ දී, ලංකා විදුලි බල මණ්ඩලය සෑම මසක ම එකඟ වූ කාර්ය සාධන දර්ශක ගණනය කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර එහි කාර්ය සාධනය ඇගයීමට ලක් කර කාර්තුමය වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. පාරිභෝගික සේවා කාර්ය සාධනය මැනීමේ ප්‍රධාන අරමුණ වන්නේ බලපත්‍රලාභීන්ගේ වාණිජ තත්ත්වය (බෙදා හැරීමේ පද්ධති අලාභ සහ සේවා ගුණාත්මකභාවය) වැඩිදියුණු කිරීමයි. ඒ අනුව, නියාමන ක්‍රියාවලිය තුළ ක්‍රියාකාරකම්වල ප්‍රතිදානය ඉදිරියට ගෙන යාම සහතික කිරීම සඳහා කොමිෂන් සභාව විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගනු ඇත. 1. බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තා ඇගයීමට ලක් කිරීමෙන් සහ කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව ප්‍රකාශයට පත් කිරීමෙන් කොමිෂන් සභාව විසින් සෑම කාර්තුවකට ම අනුකූල වීම අධීක්ෂණය කරනු ලබයි. 2. පැමිණිලි පහසු කිරීම හරහා නියාමනය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව පාරිභෝගිකයන් දැනුවත් කිරීම 3. කාර්ය සාධනයේ අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සඳහා කාර්තුමය වශයෙන් බලපත්‍රලාභීන් සමඟ		

		සම්බන්ධ වීම.		
AP22/RU/CA/05	පාරිභෝගික සේවා කාර්ය සාධනය සම්බන්ධ තොරතුරු බෙදා හැරීම	ඕනෑම කර්මාන්තයක් විශේෂයෙන් ම විදුලිය වැනි ඒකාධිකාරී කර්මාන්තයක් දියුණු කිරීමට තොරතුරු බෙදා හැරීම ප්‍රධාන සාධකයකි. ඒ අනුව බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සහ කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්වලට අදාළ දත්ත විශ්ලේෂණය කිරීමෙන් තොරතුරු රැස් කිරීම සහ බෙදා හැරීම නියාමකයාගේ මැදිහත්වීමේ ප්‍රතිඵලයක් ලෙස අංශයේ ක්‍රියාකාරිත්වය සහ ප්‍රගතිය අවබෝධ කර ගැනීමට වැදගත් වේ. අංශයේ සංවර්ධනයට පාර්ශවකරුවන් දායක වී ඇති ආකාරය සහ වැඩි අවධානයක් අවශ්‍ය ක්ෂේත්‍ර අවබෝධ කර ගැනීම සඳහා එය තවදුරටත් උපකාරී වනු ඇත. ඉහත කරුණු සපුරාලීම සඳහා පහත සඳහන් ක්ෂේත්‍රවල දත්ත විශ්ලේෂණය කිරීමට, විශ්ලේෂණ වාර්තා ඉදිරිපත් කිරීමට සහ ප්‍රකාශයට පත් කිරීමට සැලසුම් කර ඇත. 1. පාරිභෝගික පැමිණිලි වාර්තා කිරීම සහ විසඳීම 2. බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ පාරිභෝගික සේවා කාර්ය සාධනය කොමිෂන් සභාවේ වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය, මුද්‍රිත මාධ්‍ය වැනි වේදිකා භාවිතයෙන් දත්ත ඉදිරිපත් කිරීම සහ ප්‍රකාශ කිරීම සිදු කෙරේ.	1. විදුලි සැපයුම භාවිතය පිළිබඳ පාරිභෝගිකයින් සඳහා වඩා හොඳ සේවාවක් 2. බලපත්‍රලාභියාට කාර්ය සාධන මට්ටම මැනීමට සහ කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට හැකි වේ. 3. පාරිභෝගික සේවයට අදාළ බලපත්‍රලාභියා සහ PUCSL විසින් ප්‍රකාශයට පත් කරන ලද දත්ත අනාගත පර්යේෂණ කටයුතු සඳහා උපකාරී වනු ඇත.	-
AP/2022/RA/CP/04	තුන් වන පාර්ශ්ව ආයෝජනයට පහසුකම් සැලසීම සඳහා වහල මුදුනේ (rooftop) සූර්ය බලශක්ති උත්පාදනයට අදාළ ගිවිසුම් ව්‍යුහය සමාලෝචනය කර සංශෝධනය කිරීම	ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL), 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලි බල පනතේ (SLEA) 10 (3) (සංශෝධිත) වගන්තිය යටතේ ලබා දී ඇති බලතල ප්‍රකාර ව, 2017.01.03 සිට 2037.01.02 දක්වා කාලය තුළ වහල මුදුනේ සූර්ය බලශක්ති උත්පාදනයට සහභාගී වන තීරුබදු පාරිභෝගිකයන් වෙත ජනන බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරමින් නිදහස් කිරීමේ සහතිකයක් නිකුත් කර ඇත.	ආයෝජකයා විසින් ගාස්තු පාරිභෝගිකයෙකුට අයත් ගොඩනැගිල්ලක එහි PV පහසුකම ඉදිකර, ස්ථාපනය සහ ක්‍රියාත්මක කරනු ලබන්නා වූ සූර්ය බලශක්ති ව්‍යාපෘතිවල ආයෝජකයින්ගේ අවශ්‍යතා ආරක්ෂා කරයි.	750,000

		ආයෝජකයෙකු විසින් ගාස්තු පාරිභෝගිකයෙකුට අයත් ගොඩනැගිල්ලක එහි PV පහසුකම ඉදි කිරීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සූර්ය බලශක්ති ව්‍යාපෘති කෙරෙහි ආයෝජක උනන්දුව ඇත. කෙසේ වෙතත්, බෙදාහැරීමේ බලපත්‍රලාභියා (DL) විදුලිය අපනයනය කරන්නා ලෙස ගොඩනැගිලි හිමිකරු එනම් එහි ගාස්තු පාරිභෝගිකයා පමණක් හඳුනා ගන්නා අතර ඒ අනුව විදුලිය මිල දී ගැනීම සහ ගෙවීම සඳහා ගොඩනැගිලි හිමිකරු සමඟ ගිවිසුම්ගත වේ. මෙමගින් PV පහසුකම මගින් විදුලිය නිපදවන ආයෝජකයාට සුළු හෝ ආරක්ෂාවක් නොලැබෙන අතර, ඒ වෙනුවට, ආයෝජකයා විසින් එසේ ජනනය කරන ලද විදුලිය සඳහා ගෙවීම් ලබාගැනීම සඳහා ගාස්තු පාරිභෝගිකයා මත විශ්වාසය තැබීමට සලස්වා ඇත. ජාතික විදුලිබල පද්ධතියට විදුලිය උත්පාදනය හා සැපයීමේ දී ආයෝජකයා, ගාස්තු පාරිභෝගිකයා සහ බෙදාහැරීමේ බලපත්‍රලාභියා අතර පැහැදිලි, විනිවිද පෙනෙන සහ ඵලදායී ගිවිසුම්ගත වැඩපිළිවෙලක් නොමැති විට, (i) ගාස්තු පාරිභෝගිකයන් විසින් උත්පාදනය කරන ලද විදුලිය සඳහා ගෙවීම් කිරීමට අපොහොසත් වීම සහ (ii) ගාස්තු පාරිභෝගිකයින් වෙබ් අඩවියට පිවිසීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ආයෝජකයාට උත්පාදනය නතර කිරීම සහ PV පහසුකම ඉවත් කිරීම වැලැක්වීම හේතුවෙන් බොහෝ ආයෝජකයින් දුෂ්කරතාවන්ට මුහුණ දී ඇත. ආයෝජකයාට ප්‍රමාණවත් ආරක්ෂාවක් සහතික කරමින් මෙන් ම මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නියාමන අධීක්ෂණය ද සහතික කරමින් ආයෝජකයා, ගාස්තු පාරිභෝගිකයා සහ බෙදාහැරීමේ බලපත්‍රලාභියා අතර		

		පැහැදිලි, විනිවිද පෙනෙන සහ ඵලදායී ගිවිසුම්ගත වැඩපිළිවෙලක් ස්ථාපිත කිරීම සඳහා පවත්නා ගිවිසුම් ව්‍යුහය සමාලෝචනය කර සංශෝධනය කිරීම 2023 මැද භාගය වන විට, වහල මුදුනේ සූර්ය යෝජනා ක්‍රම සඳහා ආයෝජකයා, ගාස්තු පාරිභෝගිකයා සහ බෙදාහැරීමේ බලපත්‍රලාභියා අතර සංශෝධිත කොන්ත්‍රාත් ගිවිසුම ක්‍රියාත්මක කිරීමට බෙදා හැරීමේ බලපත්‍රලාභීන් යොමු වනු ඇත.		
AP22/INS/CP/01	කර්මාන්ත ආයතන සඳහා බෙදාහැරීමේ බලපත්‍ර ලාභීන්ගේ විදුලි බල සැපයුම්වල බලශක්ති ගුණාත්මක පරීක්ෂණ පැවැත්වීම.	2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලි බල පනතේ 4 (1) (අ) සහ 4 (2) (ඇ) වගන්තිවලට අනුව සපයනු ලබන විදුලියේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ උනන්දුව ආරක්ෂා කිරීම කොමිෂන් සභාවේ එක් අරමුණකි. තව ද, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 6 (2) (අ) වගන්තියට අනුව, විදුලි පරීක්ෂකවරුන් විසින් විදුලිය සපයන විදුලි බලාගාර සහ විදුලි මාර්ග පරීක්ෂා කිරීම අවශ්‍ය වේ. එබැවින් පාරිභෝගිකයින්ට සපයනු ලබන විදුලියේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් බලපත්‍රලාභීන්ගේ අනුකූලතාවය නිරීක්ෂණය කිරීම සඳහා පරීක්ෂණ පැවැත්වීම අවශ්‍ය වේ. PUCSL විසින් ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි නියැදි කර්මාන්ත ආයතන වෙත බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් මෙම ක්‍රියාකාරකම හරහා ස්ථානීය පරීක්ෂණ සහ විදුලි සැපයුමේ බලශක්ති ගුණාත්මක භාවය මැන බැලීම සිදු කරනු ඇත. BS EN 50160 සහ IEC TS 62749 ජාත්‍යන්තර ප්‍රමිතීන් හා පිරිවිතරයන් සමඟ සසඳන විට විදුලි (බෙදාහැරීමේ) කාර්ය සාධන ප්‍රමිතීන් සමඟ බෙදා හැරීමේ බලපත්‍රලාභියාගේ අනුකූලතාවය නිරීක්ෂණය කිරීම සඳහා කාර්මික පාරිභෝගිකයින්ගේ නියැදියකට විදුලි සැපයුම 2022 වර්ෂය තුළ දී	කාර්මික අංශයේ බලශක්ති ගුණාත්මකභාවය සහ සැපයුම් ගුණාත්මකභාවය සම්බන්ධ ගැටළු හඳුනා ගැනීම. බෙදාහැරීමේ කාර්ය සාධන නියාමනය සමඟ බලශක්ති ගුණාත්මක භාවය අනුකූල වීම අධීක්ෂණය කිරීම.	2,000,000

		පරීක්ෂා කරනු ලැබේ.		
AP/2020/RA/CP/03	සැපයුම් සේවා කේතය සහ විදුලි පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් සහ බැඳීම් ප්‍රකාශය යාවත්කාලීන කිරීම	ඉන් අනතුරුව, සැපයුම් සේවා කේත වෙත සිදු වූ ඇතැම් ඇමුණුම් සහ ඊට අදාළ නියාමන උපකරණ කිහිපයක් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත. එබැවින්, බෙදාහැරීමේ බලපත්‍රලාභීන් මගින් සපයනු ලබන සේවාවන් වඩාත් හොඳින් ලබා ගැනීම සඳහා පාරිභෝගිකයින්ට බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ සැපයුම් සේවා කේතය යාවත්කාලීන කළ යුතුය. ඒ අනුව, 2015 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලද විදුලි පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් සහ වගකීම් ප්‍රකාශය (SRO) ද යාවත්කාලීන කළ යුතු ය. ලංකා විදුලිබල මණ්ඩලයේ හා බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ සාමාන්‍ය සාමාන්‍ය සැපයුම් සේවා කේතය සහ ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ සාමාන්‍ය සැපයුම් සේවා කේතයන්ට ඇමුණුම් ඇතුළත් කරමින් යාවත්කාලීන කිරීම සහ කොමිෂන් සභාව විසින් දැනටමත් අනුමත කර ඇති අදාළ නියාමන උපකරණවල අදාළ විධිවිධාන යාවත්කාලීන කිරීම. යාවත්කාලීන කරන ලද සාමාන්‍ය සැපයුම් සේවා කේත පිළිබිඹු කිරීමට අයිතිවාසිකම් සහ වගකීම් ප්‍රකාශය (SRO) ද යාවත්කාලීන කරනු ලැබේ. යාවත්කාලීන කරන ලද සාමාන්‍ය සැපයුම් සේවා කේතයන් බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර පාරිභෝගිකයින් ඒ පිළිබඳව දැනුවත් කරනු ඇත.	විදුලිය බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් සපයනු ලබන සේවාවන් වඩාත් හොඳින් ලබා ගැනීමට පාරිභෝගිකයින්ට හැකියාව ලබා දේ.	2,674,440
AP22/INS/CP/03	ශ්‍රී ලංකාවේ විදුලි කාර්මිකයන්ට පහසුකම් සැලසීම සඳහා 'Megger Tester' සහ 'Earth Megger Tester' පර්යේෂණ සහ සංවර්ධන.	2009 අංක 20 දරණ පනතේ 3 (1) (g) වගන්තියට අනුව, කොමිෂන් සභාවේ එක් කාර්යයක් වන්නේ විදුලි සැපයුම් සේවාවන්හි ආරක්ෂාව සම්බන්ධයෙන් තාක්ෂණික සහ අනෙකුත් ප්‍රමිතීන් සැකසීම සහ බලාත්මක කිරීමයි. 2009 අංක 20 දරණ පනතේ 4 (1) (a) වගන්තියට අනුව, පාරිභෝගිකයින්ට සපයනු ලබන	දැරිය හැකි මිලකට විදුලි උපකරණ වෙත ප්‍රවේශ වීමට විදුලි කාර්මිකයන්ට පහසුකම් සැලසීම හරහා පාරිභෝගිකයින්ගේ විදුලි ආරක්ෂාව සහතික කිරීම	1,000,000

		විදුලියේ ආරක්ෂාව සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ උනන්දුව ආරක්ෂා කිරීම කොමිෂන් සභාවේ එක් අරමුණකි. දැරිය හැකි මිලකට විදුලි උපකරණ වෙත ප්‍රවේශ වීමට විදුලි කාර්මිකයන්ට පහසුකම් සැලසීම හරහා පාරිභෝගිකයින්ගේ විදුලි ආරක්ෂාව සහතික කිරීම. විශ්ව විද්‍යාලයක 'පර්යේෂණ සහ සංවර්ධනය' භාවිතා කරමින් මිල අඩු 'Megger Tester' සහ 'Earth Megger Tester' හඳුන්වා දීම හරහා බලපත්‍රය ලබා ගැනීමට අපේක්ෂා කරන විදුලි කාර්මිකයන්ට පහසුකම් සැලසීම. නිමැවුම් පර්යේෂණ හා සංවර්ධනය මගින් විදුලි කාර්මිකයන්ට අවශ්‍ය උපාංග අඩු මිලට ලබා ගැනීමට මග සැලසේ. එසේ ම, ජාත්‍යන්තර ප්‍රමිතියට සමගාමී ව උපකරණ සංවර්ධනය කිරීම මඟින් ජාත්‍යන්තර ව ව්‍යාපාරික විභවයක් විවෘත කළ හැකි ය.		
AP22/INS/CP/05	අභ්‍යන්තර විදුලි ස්ථාපනයන් වෙනස් කිරීමට අවසර දීම සහ IET ප්‍රමිතීන්ට අනුකූල වීම තහවුරු කිරීම	2009 අංක 20 දරණ පනතේ 3 (1)(g) වගන්තියට අනුව, කොමිෂන් සභාවේ එක් කාර්යයක් වන්නේ විදුලි සැපයුම් සේවා සහ මිනුම් සේවාවල ආරක්ෂාවට අදාළ තාක්ෂණික සහ අනෙකුත් ප්‍රමිතීන් සැකසීම සහ බලාත්මක කිරීම ය; 2009 අංක 20 දරණ පනතේ 4 (1) (a) වගන්තියට අනුව, පාරිභෝගිකයින්ට සපයනු ලබන විදුලියේ ආරක්ෂාව සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ උනන්දුව ආරක්ෂා කිරීම කොමිෂන් සභාවේ එක් අරමුණකි. අභ්‍යන්තර රැහැන් සවි කිරීම් සහ වෙනස් කිරීම් වලදී සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කිරීම සහ පාලනය කිරීම මගින් විදුලි පාරිභෝගිකයින් සහ ජීවිත ආරක්ෂා කිරීම් හරහා සිදු කෙරේ. නිවසක/නිවාසයක අභ්‍යන්තර	අභ්‍යන්තර රැහැන් සවි කිරීම් සහ වෙනස් කිරීම් මත සිදු වන වෙනස්කම් නිරීක්ෂණය කිරීම සහ පාලනය කිරීම මගින් විදුලි පාරිභෝගිකයින් සහ ජීවිත ආරක්ෂා කිරීම.	500,000

		රැහැන්වල වෙනස් කිරීම් පාලනය කිරීම සඳහා රෙගුලාසි/ රීතියක් සකස් කිරීමට සහ පැනවීමට පළාත් පාලන ආයතන සහ නාගරික සංවර්ධන අධිකාරිය බලාත්මක කිරීම. එසේම, බලපත්‍රලාභීන්ගේ සහාය ඇති ව පරීක්ෂණ නිර්ණායක සංවර්ධනය කිරීමේ හැකියාව සොයා බැලීම. වසර ගණනාවක් පුරා, අභ්‍යන්තර රැහැන්වල වෙනස් කිරීම් සාතීය අනුපාතයේ වැඩි වීමක් දක්නට ලැබෙන අතර, එය පදිංචිකරුවන්ට දැවැන්ත තර්ජනයක් ඇති කරයි. එය සිදුවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ සිදු කරන ලද වෙනස් කිරීම් වලක්වා ගැනීමයි. අපේක්ෂිත වෙනස්කම් ප්‍රථමයෙන් අනුමත කර ගැනීම සඳහා දැඩි ක්‍රියා පටිපාටියක් අනුගමනය කළ යුතු නම් මෙය අවම කර ගත හැක.		
AP/2022/LIC/CP/01	විදුලි බල ප්‍රවාහනය (Wheeling) පිළිබඳ නියාමන මෙවලම් සකස් කිරීම (ආරක්ෂාව සහ තාක්ෂණික)	විදුලි ජාලය සඳහා විදුලි බල ප්‍රවාහනය (Wheeling) හඳුන්වා දීමට රජය කටයුතු කරමින් සිටී. මේ මොහොතේ ප්‍රශස්ත බල ප්‍රවාහය, රෝද ගාස්තු, ආරක්ෂිත කරුණු යනාදී විදුලි බල ප්‍රවාහනය සම්බන්ධ අංශ ආවරණය කිරීමට අදාළ වන විශේෂිත නියාමන මෙවලම් නොමැත.එසේ ම, විදුලි බල ප්‍රවාහනය හඳුන්වාදීමත් සමඟ, පවතින නියාමන මෙවලම්වල සමහර අන්තර්ගතයන් වෙනස් කිරීම අවශ්‍ය වේ. මෙම ක්‍රියාකාරකම හරහා විදුලි බල ප්‍රවාහනය සම්බන්ධයෙන් නියාමන අවශ්‍යතා සපුරාලන නව නියාමන මෙවලම් හඳුනාගෙන සංවර්ධනය කිරීමට සහ පවතින නියාමන මෙවලම් සංශෝධනය කිරීමට PUCSL සැලසුම් කරනු ලබයි.	පාර්ශ්වකරුවන්ට ඵලදායී ලෙස විදුලි බල ප්‍රවාහනය සඳහා විදුලි ජාලය භාවිතා කළ හැකිය.	0
AP/2022/LIC/CP/02	උපයෝගිතා (CEB සහ LECO) සමඟ අන්තර් සම්බන්ධිත දත්ත සමුදාය පිහිටුවීම	කර්මාන්තය නියාමනය කිරීම සඳහා නියාමකයෙකුට දත්ත ඉතා වැදගත් වේ. නමුත් නියාමනය කරන ලද ආයතනවල දත්ත වලට, PUCSL වසර පුරාවට මුහුණ දී ඇත්තේ පහත පරිදි ය; ➢ නියාමනය කරන ලද කර්මාන්ත සඳහා යාවත්කාලීන කිරීම් සහ නිවැරදි දත්ත නොමැති	වාර්තා සැකසීම, තීරණ ගැනීම සහ වෙනත් ආකාරයේ තොරතුරු බෙදා හැරීම සඳහා PUCSL වෙතින් නිවැරදි දත්ත ලබා ගත හැකි බව සහතික කිරීම.	3,000,000

		වීම. ➢ අවශ්‍යය දෘඩ පිටපත් හරහා දත්ත ලබා දීම සිදු වන බැවින් දත්ත අතින් (manually) ඇතුල් කිරීමට සිදු වීම. ➢ අතින් දත්ත ඇතුලු කිරීම නිසා ප්‍රමාදයන් සහ විවිධ නිරවද්‍යතා ගැටළු ඇති වීම. එබැවින්, CEB සහ LECO දත්ත සමුදායන් ඇතුලත් නිශ්චිත තොරතුරු / දත්ත කට්ටලයක් සමඟ ඒකාබද්ධ කරන ලද අතුරු මුහුණතක් (පද්ධතිය) PUCSL සඳහා සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ. එවිට, PUCSL හට එම දත්ත / තොරතුරු වෙත සෘජු ප්‍රවේශය ඇත. එවැනි දත්ත/තොරතුරු ලැයිස්තුව පහත දක්වා ඇත; මාසික දත්ත - පාරිභෝගිකයින් සංඛ්‍යාව, බලශක්ති විකුණුම් (kWh), බලශක්ති ගාස්තු (LKR), උපරිම ඉල්ලුම මාසික දත්ත - ශුද්ධ මිනුම්කරණය, ශුද්ධ ගිණුම්කරණය, Net Plus තොරතුරු මාසික ඇනහිටීම් දත්ත මාසික උත්පාදනය - බලශක්තිය මාසික උත්පාදනය - පිරිවැය (ධාරිතාව, බලශක්තිය) මාසික උත්පාදනය - උපරිම ඉල්ලුම මාසික උත්පාදනය - අහඹු උපරිම ඉල්ලුම දෛනික ජනන වාර්තාවේ දත්ත, තත්‍ය පද්ධති බෙදා හැරීම, පූර්ව පුරෝකථනය SDDP පුරෝකථන මාදිලියේ ප්‍රතිඵලවල මාසික දත්ත, පද්ධති පාලන මාසික සමාලෝචන වාර්තා වල දත්ත ආර්ථික බෙදා හැරීම සඳහා භාවිතා කරන සෑම බලාගාරයක ම බලශක්ති පිරිවැය කාලසටහනෙහි මාසික දත්ත සම්ප්‍රේෂණ කාර්ය සාධන ප්‍රමිති රෙගුලාසි සඳහා කාර්තුමය දත්ත		

		බෙදා හැරීමේ කාර්ය සාධන ප්‍රමිති නියාමනය සඳහා මාසික දත්ත		
AP/2022/LIC/CP/03	පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති අධීක්ෂණය	PUCSL විසින් පුනර්ජනනීය බලශක්ති (RE) ව්‍යාපෘති සඳහා ජනන බලපත්‍ර ලබා දුන්න ද, එම පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ මන්දගාමී ප්‍රගතියක් නිරීක්ෂණය කර ඇත. එබැවින්, මෙම පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ මන්දගාමී ප්‍රගතිය පිටුපස ඇති හේතු හඳුනා ගැනීම අවශ්‍ය වේ. එබැවින්, එම ගැටළු හඳුනා ගැනීම සඳහා ව්‍යාපෘති නියැදිය (බලපත්‍රය ලබා දී ඇති) පරීක්ෂා කරනු ලැබේ. හඳුනාගැනීම් මත පදනම් ව, ගැටළු නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. ගැටළු හඳුනාගත් පසු, විදුලිබල කර්මාන්තයේ නියාමකයා ලෙස මහජන උපයෝගිතා කොමිෂන් සභාවට ඒවා සඳහා මැදිහත් විය හැක. අනෙකුත් ආයතනවල විෂය පථය යටතේ ඇති ගැටළු සඳහා, හඳුනා ගත් ගැටළු සහ හැකි විසඳුම් සඳහන් කරමින් අවශ්‍ය ප්‍රතිපත්ති විධාන රජයට ලබා දීමට මහජන උපයෝගිතා කොමිසමට හැකි ය. එම, හඳුනාගත් ගැටළු / බාධක අවම කර ගත හැකි අතර එමඟින් එම ව්‍යාපෘති කඩිනම් ක්‍රියාවට නැංවීමට හැකි වන අතර ජාලයට අවශ්‍ය ජනන එකතු කිරීම සැලසුම් කළ පරිදි සිදු කෙරෙනු ඇත.	පාරිභෝගිකයින් සඳහා විදුලිය ලබා ගැනීම සහතික කිරීම	840,000
AP/2021/LIC/CP/02	නිදහස් කරන ලද පාර්ශ්වයන්ගේ (විදුලිය නිපදවීමට / බෙදා හැරීමට සහ සැපයීමට බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති) නියාමන රාමුව නැවත බැලීම සහ සංශෝධනය කිරීම	නිදහස් කරන ලද පාර්ශ්ව (විදුලිය උත්පාදනය / බෙදා හැරීම සහ සැපයීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් පාර්ශවයන්) නිදහස් කිරීමේ සහතිකයක් සහ එහි පනවා ඇති සම්බන්ධිත කොන්දේසි ඔස්සේ දැනට සැහැල්ලුවෙන් නියාමනය කරනු ලැබේ. පසුගිය කාලය තුළ මහල් නිවාස ක්ෂේත්‍රයේ ශීඝ්‍ර සංවර්ධනයත් සමඟ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වූ අතර,පවතින නියාමන රාමුව සමඟ සැපයීම නිදහස් කළ නොහැකි විදුලිය බෙදා හැරීම හා නව	නිදහස් කරන ලද පාර්ශ්වයන් ව සහ ඔවුන්ගේ කුලී නිවැසියන් ව ගුණාත්මක භාවය, විශ්වසනීයත්වය, තරඟ කාරිත්වය, පාරිභෝගික අයිතිවාසිකම් සහ බැඳීම් යනාදිය සම්බන්ධයෙන් ඔවුන් මේ මොහොතේ නියාමනය කරනු ලබන ආකාරය	5,000,000.00

		ව්‍යාපාර ආකෘති කිහිපයක් සංවර්ධනය වෙමින් පවතී. එසේ ම, නිදහස් පාර්ශවයන්ට ලබා ගත හැකි ආර්ථික, ආරක්ෂාව සහ තාක්ෂණික නියාමන මෙවලම් මේ මොහොතේ ඉතා සීමිත ය. විදුලිය උත්පාදනය / බෙදාහැරීම සහ විකිණීම සම්බන්ධයෙන් පවතින නියාමන රාමුව සියලු පාර්ශ්වකරුවන්ගේ වර්තමාන සහ අනාගත අවශ්‍යතා සලකා බලා සුදුසු පරිදි සංශෝධනය කළ යුතු ය. තව ද, ආර්ථික, ආරක්ෂාව සහ තාක්ෂණික රෙගුලාසි සඳහා අවශ්‍ය නියාමන මෙවලම් ද හඳුන්වා දිය යුතු ය. එබැවින්, නව වර්ධනයන්ට අනුකූල ව ආමන්ත්‍රණය කළ යුතු එහි අඩුපාඩු හඳුනා ගැනීම සඳහා පවතින නියාමන රාමුව අධ්‍යයනය කිරීම අවශ්‍ය වේ. මේ සඳහා නව නියාමන මෙවලම් සකස් කිරීම සඳහා පවතින නියාමන රාමුව සඳහා කළ යුතු වෙනස්කම් ඉදිරිපත් කිරීම සඳහා උපදේශකයෙකු බඳවා ගනු ලැබේ. පළමු පියවර ලෙස, මෙම උපදේශනය යටතේ ආවරණය වන වැඩ විෂය පථය හඳුනා ගැනීම සඳහා LIC අංශය මගින් කුඩා සමීක්ෂණයක් පවත්වනු ලැබේ. ඉන් පසු ව, ඒ අනුව උපදේශකවරයා බඳවා ගනු ලැබේ. උපදේශකයාගේ ප්‍රතිදානය සමඟින්, PUCSL හට දැනට පවතින නියාමන මෙවලම් සංශෝධනය / වෙනස් කිරීම මෙන් ම නිදහස් පාර්ශවයන් සම්බන්ධයෙන් නව නියාමන මෙවලම් පැනවිය හැක. ඒ අනුව, මෙම සංශෝධිත නියාමන රාමුව සහ නව නියාමන මෙවලම් සමඟින්, PUCSL හට සියලු ම පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා (ගුණාත්මකභාවය, විශ්වසනීයත්වය, තරඟකාරීත්වය, පාරිභෝගික අයිතිවාසිකම් සහ බැඳීම් ආදිය) සපුරාලීමේ අවසාන ඉලක්කය සමඟ නිදහස් පාර්ශවයන් ඵලදායී ලෙස	වඩා ඵලදායී ලෙස නියාමනය කරනු ලැබේ.	

		නියාමනය කළ හැකි ය.		
AP/2021/LIC/CP/26	මාර්ග සහ පොදු අවකාශයන් සඳහා ආලෝකකරණය සැලසුම් කිරීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා ප්‍රමිති සහ ආයතනික මෙහෙයුම් ව්‍යුහය පිළිබඳ ප්‍රතිපත්ති උපදෙස් සකස් කිරීම	මාර්ග සහ පොදු අවකාශයන් සඳහා ආලෝකකරණය සම්බන්ධයෙන් ගත් කල, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි (පුද්ගලික) සමාගම, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සහ පළාත් පාලන ආයතන යන ආයතන ගණනාවක් එහි සැලසුම් කිරීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා සම්බන්ධ වී ඇත. දැනට, ඉහත සඳහන් සියලු ම ආයතන විවිධ ක්‍රමවලින් වීදි ආලෝකය සැපයීම සඳහා අර්ධ වශයෙන් හෝ පූර්ණ වශයෙන් සම්බන්ධ වී ඇත. මෙම තත්ත්වය හේතුවෙන් විවිධ තාක්ෂණික, මූල්‍ය සහ සමාජීය ගැටලු ඇති කර ඇති මෙම තත්ත්වය හමුවේ සැලසුම් කිරීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සම්බන්ධයෙන් මාර්ග සහ පොදු අවකාශයන් සඳහා පොදු එකඟ වූ ආලෝක පද්ධතියකට අනුකූල වීමට කිසිදු ආයතනයකට බල නො කෙරේ. එබැවින්, මාර්ග සහ පොදු අවකාශයන් සඳහා ආලෝකකරණය සැලසුම් කිරීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා අද්විතීය ප්‍රමිති මාලාවක් හඳුන්වා දීම අවශ්‍ය වන අතර මාර්ග සහ පොදු අවකාශයේ ආලෝකය කළමනාකරණය කිරීම සඳහා හොඳම ආයතනික රාමුව හඳුන්වා දීම අවශ්‍ය වේ. විශ්ලේෂණාත්මක අධ්‍යයනයකින් පසු මාර්ග සහ පොදු අවකාශයන් සඳහා ආලෝකකරණය සැලසුම් කිරීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා අවශ්‍ය ප්‍රමිතීන් සංවර්ධනය කිරීමට PUCSL සැලසුම් කර ඇති අතර	මාර්ග සහ පොදු අවකාශයන් සඳහා ආලෝකකරණය සැලසුම් කිරීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා වූ සුවිශේෂී ප්‍රමිතීන් සමූහයකින් සියලු ම පාර්ශවකරුවන්ට ප්‍රතිලාභ ලැබෙනු ඇත.	3,000,0000.00

		එය ක්‍රියාත්මක කිරීම සඳහා හොඳම ආයතනික රාමුව සඳහා ප්‍රතිපත්ති උපදෙස් සකස් කරනු ලැබේ. ඒ සමඟින්, එක් එක් ආයතනයට මාර්ග සහ පොදු අවකාශයන් සඳහා ආලෝකකරණය සම්බන්ධයෙන් තම වැඩ විෂය පථය නිර්ණය කළ හැකි අතර, මහජන උපයෝගිතා කොමිසම විසින් එය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරනු ඇත.		
AP/2021/LIC/CP/28	බෙදා හැරීමේ සංග්‍රහය සඳහා සංශෝධන	පවතින බෙදා හැරීමේ සංග්‍රහය 2012 වර්ෂයේ දී සකස් කරන ලද අතර එය 2012 ජූලි මාසයේ දී PUCSL විසින් අනුමත කරන ලදී. බෙදා හැරීමේ පද්ධතියේ වර්ධනයන් කිහිපයක් විශේෂයෙන්ම Roof Top Solar PV (Solar Battle, Net Metering, Net Accounting, Net Plus) ඒකාබද්ධ කිරීමේ සහ embedded generators ((Mini hydro, Solar, Wind, Biomass, ආදිය) ඒකාබද්ධ කිරීමේ දී මෑතක දී සිදුවී ඇති බව නිරීක්ෂණය විය. මෙම වර්ධනයන් බලශක්තියේ ගුණාත්මකභාවය, සැපයුමේ ගුණාත්මකභාවය, දෝෂ මට්ටම, බෙදාහැරීමේ ජාලයේ ආරක්ෂණ සම්බන්ධීකරණයේ විවිධ වෙනස්කම් ඇති කර ඇත. මෙම සේවාව සඳහා දැනටමත් කමිටුවක් පත් කර ඇති බැවින්, මෙම ක්‍රියාකාරකම හරහා අවශ්‍ය සංශෝධන සිදු කිරීම සහ බෙදා හැරීමේ සංග්‍රහය ක්‍රියාත්මක කිරීම සඳහා PUCSL විසින් සම්බන්ධීකරණය කෙරෙනු ඇත.	බෙදා හැරීමේ කේතය යාවත්කාලීන කෙරෙනු ඇති අතර එමගින් බෙදා හැරීමේ ජාලයේ බලශක්ති ගුණාත්මක භාවය සහ සැපයුම් ගුණාත්මක භාවය යාවත්කාලීන කරනු ඇත.	1,800,000.00
AP20**2**2**/**LIC**/**RU/01	විදුලිබල අංශයේ බලපත්‍ර සහ අදාළ ක්‍රියාවලි	2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ (සංශෝධිත පරිදි) 7, 9, 10, 12,13, 21 සහ 22 වගන්තිවලට අනුව, සහ විදුලි (බලපත්‍ර සහ නිදහස් කිරීම් සඳහා වන අයදුම්පත්) රෙගුලාසිය,2009 සැප්තැම්බර් 03 බ්‍රහස්පතින්දා දිනැති 2009 අංක 1,617/34 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව,	අයදුම්කරුවන් රටේ ඇති නීතිමය රාමුවට අනුව ඔවුන්ගේ විදුලි උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම සහ ව්‍යාපාරය විකිණීම සිදු කිරීමට	1,200,000.00

		PUCSL විසින් විදුලිබල ක්ෂේත්‍රය නියාමනය කිරීම සඳහා බලපත්‍ර / නිදහස් නිකුත් කරනු ලැබේ.	සුදුසුකම් ලබයි.	
AP20**22/**LIC**/**RU/03	බෙදාහැරීමේ කාර්ය සාධන ප්‍රමිති නියාමනය ක්‍රියාත්මක කිරීම	2016 ගැසට් කරන ලද විදුලි බල (බෙදා හැරීමේ), කාර්ය සාධන ප්‍රමිති රෙගුලාසිවලට අනුව, එම රෙගුලාසියෙන් හඳුනා ගත් කාර්යයන් සමූහය ක්‍රියාත්මක කිරීමට බෙදා හැරීමේ බලපත්‍රලාභීන් අවශ්‍ය වේ. එම රෙගුලාසියේ ක්‍රියාත්මක කිරීමේ කොටස මූලික, අනුවර්තනය සහ ප්‍රායෝගික ලෙස හැඳින්වෙන අදියර තුනකින් සමන්විත වේ. 2022 වසර අවසන් වන විට අනුවර්තනය කිරීමේ අදියර ක්‍රියාත්මක කිරීම අවසන් කිරීමට සැලසුම් කර ඇත.	බෙදා හැරීමේ ජාලයේ බලශක්ති ගුණාත්මක භාවය සහ සැපයුම් ගුණාත්මකභාවය වැඩිදියුණු කෙරෙනු ඇත. බලශක්තියේ ගුණාත්මක භාවය සහ සැපයුමේ ගුණාත්මකභාවය සම්බන්ධ තොරතුරු ලබා ගත හැකිය.	0
AP/2022/LIC/RU/04	තොරතුරු බෙදා හැරීම (බෙදාහැරීමේ බලපත්‍රලාභී කාර්ය සාධන වාර්තා)	බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් ඉදිරිපත් කරන ලද දත්ත විශ්ලේෂණය කර ඔවුන්ගේ කාර්ය සාධනය පිළිබඳ කාර්තුමය වශයෙන් වාර්තා සකස් කිරීම.	පාර්ශවකරුවන් සඳහා තොරතුරු වෙත ප්‍රවේශය	0
AP/2022/LIC/RU/06	LISS පරිපාලනය (බලපත්‍රලාභී තොරතුරු ඉදිරිපත් කිරීමේ පද්ධතිය)	පද්ධතිය අධීක්ෂණය කිරීම සහ යාවත්කාලීන කිරීම පද්ධතිය හරහා සිදු කෙරේ.	පාර්ශවකරුවන් සඳහා තොරතුරු වෙත ප්‍රවේශය	0
AP/2022/LIC/RU/08	බෙදා හැරීමේ කේතය ක්‍රියාත්මක කිරීම	බෙදා හැරීමේ කේතයට අනුව, බෙදාහැරීමේ කේතයේ විෂය පථය යටතේ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් බෙදා හැරීමේ පද්ධතිය සම්බන්ධයෙන් විවිධ ගැටළු සාකච්ඡා කෙරෙන්නා වූ බෙදාහැරීමේ කේතය බලාත්මක කිරීමේ සහ සමාලෝචන මණ්ඩලයේ (DCERP) රැස්වීමක් පැවැත්වීම අවශ්‍ය වේ. සාකච්ඡා කරන ලද ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සම්බන්ධීකරණය කරනු ලැබේ.	වැඩි දියුණු කළ බලශක්ති ගුණාත්මක භාවය සහ බෙදා හැරීමේ ජාලයේ සැපයුම් ගුණාත්මකභාවය	0
AP/2022**/**RA**/**LIC**/**33	කෙටි කාලීන බලශක්ති ආරක්ෂාව පිළිබඳ වාර්තාව	විදුලි සැපයුමේ අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම සඳහා, විදුලි සැපයුම සඳහා කෙටි කාලීන අවදානම් හඳුනා ගැනීම සහ ඒවා අවම කිරීම සඳහා අදාළ ආයතනවලට උපදෙස් දීම වැදගත් වේ. මෙම බෙදා හැරීම හරහා පහත ක්‍රියාකාරකම් සිදු කිරීමට PUCSL සැලසුම් කරනු	විදුලි සැපයුම අඛණ්ඩ ව පවත්වාගෙන යාම සහතික කිරීම	0

		ලබයි; • සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන්ගේ බෙදා හැරීමේ පුරෝකථනයන්, පවතින ජලාශ මට්ටම් සහ ජලාශ මට්ටම්වල අතීත වෙනස්කම්, බලාගාරවල නඩත්තු සැලසුම්, ඉන්ධන සැපයුමේ යම් ගැටළු ආදිය සමාලෝචනය කර ඉදිරි මාස 6 තුළ ඇතිවිය හැකි අවදානම් හඳුනා ගැනීම. • හඳුනාගත් අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග යෝජනා කිරීම. • අදාළ බලධාරීන්ට උපදෙස් දීම (උදා. ලං.වි.ම., විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය ආදිය)		
AP/2022/RA/LIC/10	උත්පාදන සහ සම්ප්‍රේෂණ කාර්ය සාධන වාර්තා	පාර්ශවකරුවන් විසින් දැනුවත් තීරණ ගැනීම සඳහා උත්පාදනය සහ සම්ප්‍රේෂණ කාර්ය සාධනය ප්‍රකාශයට පත් කිරීම එම වාර්තා පහත පරිදි වේ; - දෛනික වාර්තා 365 - මාසික වාර්තා 12 - අර්ධ වාර්ෂික ජනන වාර්තා 2 - අර්ධ වාර්ෂික සම්ප්‍රේෂණ වාර්තා 2	තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීම සඳහා පාර්ශව කරුවන්ට තොරතුරු ලබා ගැනීමේ හැකියාව	0
AP/2022/RA/LIC/09	ජනන සැලැස්ම අනුමත කිරීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා නව බලාගාර යෝජනා සමාලෝචනය කිරීම	ශ්‍රී ලංකා විදුලිබල පනතේ 43 වැනි වගන්තියට අනුව, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා මූලික අනුමැතිය මෙන් ම ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් සහ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමෙන් නිර්දේශිත පුද්ගලයා සඳහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ. PUCSL විසින් නව බලාගාර ක්‍රියාත්මක කිරීම සඳහා වන යෝජනා අනුමැතිය සඳහා ඉදිරිපත් කරන විට සමාලෝචනය කර ඒ සඳහා කොමිෂන් සභාවේ තීරණය මෙම ක්‍රියාකාරකම හරහා ලබා දෙයි. PUCSL විසින් කාර්තුවකට වරක් ජනන සැලැස්ම ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරනු ඇත.	බලාගාර කාලානුරූප ව ක්‍රියාත්මක කිරීම මගින් බලශක්තිය සහ ධාරිතාව සඳහා වන සියලු ම ඉල්ලුම සපුරාලීම සහතික කිරීම අඩු ම මිල විදුලි බලාගාර තිබීම සහතික කිරීම	0

AP 20/CP/LIC/04	ආපදා කළමනාකරණ සැලසුම් - විදුලිබල අංශය	ස්වාභාවික හේතූන් නිසා හෝ මිනිසා විසින් සාදන ලද හේතූන් නිසා ඇති වන ව්‍යසනයකදී සහ ඉන් පසුව විදුලි සැපයුම නඩත්තු කිරීම සඳහා ජාතික මට්ටමේ සැලැස්මක් තිබීම අවශ්‍ය වේ. ආපදාවකදී සහ ඉන් පසුව, සේවාවන්හි අඛණ්ඩ පැවැත්ම මෙන් ම සම්පත් කාර්යක්ෂමව බෙදා හැරීම සහතික කිරීම සඳහා සැලැස්ම අවශ්‍ය වේ. ආපදා කළමනාකරණ සැලසුම් සකස් කළ යුත්තේ උපයෝගිතා සේවා සපයන්නන් විසිනි. ජාත්‍යන්තර හොඳම භාවිතයන්ගෙන් පැහැදිලි වන පරිදි, නියාමනය කරන ලද උපයෝගිතා මගින් ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා උපයෝගිතා නියාමකයින් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. එබැවින්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මග පෙන්වීම යටතේ, විදුලි කර්මාන්ත උපයෝගිතා මගින් ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීමට පහසුකම් සැලසීමේ සැලසුමක් මහජන උපයෝගිතා කොමිෂන් සභාව සතු ව ඇත.	විදුලි සැපයුමේ අඛණ්ඩතාව වැඩිදියුණු කිරීම (විශේෂයෙන් විපතකදී සහ පසුව)	10,000.00
AP/2020/CP/LIC/03	දිගු කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම	සැලසුම් කේතයේ සහ සම්ප්‍රේෂණ බලපත්‍රයේ අවශ්‍ය පරිදි, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් අනුමත අඩු වියදම් දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්මට අනුකූල ව, දීර්ඝ කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය වේ. කොමිෂන් සභාව විසින් එය සමාලෝචනය කර අනුමත කළ යුතු ය. ඉදිරි වසර 10 තුළ සම්ප්‍රේෂණ පද්ධතිය පුළුල් කිරීම සඳහා වන යෝජනා මෙම සැලැස්ම මගින් හඳුනා ගෙන ඇත. එබැවින්, සැපයුමේ ආරක්ෂාව, විශ්වසනීයත්වය මෙන් ම සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා ප්‍රමාණවත් සම්ප්‍රේෂණ ධාරිතාවක් පවතින බව සැලැස්ම මඟින් සහතික කිරීම අවශ්‍ය වේ. එසේ ම,	විදුලිය සැපයීමේ අඛණ්ඩ පැවැත්ම සහ බලශක්ති ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම	500,000.00

		ප්‍රාග්ධන පිරිවැය, මෙහෙයුම් වියදම් සහ නව වත්කම්වල ක්ෂයවීම් ගාස්තු හරහා පාරිභෝගිකයන් වෙත පැවරීමට අවශ්‍ය බැවින් සම්ප්‍රේෂණ සැලැස්ම අනුමත කිරීම ඉතා වැදගත් වේ.		
AP/2022/**RA**/LIC/34	සම්ප්‍රේෂණ කාර්ය සාධන ප්‍රමිති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම	ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව සකස් කරන ලද සම්ප්‍රේෂණ කාර්ය සාධන ප්‍රමිති රෙගුලාසි දැනටමත් ක්‍රියාත්මක වේ. සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා (TL) සහ කොමිෂන් සභාව විසින් එය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයක් රෙගුලාසිවලට ඇතුළත් වේ. එබැවින්, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා (TL) සමඟ එක් ව රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාවට නීතිමය අවශ්‍යතාවයක් ඇත. රෙගුලාසි හරහා, සම්ප්‍රේෂණ පද්ධති කාර්ය සාධනය කාලයත් සමඟ යාවත්කාලීන වන කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනීමෙන් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.	සම්ප්‍රේෂණ පද්ධතියේ පැන නගින බාධා කිරීම් සහ ගුණාත්මක ගැටළු අවම කිරීම හරහා විදුලි සැපයුමේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම.	5000.00

විදුලි කර්මාන්තය
02 වන ප්‍රතිඵලය
පාරිභෝගිකයින්ට දැරිය හැකි මිල සහ බලපත්‍රලාභීන් සඳහා තිරසාර මූල්‍ය ස්ථාවරත්වය

යොමු අංකය	ක්‍රියාකාරකමේ නම	ක්‍රියාකාරිත්වය පිළිබඳ විස්තරය	පාර්ශවකරුවන්ට ප්‍රතිලාභ	සෘජු පිරිවැය (රු.)
AP/2022/RA/CP/06	විදුලිය සඳහා විවෘත ප්‍රවේශය සහ මිල නියම කිරීම පිළිබඳ ප්‍රතිපත්ති උපදෙස්	දැනට භාවිතා කරන තනි ගැණුම්කරු වෙළඳපල ව්‍යුහය විදුලි ජනක යන්ත්‍ර අතර තරඟයක් ප්‍රවර්ධනය නොකරයි. එබැවින් තරඟකාරිත්වය වර්ධනය කරන නව මාදිලියක් හඳුන්වා දිය යුතු ය. මෙය ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධන විවෘත ප්‍රවේශයක් ලබා දෙනු ඇත. ප්‍රතිපත්ති උපදෙස් විෂය අමාත්‍යාංශයට ඉදිරිපත් කර නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පෙළඹෙනු ඇත.	තරඟකාරිත්වය සහ සාධාරණ මිලකරණය ප්‍රවර්ධනය කරනු ලබයි.	
AP22/CP/TEA/01	නිදහස් කරන ලද බෙදා හරින්නන් සඳහා මිල සීමාව ක්‍රමය	පවතින අනුමත ක්‍රමවේදය අතිශයින් සංකීර්ණ ය; සභාධිපත්‍ය පාරිභෝගිකයින්ගේ පැතිකඩ දත්ත අවශ්‍ය වන අතර කුඩා / මධ්‍යම	පාරිභෝගිකයින්ට වඩාත් සාධාරණ සහ අපක්ෂපාතී ගාස්තු ක්‍රමය	1,600,000

		පරිමාණයෙන් නිදහස් කරන ලද පාර්ශ්වයන්ට සම්පත් / දැනුම සැපයිය නොහැක. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ගාස්තු තීරණය කිරීමට/අනුමත කිරීමට කොමිෂන් සභාව සරල සාමාන්‍ය පිරිවැය (පෙර නිකුත් කරන ලද මාර්ගෝපදේශය මත පදනම් ව) භාවිතා කර ඇත. සරල කළ සාමාන්‍ය පිරිවැය ප්‍රවේශය සමඟ වුව ද, රට තුළ සිදුවෙමින් පවතින නාගරීකරණයත් සමඟ සහාධිපත්‍ය/ නිදහස් කරන ලද බෙදාහරින්නන් සංඛ්‍යාව වර්ධනය වෙමින් පවතී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එක් එක් නිදහස් කරන ලද බෙදා හරින්නන්ගේ ගාස්තු අනුමත කිරීමේ කාර්ය භාරය (සම්බන්ධ කිරීම, නිවැරදි කිරීම, අනුමත කිරීම, ප්‍රකාශනය කිරීම) වර්ධනය වන අතර එමඟින් පරිපාලනමය වශයෙන් අපහසු වේ. ඔවුන්ගේ මිල දී ගැනීමේ තීරුබදු කාණ්ඩය සහ අභ්‍යන්තර පාරිභෝගිකයින් වර්ගය අනුව (CEB/ LECO පාරිභෝගික ගාස්තු සංශෝධනය සමඟ සංශෝධිත) මිල සීමාවන් මාලාවක් සංවර්ධනය කිරීමෙන් නව සහාධිපත්‍ය සංවර්ධකයින්ට මෙන් ම කොමිෂන් සභාවට ද එක සේ පහසු වනු ඇත. නිදහස් කරන ලද බෙදා හරින්නන් විසින් දැනටමත් ඉදිරිපත් කර ඇති දත්ත මත පදනම් ව, ඕනෑ ම කෙනෙකුට ඔවුන්ගේ අදාළ මිල සීමාව ගණනය කළ හැකි වන පරිදි, ඔවුන්ගේ මිල දී ගැනීමේ (CEB/ LECO) ගාස්තු සහ අභ්‍යන්තර පාරිභෝගිකයින්ගේ වර්ග අනුව මිල සීමාවන් සමූහයක් ගණනය කර සූත්‍ර කට්ටලයක් ලෙස ප්‍රකාශයට පත් කෙරෙනු ඇත. එසේ ම, කොමිෂන් සභාව සමඟ අනුමත කිරීමේ ක්‍රියාවලියක් අනුගමනය කිරීම සඳහා මිල සීමාවන් සහ අනන්‍ය (ප්‍රමිතිගත මිල සීමාවන් යටතට නොපැමිණෙන පාර්ශ්වයන්) ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ තක්සේරු කිරීම සඳහා	නිදහස් කරන ලද පාර්ශ්වයන්හි ගාස්තු සැකසීමේ ක්‍රියාවලියේ දී වඩා හොඳ විනිවිද භාවය	

		මාර්ගෝපදේශ සංශෝධනය කරනු ලැබේ.		
AP22/CP/TEA/02	විදුලි බල ප්‍රවාහන විකල්ප (wheeling) සහ විදුලි බල ප්‍රවාහන ගාස්තු පිළිබඳ අධ්‍යයනය කිරීම	විදුලිබල උත්පාදන කර්මාන්තයට පුද්ගලික අංශයේ ආයෝජන ආකර්ශනය කර ගැනීමේ මෙවලමක් ලෙස power wheeling සඳහා අවසර දීම භාවිතා කරන අතර විශේෂයෙන් ඉන්දියාව වැනි රටවල් මෙම පියවරෙන් විශාල සාර්ථකත්වයක් ලබා ඇත. අලුතින් නිකුත් කර ඇති ප්‍රතිපත්ති ඉලක්කය වනුයේ 2030 වන විට 70% ක පුනර්ජනනීය බලශක්තිය සාක්ෂාත් කර ගැනීම වන අතර සපුරාලීමට බොහෝ ක්‍රියාමාර්ග අවශ්‍ය වන මෙය දැඩි ඉලක්කයකි. එවැනි විකල්ප සඳහා අදාළ වන wheeling ගාස්තු (සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ ගාස්තු) සමඟ ශ්‍රී ලංකාව සඳහා සුදුසු wheeling විකල්පයක් සැකසීම සඳහා ජාත්‍යන්තර සැසඳීම හරහා අධ්‍යයනයක් සිදු කරනු ලැබේ. මෙම ක්‍රියාකාරකමේ දී, ජාත්‍යන්තර සංසන්දනාත්මක අධ්‍යයනයක් සහ ශ්‍රී ලංකාවට ඒවායේ යෝග්‍යතාවය විශ්ලේෂණය කර, wheeling ගාස්තු සැකසීමට ගෙන ඇති ප්‍රවේශයන් විශ්ලේෂණය කර, wheeling ගාස්තු සඳහා ශ්‍රී ලංකාව සඳහා වන නිර්දේශ සාරාංශ කරනු ඇත.	අඩු කරන ලද උත්පාදන පිරිවැය හරහා පාරිභෝගිකයින්ට වඩාත් සාධාරණ සහ අපක්ෂපාති බදු සහ ගාස්තු පුනර්ජනනීය බලශක්තිය සඳහා නියම කර ඇති ප්‍රතිපත්ති ඉලක්ක සපුරා ගැනීම	0
AP22/CP/TEA/03	ස්ථාවර ගාස්තු සංවර්ධනය	බැටරි ගබඩා පද්ධතිවල (ගෘහස්ථ පරිමාණයෙන් සහ වාණිජ පරිමාණයෙන්) දිනෙන් දින අඩු වන පිරිවැයත් සමඟ, පාරිභෝගිකයින්ට පුනර්ජනනීය හෝ ස්වාභාවික වායු මත පදනම් වූ උත්පාදනය සමඟ ජාලයෙන් සම්පූර්ණයෙන් ම හුදකලා ක්‍රියාකාරිත්වය තෝරා ගත හැකි අතර ස්ථාවර සැපයුමක් ලෙස ජාලකය භාවිතා කළ හැකි ය. ඒවා Vehicle-To-Grid පද්ධති (විදුලි වාහන බැටරි සමඟ) සමඟ පවා පරිපූරක විය හැක. මෙය විශ්වසනීයත්වය / බලයේ ගුණාත්මක ගැටළු, පිරිවැය ගැටළු හෝ වෙනත් හරිත විශ්වාස හේතූන්	පාරිභෝගිකයින්ට වඩාත් සාධාරණ සහ අපක්ෂපාති බදු සහ ගාස්තු	0

		නිසා විය හැක. ඔවුන් විදුලිබල පද්ධතියෙන් කිසිදු ශක්තියක් මිලට නොගෙන හෝ සූර්ය බලශක්ති උත්පාදනය සමඟින් (ශ්‍රී ලංකාව දැනටමත් දිවා කාලයේ උපරිමයක් ඇත) (ශ්‍රී ලංකාව තුළ ගබඩා කිරීමකින් තොරව ශුද්ධ මැනීමේ දී, යනාදී වශයෙන්) ඉදිරියට ගමන් කළහොත් පවතින ගාස්තු ව්‍යුහය මගින් වෙනත් පාරිභෝගිකයින් සඳහා එය මිල අධික වනු ඇත (ස්ථීර පාරිභෝගිකයින් විසින් ගෙවනු ලබන්නේ මසකට/රු: 30 ගෘහයන් සඳහා පමණි) ස්ථාවර සැපයුම සඳහා සුදුසු බදු විකල්පයක් සැකසීම සඳහා ජාත්‍යන්තර සංසන්දනය හරහා අධ්‍යයනයක් සිදු කරනු ලබන අතර ස්ථාවර ගාස්තු සඳහා ශ්‍රී ලංකාව සඳහා නිර්දේශ ඉදිරිපත් කරනු ඇත.		
AP22/CP/TEA/04	දුම්රිය මාර්ග සඳහා ගාස්තු සකස් කිරීම	ප්‍රවාහන පද්ධතියේ විද්‍යුත්කරණය නුදුරු අනාගතයේ දී අත්‍යවශ්‍ය සහ නො වැළැක්විය හැකි වන අතර එබැවින් පවතින භාර පැතිකඩට (existing load profile.) අනුපූරක වන එහි අද්විතීය භාර පැතිකඩ (unique load profile) සලකා බලා විශේෂ ගාස්තුවක් අවශ්‍ය විය හැකි ය. ශ්‍රී ලංකාව සඳහා සුදුසු දුම්රිය ප්‍රකර්ෂණ ගාස්තුවක් සකස් කිරීම සඳහා ජාත්‍යන්තර සංසන්දනය හරහා අධ්‍යයනයක් සිදු කර ගාස්තු ගණනය කිරීමක් යෝජනා කරනු ලබන අතර එය ශක්‍යතා අධ්‍යයනයන් සඳහා යොදා ගත හැකි ය.	පාරිභෝගිකයින්ට සහ ප්‍රවාහනයට වඩා සාධාරණ සහ අපක්ෂපාති බදු සහ ගාස්තු	0
AP22/CP/TEA/05	EV ආරෝපණ ස්ථාන සඳහා මිල සීමාවන් පිළිබඳ අධ්‍යයනය	විදුලිබල මණ්ඩලය සතු විදුලි වාහන ආරෝපණ මධ්‍යස්ථාන (EVCS) ගාස්තු කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත. පුද්ගලික අයිතිකරුවන්ට විදුලිය විකිණීම සඳහා බලපත්‍රයක් / නිදහස් කිරීමක් තවමත් ලැබී නොමැති අතර එම නිසා ඔවුන්ගේ ගාස්තු නියාමනය කර නොමැත. විදුලි වාහන ආරෝපණ මධ්‍යස්ථානයන්හි (EVCS හි)	පාරිභෝගිකයින්ට සහ EVCS ක්‍රියාකරුවන්ට වඩාත් සාධාරණ සහ අපක්ෂපාති බදු සහ ගාස්තු	0

		පවතින විවිධ ආකාරයේ අයකිරීම් සඳහා අදාළ වන මිල සීමාවන් / බදු තීරණය කිරීම සඳහා අධ්‍යයනයක් පවත්වනු ලැබේ; උදා. socket out lets සැපයීම, මන්දගාමී ආරෝපණය, DC වේගවත් ආරෝපණය, ආදිය		
AP22/CP/TEA/06	විදුලි කර්මාන්තයේ Forex නිරාවරණය පිළිබඳ අධ්‍යයනය	විදුලි උත්පාදනය සඳහා භාවිතා කරන ප්‍රාථමික ශක්තියෙන් 50% කට වඩා ආනයනය කිරීම සහ පුද්ගලික තාප බලාගාර සඳහා ධාරිතා ගෙවීම් බොහෝමයක් USD/Euro මත සිදු කිරීම නිසා කර්මාන්තයේ විදේශ මුදල් නිරාවරණය තරමක් ඉහළ මට්ටමක පවතින අතර එමඟින් පාරිභෝගිකයා එහි ඍණාත්මක තත්ත්වයට නිරාවරණය වේ.. 2023-2030 කාලය තුළ කර්මාන්තයේ විදේශ විනිමය නිරාවරණය ගණනය කිරීම සහ ප්‍රක්ෂේපණය කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කරනු ලැබේ. එසේම, මෙම කාරණය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය උපදෙස් සැපයීම සඳහා විවිධ ජනන මිශ්‍රණය සහ ඉල්ලුම වර්ධන අවස්ථා සඳහා විදුලි ගාස්තු පිළිබඳ එහි ඇඟවුම් විශ්ලේෂණය කරනු ඇත.	අඩු ජනන පිරිවැය සහ විදේශ විනිමය නිරාවරණය අඩු වුවද පාරිභෝගිකයින්ට වඩාත් සාධාරණ සහ අපක්ෂපාති බදු සහ ගාස්තු	0
AP22/CP/TEA/07	උපයෝගිතා මූල්‍ය තත්ත්වය සහ ව්‍යාපාර ආදර්ශ අධ්‍යයනය	2016 වසරේ සිට ලංවිම මූල්‍ය තත්ත්වය පිරිහෙමින් පවතින අතර එම නිසා කෙටි කාලීන ණය ගැනීම්වලින් ඔබ්බට නැවත සිතා බැලීම සහ නැවත නැගී සිටීම සඳහා බදු වැඩි කිරීම අවශ්‍ය වේ. ලංවිම මූල්‍ය දුර්වලතා වලට මූලික හේතූන් විග්‍රහ කිරීම සඳහා මූල්‍යකරණය පිලිබඳ විශේෂඥයෙකුගේ අධ්‍යයනයක් සහ ලං.වි.ම. විසින් දැනටමත් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යයනයක් සිදු කරනු ඇත. ලං.වි.ම. මූල්‍ය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග නිර්දේශ කිරීමට මෙම විශේෂඥයා අවශ්‍ය වනු ඇත.	ජාල වැඩිදියුණු කිරීම් ආදිය සඳහා නියමිත වේලාවට ආයෝජනය කිරීමට ලංවිම මූල්‍යමය වශයෙන් ශක්තිමත් වන බැවින් විදුලි බල මණ්ඩලයේ ශක්‍යතාව මඟින් පාරිභෝගිකයින්ට අඩු ගාස්තු සහ වැඩි දියුණු කළ විශ්වසනීයත්වය අනුව ප්‍රතිලාභ ලබා දෙනු ඇත.	3,000,000
AP20/CP/TEA/12A	භාවිතයට නොගත් බලශක්ති පිරිවැය ඇස්තමේන්තු සඳහා	කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ජනන සැලසුම් කේතය මඟින් භාවිතයට නොගත්	භාවිත නොකළ බලශක්තියේ සැබෑ පිරිවැය	1,230,000

	පර්යේෂණ	බලශක්ති පිරිවැය (ENS) අර්ථ දක්වා ඇති අතර එම අගය විද්‍යාත්මකව සකසා නොමැත. භාවිතයට නොගත් බලශක්ති පිරිවැයෙහි පිරිවැය ස්ථාපිත කිරීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලය සමඟ සහයෝගයෙන් පර්යේෂණ කිරීම සහ නිතිපතා යාවත්කාලීන කිරීමට ක්‍රමයක් යෝජනා කිරීම. මෙම පර්යේෂණය 2022 අවසානය වන විට අවසන් කිරීමට බලාපොරොත්තු වන අතර ඉන් අනතුරු ව, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගේ ජාල ක්ෂේත්‍ර/ සංවර්ධන සැලසුම් සඳහා අවශ්‍ය සංශෝධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කරනු ඇත.	සැලකිල්ලට ගනිමින් ප්‍රශස්ත ජනන සැලසුම් (ආර්ථිකය විසින් ඉල්ලා සිටින විශ්වාසනීයතා මට්ටම් සැපයීම)	
AP22/RU/TEA/01	2023 සඳහා ගොනු කළ අවසර ලත් ගාස්තු පිළිබඳ සමාලෝචනය	කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ගාස්තු සඳහා පිරිවැය පරාවර්තක ක්‍රමවේදයට අනුව, ලං.වි.මි. සහ LECO විසින් ගොනු කරන ලද චෝදනා ඉදිරිපත් කිරීම් සමාලෝචනය කිරීම. PUCSL විසින්, එක් එක් බලපත්‍රලාභියා විසින් ඉදිරිපත් කරන ලද අවසර ලත් ගාස්තු යෝජනාව, මිල ලැයිස්තුව සහ ගණනය කිරීම් සමාලෝචනය කරනු ඇත. පෙර වසර සමඟ ගාස්තු සංසන්දනය කිරීම සහ විචලනය විශ්ලේෂණය කිරීම අවශ්‍ය නම් බලපත්‍රලාභීන්ගෙන් පැහැදිලි කිරීම් ලබා ගැනීම. ගාස්තු සමාලෝචනය කර අනුමත කිරීම. අනුමත ගාස්තු අදාළ බෙදාහැරීමේ බලපත්‍රලාභියා වෙත යවනු ලැබේ.	නව සම්බන්ධතා සඳහා සාධාරණ සහ අපක්ෂපාති ගාස්තු	0
AP22/RU/TEA/02	කුඩා බෙදා හරින්නාගේ ගාස්තු සමාලෝචනය	බෙදා හැරීමේ සහ සැපයුම් බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති කුඩා බෙදාහරින්නන් නිදහස් කිරීමේ නියෝගය යටතේ තම පරිශ්‍රයේ බෙදා හරින විදුලිය සඳහා අය කිරීමට පෙර කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා බදු යෝජනාවක් ඉදිරිපත් කළ යුතු ය. ක්‍රියාකාරකමේදී පහත පියවරයන් සිදු කරනු ලැබේ. කොමිෂන් සභාවේ අනුමත ක්‍රමවේදයට අනුකූල ව බදු	සභාධිපත්‍ය පාරිභෝගිකයින් සහ ක්‍රියාකරුවන් සඳහා සාධාරණ සහ අපක්ෂපාති ගාස්තු	0

		යෝජනා සමාලෝචනය. අවශ්‍ය අවස්ථාවල දී පාර්ශ්වයන්ගෙන් පැහැදිලි කිරීම් ලබා ගැනීම සහ අවශ්‍ය නම් සමාලෝචනය කර නැවත ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීම. සමාලෝචනය කරන ලද ගාස්තු යෝජනා අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම කුඩා බෙදාහරින්නන් වෙත එයම සන්නිවේදනය කිරීම.		
AP22/RU/TEA/03	තොග සැපයුම් ගාස්තු, UNT සහ පරිශීලක ගාස්තු සමාලෝචනය	මෙය සාමාන්‍ය කාර්යයකි. මෙම ක්‍රියාකාරකම හරහා පහත ක්‍රියාකාරකම් සිදු කරනු ඇත. අවසර ලත් ආදායම් වාර්ෂිකව අනුමත කළ යුතු ය. තොග සැපයුම් ගාස්තු සහ පරිශීලක ගාස්තු අර්ධ වාර්ෂිකව සංශෝධනය කළ යුතු ය. ඒකාකාරී ජාතික ගාස්තු ගැලපීම කාර්තුමය වශයෙන් සිදු කළ යුතු ය.	පාරිභෝගිකයින් සඳහා සාධාරණ සහ අපක්ෂපාති ගාස්තු සහ බලපත්‍රලාභීන් සඳහා ආදායම් සහතික කිරීම	750,000
AP22/RU/TEA/04	දත්ත සහ දත්ත විශ්ලේෂණය	උත්පාදන, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් ඉදිරිපත් කරන ලද දත්ත විශ්ලේෂණය කර ඔවුන්ගේ කාර්ය සාධනය පිළිබඳ වාර්තාවක් සකස් කිරීම (ජනන පිරිවැය විශ්ලේෂණ වාර්තාව - කාර්තුමය වාර්තාව විදුලි විකුණුම් විශ්ලේෂණ වාර්තාව - අපේක්ෂිත විකුණුම් සහ සත්‍ය විකුණුම් - කාර්තුමය වාර්තාව සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ආයෝජන විශ්ලේෂණ වාර්තාව - වාර්ෂික වාර්තාව)	විනිවිදභාවය	0
AP22/INS/RU/08	බලපත්‍රලාභීන්ගේ විදුලි සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ ක්‍රමය හරහා නීති විරෝධී ලෙස විදුලිය ලබා ගන්නා හෝ භාවිතා කරන පුද්ගලයින්ට එරෙහිව නඩු පැවරීම සඳහා අනුමැතිය ඇගයීම.	2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ 48 (4) උප වගන්තියට අනුව (සංශෝධිත පරිදි) එම පනත යටතේ වරදක් සම්බන්ධයෙන් කොමිසමේ ලිඛිත අවසරය ඇති ව හැර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීම සිදු නොකළ යුතු ය. එබැවින්, මෙම ක්‍රියාකාරකමේ අරමුණ වන්නේ බලපත්‍රලාභීන් විසින් ඉදිරිපත් කරන ලද අවසර අයදුම්පත් ඇගයීම සහ නිර්දේශ සැපයීම ය (විදුලි සම්ප්‍රේෂණය සහ බලපත්‍රලාභීන්ගේ බෙදා හැරීමේ	අනවසරයෙන් විදුලිය ලබා ගැනීම අඩු කිරීම	-

		ක්‍රමය හරහා නීති විරෝධී ලෙස විදුලිය ලබා ගන්නා හෝ භාවිතා කරන පුද්ගලයින්ට නඩු පැවරීම සඳහා). PUCSL වෙත ලැබී ඇති සම්බාධක අයදුම්පත් කාලෝචිත ලෙස ඇගයීමට ලක් කර නිර්දේශ සැපයීමට PUCSL සැලසුම් කරනු ලබයි.		
AP22/RU/EER/31	පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සම්බන්ධ තොරතුරු බෙදා හැරීම	2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 17 (ඈ) වගන්තියට අනුව මෙම ක්‍රියාකාරකම සඳහා ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ලබා දී ඇත. පුනර්ජනනීය බලශක්ති උත්පාදන දත්ත එක්රැස් කිරීම, ඒවා විශ්ලේෂණය කිරීම සහ මහජනතාව වෙත තොරතුරු බෙදා හැරීම 2022 වසර පුරා සිදු කෙරෙනු ඇත.	සත්‍ය උත්පාදන දත්ත වෙත පාර්ශවකරුවන්ට පහසු ප්‍රවේශය.	0
AP/20**2**2**/**CP**/**LIC**/**04	ශ්‍රී ලංකාවේ IPP වෙතින් අනුබද්ධ සේවා ලබා ගැනීමේ හැකියාව පිළිබඳව අධ්‍යයනය කිරීම	අනුබද්ධ සේවාවන් සංඛ්‍යාත පාලන සහායක සේවා, ජාල පාලන සහායක සේවා සහ පද්ධති යළි-ආරම්භක සහායක සේවා ලෙස පුළුල් ලෙස වර්ග කළ හැක. මේ වන විට, ප්‍රධාන වශයෙන් බලාගාර භාවිතා කරමින් අතිරේක සේවාවන් සපයනු ලබන්නේ ලං.වි.ම. විසිනි. නව බලාගාර බොහොමයක් (එවැනි සේවාවන් සැපයීමට හැකියාව ඇති ස්වභාවික වායුවෙන් ක්‍රියාත්මක වන ඒකාබද්ධ චක්‍ර බලාගාර වැනි) ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. එවැනි අතිරේක සේවාවන් මෙම බලාගාරවලින් ආර්ථික වශයෙන් ලබා ගත හැකි ය. IPP සතු බලාගාරවලින් අනුබද්ධ සේවා ප්‍රසම්පාදනය කිරීම සඳහා මෙම සේවාවන් වඩාත් ප්‍රවේශමෙන් නිර්වචනය කිරීම, මැනීම සහ ගෙවීම සඳහා ක්‍රම අවශ්‍ය වේ. IPP වෙතින් අනුබද්ධ සේවා ප්‍රසම්පාදන හඳුන්වාදීමේ ජාත්‍යන්තර පරිවයන් හරහා එය ශ්‍රී ලංකාවේ යොදා ගත හැකි ආකාරය හඳුනා ගැනීමට සමාලෝචනය කෙරෙනු ඇත.	පාරිභෝගිකයින්ට සපයනු ලබන විදුලි පිරිවැය අඩු කිරීම	0

AP/2022/**RA**/**LIC**/13	දත්ත විශ්ලේෂණ වාර්තා	PUCSL මෙම ක්‍රියාකාරකම හරහා බෙදා හැරීමේ රටා සහ අවම පිරිවැය මූලධර්මය උල්ලංඝනය කිරීම් ආදිය හඳුනා ගෙන පහත වාර්තා සකස් කිරීම සඳහා දිනපතා සහ මාසික පදනම්න් විදුලිය යැවීමේ දත්ත විශ්ලේෂණය කරනු ලබයි. • දෛනික විචල්‍යතා වාර්තාව, පූර්ව පුරෝකථනය (වාර්තා 365) සමඟ සැබෑ බෙදා හැරීම් සැසඳීම • මාසයට පෙර යැවෙන පුරෝකථනය සමඟ සත්‍ය බෙදා හැරීම සංසන්දනය කරන මාසික වාර්තාවක් සහ කුසලතා අනුපිළිවෙල මත බලාගාර බෙදා හැරීමේ රටා හඳුනා ගැනීම.	අවම පිරිවැයකින් බලාගාර බෙදා හැරීම සහතික කිරීම හරහා විදුලි පිරිවැය අවම කිරීම	0

විදුලි බල කර්මාන්තය
03 වන ප්‍රතිඵලය
03 වන ප්‍රතිඵලය - මහජනතාවගේ, බලපත්‍රලාභීන්ගේ සහ මෙහෙයුම්කරුවන්ගේ දේපල සහ සෑම ජීවියෙකු සඳහා ම ඉහල ආරක්ෂාවක් වැඩි දියුණු කිරීම

යොමු අංකය	ක්‍රියාකාරකමේ නම	ක්‍රියාකාරිත්වය පිළිබඳ විස්තරය	පාර්ශවකරුවන්ට ප්‍රතිලාභ	ඍජු පිරිවැය (රු.)
AP22/INS/CP/02	සාමාන්‍ය ජනතාව සඳහා MV රැහැන් කොරිඩෝව පිළිබඳ තොරතුරු සඳහා ප්‍රවේශවීමේ හැකියාව ලබා දීම	MV (මධ්‍යම වෝල්ටීයතාවය) (11kV සහ 33kV) රේඛීය වේදිකාවල නියමිත අවම ආරක්ෂිත නිෂ්කාශන සහතික කිරීම සාමාන්‍ය ජනතාවගේ ජීවිත හා දේපළවල ආරක්ෂාව සහ බලපත්‍රලාභීන්ගේ පද්ධති විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේදී වැදගත් වේ. දැනට පවතින සහ යෝජිත	සාමාන්‍ය ජනතාවගේ ජීවිත හා දේපළවල ආරක්ෂාව සහ බලපත්‍රලාභීන්ගේ පද්ධති විශ්වසනීයත්වය වැඩිදියුණු කෙරේ.	10,000

		(සැලසුම් කර ක්‍රියාත්මක වෙමින් පවතින) MV මාර්ගවල භූගෝලීය තොරතුරු දැනට සාමාන්‍ය ජනතාවට ලබා ගත නොහැක. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් සකස් කරන ලද ශ්‍රී ලංකාවේ දැනට පවතින භූගෝලීය තොරතුරු සිතියමට (Geoportal) MV රැහැන් වේදිකාවේ භූගෝලීය තොරතුරු ඇතුළත් නව ස්ථරයක් ඇතුළත් කිරීමට යෝජනා කෙරේ. MV රේඛීය වේදිකා තොරතුරු සඳහා වැඩි දියුණු කළ ප්‍රවේශ්‍යතාව හරහා, පවතින සහ යෝජිත MV මාර්ග වේදිකා අසල නව ඉදිකිරීම් සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී සාමාන්‍ය ජනතාවගේ ජීවිත සහ දේපළවල ආරක්ෂාව සහ බලපත්‍රලාභීන්ගේ පද්ධති විශ්වසනීයත්වය සහතික කරමින් රේඛීය නිෂ්කාශන පවත්වා ගැනීමට පූර්වාරක්ෂාකාරී ක්‍රියාමාර්ග ගැනීමට සාමාන්‍ය ජනතාවට හැකි වේ.		
AP22/INS/CP/04	කුඩා ජල විදුලි බලාගාරවල (බලපත්‍රලාභීන්) පරීක්ෂණ පැවැත්වීම.	2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ 6(අ) වගන්තියට අනුව බලපත්‍රයකින් බලයලත් පුද්ගලයන්ගේ විදුලි බලාගාර පරීක්ෂා කිරීමට විදුලි පරීක්ෂකවරුන් අවශ්‍ය වේ. තව ද, ඒවා කාර්යක්ෂමව සහ විශ්වාසනීය ලෙස ක්‍රියාත්මක වන බවට බලපත්‍ර කොන්දේසි සමග අනුකූලතා අධීක්ෂණය සිදු කිරීම අවශ්‍ය වේ. එබැවින්, ජනන බලපත්‍රලාභීන්ගේ ස්ථාන පරීක්ෂා කිරීම අවශ්‍ය වේ. පරීක්ෂා කිරීම් මඟින් පහත සඳහන් අංශ ආවරණය කරනු ඇත. ජනන බලාගාරය සහ අදාළ ව්‍යුහයන් ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සහ බලාගාරයේ ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා ගෙන ඇති පියවර කාර්යක්ෂම, විශ්වාසදායක සහ ආරක්ෂිත වේ. • වාර්තා තබා ගැනීම සහ	බලපත්‍ර කොන්දේසි වලට අනුකූල වීම තහවුරු කිරීම.	3,300,000

		ලේඛනගත කිරීම • නඩත්තු පිළිවෙත් • ආරක්ෂිත ක්‍රියා පටිපාටි • O & M කාර්ය මණ්ඩලයේ සුදුසුකම් සහ වගකීම්, •පරීක්ෂණ සහ පරීක්ෂණ උපකරණ • බලාගාර විදුලි උත්පාදන කාර්ය සාධනය සහ අධීක්ෂණය • පාරිසරික කාර්ය සාධනය •සෞඛ්‍යය සහ ආරක්ෂාව		
AP22/INS/RU/01	විදුලිය බෙදා හැරීම සහ සැපයීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති පාර්ශ්වයන්ගේ පරිශ්‍රවල පරීක්ෂණ පැවැත්වීම	නිදහස් කරන ලද පාර්ශ්වයේ විදුලිය බෙදා හැරීමේ පද්ධතිය බලපත්‍ර කොන්දේසි සමඟ අනුකූලදැයි පරීක්ෂා කිරීම් හරහා පරීක්ෂා කිරීම සහ තහවුරු කිරීම. මෙම ක්‍රියාකාරකම හරහා පහත ක්‍රියාකාරකම් සිදු කරනු ඇත; - විදුලිය බෙදා හැරීම සහ සැපයීම සඳහා බලපත්‍රය ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති පාර්ශ්වයන්ගේ පරිශ්‍රවල පරීක්ෂණ පැවැත්වීම - හඳුනාගත් ගැටළු සහ අනුකූල නොවන ප්‍රදේශ සමඟ පරීක්ෂණ වාර්තා සකස් කිරීම - අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා පරීක්ෂණ වාර්තා බලපත්‍ර අංශය වෙත යොමු කිරීම	නිදහස් කරන ලද පාර්ශ්වවලින් විදුලිය ලබා ගන්නා පාරිභෝගිකයින්ගේ ආරක්ෂාව තහවුරු කරන අතර ඔවුන්ගේ පාරිභෝගික අයිතීන් සුරැකීම සහතික කෙරේ.	200,000
AP22/INS/RU/02	IRS (සිදුවීම් වාර්තා කිරීමේ පද්ධතිය) රෝහල් දක්වා ව්‍යාප්ත කිරීම	මේ වන විට PUCSL වෙත විදුලි සැර වැදීම පිළිබඳ තොරතුරු පොලිසියෙන් ලැබේ. කෙසේ වෙතත්, විදුලි අනතුරු හෝ හදිසි අනතුරු සම්බන්ධ තොරතුරු මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත තවමත් වාර්තා කිරීමට නියමිත ය. එබැවින්, එම අවස්ථා පිළිබඳ එවැනි තොරතුරු ලබා ගැනීම සුදුසු විදුලි සැර වැලැක්වීමේ පියවරයන් සඳහා තුඩු දෙන මූල හේතු තක්සේරු කිරීමට ප්‍රයෝජනවත් වේ. තව ද, ගිණුම්කරණ පිරිවැය පමණක් නොව රටට ආර්ථික බරද විශ්ලේෂණය කිරීමට මෙම තොරතුරු අවශ්‍ය වේ. සිදුවීම් වාර්තා කිරීමේ පද්ධතිය පුළුල් කිරීම මඟින් වාර්තා වූ ආසන්න අතපසුවීම් සහ සිදුවීම්වල මූල හේතු හඳුනා ගැනීමට හැකියාව ලැබේ. මේ අතර, සෞඛ්‍ය සේවාවන්ට	මූල-හේතු විශ්ලේෂණය සහ අවම කිරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කරමින්, විදුලිය සම්බන්ධ සිදුවීම් සහ අනතුරු තත්‍ය කාලීන ව වාර්තා කිරීමට සෞඛ්‍ය අංශයට ලබා දී ඇති අවස්ථාව තුළින් මහජන ආරක්ෂාව සහතික කෙරේ.	500,000

		මෙම වාර්තාකරණයේ නියැලීමට ඉඩ සැලසීම, නියමිත වේලාවට ආසන්න වන අනතුරු අවම කිරීම සඳහා එවැනි මූල හේතු හඳුනා ගැනීමේ වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ක්‍රමය වනු ඇත. මෙමගින් හරයට ඇති මූල හේතු හඳුනා ගෙන ඇති බැවින් විදුලි සැර වැදීමේ සංඛ්‍යාව අඩු කිරීමට හේතු වේ.		
AP22/INS/RU/03	පාරිභෝගිකයින්ගේ ඉල්ලීම මත හෝ කොමිෂන් සභාවේ නියෝග මත පරීක්ෂණ පැවැත්වීම, විදුලි රැහැන් හෝ බලාගාර පරීක්ෂා කිරීම හෝ විදුලිය සැපයීම.	ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ සකස් කර ඇති ප්‍රතිපාදන, රෙගුලාසි හෝ රීති උල්ලංඝනය කිරීම මත පැන නගින පරීක්ෂණ පැවැත්වීම. කොමිෂන් සභාව විසින් නියම කරන ලද පරිදි අදාළ බලපත්‍රලාභීන්ගේ සහභාගිවන්නන් , පාරිභෝගිකයින් සහ බාහිර පාර්ශ්වයන් සහභාගිවන්නන් විදුලි ව්‍යාපාරයට අදාළ ආරවුල් සහ පැමිණිලි පරීක්ෂා කිරීම සහ විභාග කිරීම මෙම ක්‍රියාකාරකම මඟින් ආවරණය වනු ඇත. SLEA යටතේ එහි සම්පාදනය කරන ලද අදාළ සංග්‍රහ, රෙගුලාසි සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව නිර්දේශ සහ තීරණ ලබා දීම.	PUCSL විසින් සිදු කරනු ලබන පරීක්ෂණ හරහා සම්බන්ධ වූ අදාළ පාර්ශව කරුවන්ට ස්වාධීන / අපක්ෂපාතී නිර්දේශ ලැබෙනු ඇත.	350,000
AP22/INS/RU/04	බලපත්‍රලාභීන් අතර ආරක්ෂිත සහ තාක්ෂණික කළමනාකරණ සැලැස්ම (STMP) සහ ආරක්ෂිත කාර්ය සාධනය ක්‍රියාත්මක කිරීම	ආරක්ෂාව සහ තාක්ෂණික කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම, ආරක්ෂක විගණකවරුන් පත් කිරීම සහ කාලානුරූප වාර්තාකරණ යාන්ත්‍රණය සහ ප්‍රතිපෝෂණ සහ මිණුම් සලකුණු හරහා අඛණ්ඩ ව වැඩිදියුණු කිරීම. අවසාන වශයෙන්, බලපත්‍රලාභීන්ව ආරක්ෂක දර්ශක ඉදිරියේ තක්සේරු කර ඇගයීමට ලක් කරනු ලබන අතර ඔවුන්ගේ ආරක්ෂිත කාර්ය සාධනය මත පදනම් ව ශ්‍රේණිගත කරනු ලැබේ. මෙම ක්‍රියාකාරකම මඟින් ශ්‍රී ලංකා විදුලිබල පනත, ආරක්ෂක රෙගුලාසි යටතේ සාදන ලද අදාළ සංග්‍රහ, රෙගුලාසි සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල ව නිර්දේශ සහ තීරණ	STMP සහ දර්ශක භාවිතයෙන් 'ආරක්ෂාව' සම්බන්ධයෙන් බලපත්‍රලාභියාගේ සමස්ත කාර්ය සාධනය අධීක්ෂණය කර මනිනු ලැබේ.	1,000,000

		ලබා දීමේ කාර්යයන් ඉටු කරනු ඇත.		
AP22/INS/RU/05	මහජන දැනුවත් කිරීමේ වැඩසටහන	මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සිදු කරන ලද පසුගිය විදුලිසැර විශ්ලේෂණවලට අනුව විදුලි අනතුරු විශාල ප්‍රමාණයක් සිදුවී ඇත්තේ විදුලිය අනතුර පිළිබඳව ජනතාව නොදැනුවත්කම හේතුවෙනි. එමෙන්ම පසුගිය වසර කිහිපය තුළ දීප ව්‍යාප්තව පවත්වන ලද ගෙයින් ගෙට යාමේ ව්‍යාපාරය සහ විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් විදුලි ආරක්ෂණ ක්‍රම පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ මට්ටම ඉතා දුර්වල මට්ටමක පවතින බව හඳුනා ගන්නා ලදී. එබැවින් ආරක්ෂිත ව විදුලිය භාවිත කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මෙම ක්‍රියාකාරකමේ ප්‍රධාන අරමුණයි. මහජන උපයෝගිතා කොමිසමේ පණිවිඩ ජනතාව වෙත ලබා දීමේ දී ඉතා වැදගත් සම්පතක් ලෙස බලපත්‍රලාභී විදුලි කාර්මිකයන් හඳුනාගත හැකි ය. එබැවින් බලපත්‍රලාභී විදුලි කාර්මිකයන් හරහා විදුලිය සහ විදුලි පාරිභෝගික අයිතීන් හා බැඳීම් සුරක්ෂිතව භාවිත කිරීම සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමට කොමිෂන් සභාව අපේක්ෂා කරයි. එබැවින් මෙම කාර්යය හරහා දැනුවත් කිරීම සම්බන්ධ කටයුතු සිදු කරනු ලැබේ.	විදුලිය හා විදුලිය පරිභෝගික අයිතීන් හා බැඳීම් සුරක්ෂිතව භාවිත කිරීම පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ මට්ටම ඉහළ නංවා ඇත.	1,800,000
AP22/INS/RU/06	විදුලි සැර අවම කිරීම සහ විද්‍යුත් විච්ඡේදනය විශ්ලේෂණය	මෙම ක්‍රියාකාරකම හරහා පහත වාර්තා ලබා දෙනු ඇත; මාසික විදුලි කම්පන වාර්තා කාර්තුමය විදුලි කම්පන වාර්තා	විදුලි අනතුරු අවම කිරීම	240,000
AP22/INS/RU/07	විදුලි කාර්මික බලපත්‍ර රාමුව ක්‍රියාත්මක කිරීම සහ විදුලි ආරක්ෂණ ජාලයට විදුලි කාර්මිකයන් ප්‍රේරණය කිරීම	දැනට ශ්‍රී ලංකාවේ විදුලි වෙළෙන්දෙකු ලෙස කටයුතු කිරීමට කිසිදු පුද්ගලයෙකුට නීතිමය බාධාවක් නොමැත. පුද්ගලයෙකුට විදුලි ස්ථාපනයන් සංස්ථාපනය කිරීම, අළුත්වැඩියා කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම හෝ සැලසුම් කිරීම සහ සැලසුම් කිරීම සම්බන්ධ ඕනෑම කාර්යයක නිරත විය හැකි ය. කැබිනට් පත්‍රිකාව අනුමත වූ පසු	දැනුම වැඩි දියුණු කිරීම සහ ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා දීම මගින් විදුලි කාර්මිකයන් සවිබල ගැන්වීම තුළින් ජීවිත හා දේපළවල විදුලි ආරක්ෂාව වැඩි දියුණු කිරීම	1,800,000

		‘විදුලි කාර්මික බලපත්‍ර රාමුව’ ක්‍රියාත්මක කිරීම ආරම්භ කෙරේ. ක්‍රියාවට නැංවීමේ කාර්යය අතරතුර, රෙගුලාසි ගැසට් පත්‍ර ප්‍රකාශයට පත් කිරීම, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම වැනි බහුවිධ ක්‍රියාකාරකම් සිදු කිරීම අවශ්‍ය වේ. මෙම ක්‍රියාකාරකම හරහා ශ්‍රී ලංකා විදුලිබල පනත, ආරක්ෂක රෙගුලාසි යටතේ එහි සාදන ලද අදාළ සංග්‍රහ, රෙගුලාසි සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල ව නිර්දේශ සහ තීරණ ලබාදීමට PUCSL විසින් සැලසුම් කරනු ලබයි.		
AP22/INS/RU/09	MV LV ABC වැනි පරිවාරක සන්නායක සඳහා රැහැන් නිෂ්කාශනය	2009 අංක 20 දරණ පනතේ 3(1)(g) වගන්තියට අනුව, කොමිෂන් සභාවේ එක් කාර්යයක් වන්නේ විදුලි සැපයුම් සේවා සහ මිනුම් සේවාවල ආරක්ෂාව සම්බන්ධයෙන් තාක්ෂණික සහ අනෙකුත් ප්‍රමිතීන් සැකසීම සහ බලාත්මක කිරීම ය; 2009 අංක 20 දරණ පනතේ 4 (1) (a) වගන්තියට අනුව, පාරිභෝගිකයින්ට සපයනු ලබන විදුලියේ ආරක්ෂාව සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ උනන්දුව ආරක්ෂා කිරීම කොමිෂන් සභාවේ එක් අරමුණකි. ඉහත හඳුන්වාදීම සඳහා MV රැහැන් ජාලයේ සිදුවන විදුලිසැර වැදීම් සහ බාධා ඉවත් නොකළහොත් MV රැහැන් ආරක්ෂාව සහ විශ්වසනීයත්වය අවම වනු ඇත.	බෙදාහැරීමේ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි රෙගුලාසි සකස් කිරීම, එමඟින් වටිනා ජීවිත සහ දේපළ දැඩි ලෙස ආරක්ෂා වේ.	1,000,000
AP22/INS/RU/10	සොකට් සහ පේනු ප්‍රමිතිකරණය සහ ආරක්ෂණ නියාමනය අනුකූල වීම.	පේනු සහ සොකට් සහ ආරක්ෂණ රෙගුලාසි සඳහා වන තනි ප්‍රමිතීන් පාරිභෝගිකයින් සහ බලපත්‍රලාභීන් විසින් පිළිපදින බව PUCSL විසින් තහවුරු කරනු ඇත. ශ්‍රී ලංකා විදුලිබල පනත, ආරක්ෂක රෙගුලාසි යටතේ එහි සාදන ලද අදාළ සංග්‍රහ, රෙගුලාසි සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව PUCSL විසින් පරීක්ෂණ සහ අනුකූලතා	පර්යේෂණ සහ සංවර්ධන හරහා දේශීයව නිෂ්පාදනය කරන ලද විදුලි සම්බන්ධ උපාංගවල ප්‍රමිතීන් නැවත නිර්වචනය කිරීම, එමඟින් විදුලි පාරිභෝගිකයින්ගේ ආරක්ෂාව වැඩි කිරීම	1,800,000

		පරීක්ෂණ මගින් නිර්දේශ සහ තීරණ ලබා දෙනු ඇත.		

විදුලි බල කර්මාන්තය
04 වන ප්‍රතිඵලය
මිනිසුන්, සතුන් සහ ශාක සඳහා පාරිසරික තත්ත්වයන් වැඩිදියුණු කිරීම

යොමු අංකය	ක්‍රියාකාරකමේ නම	ක්‍රියාකාරිත්වය පිළිබඳ විස්තරය	පාර්ශවකරුවන්ට ප්‍රතිලාභ	සෘජු පිරිවැය (රු.)
AP22/CP/EER/01	Solar PV ස්ථාපනයන් පිළිබඳ විදුලි කාර්මිකයන් 1000කගේ කුසලතා වැඩිදියුණු කිරීම	රජයේ RE ප්‍රතිපත්ති ඉලක්කය තිරසාර ලෙස සපුරා ගැනීම සඳහා, නිර්දේශිත ප්‍රමිතීන්ට අනුව ස්ථාපනයන් සිදු කිරීම සඳහා ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් සුදුසුකම් ලත් පුහුණු කාර්මික ශිල්පීන් සංඛ්‍යාවක් සිටීම අවශ්‍ය වේ. මේ වන විට සූර්ය ස්ථාපන ක්ෂේත්‍රයේ දක්ෂ කාර්මික ශිල්පීන්ගේ විශාල හිඟයක් පවතී. එබැවින් මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා දිවයින පුරා පුහුණු සැසි 10ක් පැවැත්වීමට මහජන උපයෝගිතා කොමිසම සැලසුම් කරමින් සිටී.	1. ශ්‍රී ලංකාවේ මෙන් ම විදේශයන්හි සිටින විදුලි කාර්මික ශිල්පීන් සඳහා නව රැකියා මාර්ග නිර්මාණය කිරීම. 2. ස්ථාපන කටයුතුවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ එම නිසා කර්මාන්තයේ තිරසාර බව වැඩිදියුණු කිරීම. 3. රට තුළ පුනර්ජනනීය බලශක්ති උත්පාදනය වැඩි කිරීම සහ එමගින් බලශක්ති පිරිවැය අඩු කිරීම. 4. පාරිසරික තත්ත්වයන්, අවට වාතයේ ගුණාත්මකභාවය සහ ජලයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.	10 M
AP22/CP/EER/02	e-mobility (විද්‍යුත් සංචලනය) සංවර්ධනය සඳහා අවශ්‍ය නියාමන මෙවලම් හඳුනා	වැඩිවන පිරිවැය තරඟකාරිත්වය, පරිසර හිතකාමීත්වය සහ වෙනත් විවිධ හේතු නිසා ප්‍රවාහනයේ අනාගතය විද්‍යුත් සංචලනය මත බෙහෙවින් රඳා පවතී.	1. ගමන්/ප්‍රවාහනය සඳහා පොසිල ඉන්ධන මත යැපීම අඩු වීම. 2. ප්‍රවාහන වියදම්	0

	ගැනීම.	වෙළඳපොලේ ඇති බාධා ඉවත් කරමින් සහ හිතකර නියාමන රාමුවක් ස්ථාපිත කිරීම තුළින් රට තුළ විදුලි වාහන සංවර්ධනයට සහාය විය යුතු ය. මෙම ක්‍රියාකාරකම හරහා, කොමිෂන් සභාවේ නීතිමය වරම යටතේ පැනවිය හැකි ප්‍රධාන නියාමන මැදිහත්වීම් හඳුනා ගැනීමටත්, නියාමන මෙවලම් සකස් කිරීමට අදාළ අනෙකුත් රාජ්‍ය ආයතනවලට සහාය දැක්වීමටත් PUCSL විසින් සැලසුම් කරනු ලබයි.	අඩු වීම. 3. දේශීය කර්මාන්තවල ලාභදායිත්වය වැඩි දියුණු කිරීම. 3. වැඩිදියුණු කළ පාරිසරික තත්ත්වයන්. 4. විදේශ මුදල් පිටතට ගලායාම අඩු වීම.	
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු *ලබා ගත හැකි වූ විට* කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

කොමිෂන් සභාවේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා වක්‍රලේඛයේ I හා II ඡේද	(i) ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ හා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව සිය ආයතනයේ කාර්ය මණ්ඩලය වෙත දීමනා වර්ග 11 ක් යටතේ එකතුව රු.45,873,483 ක් ගෙවීම් කර තිබුණි.
	(ii) සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා මාසිකව රු.40,000ක් බැගින්ද, කළමනාකරණ තනතුර සඳහා මාසිකව රු.5,000ක් බැගින්ද, රියදුරු තනතුර සඳහා මාසිකව රු. 2,500ක් බැගින්ද ගමන් වියදම් ලෙස ගෙවීමට මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි සංග්‍රහය අනුව විධිවිධාන සලසා තිබුණි. ඒ අනුව භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන සමාලෝචිත වර්ෂය තුළ ගමන් වියදම් ලෙස රු. 8,880,000 ක් ගෙවීම් කර තිබුණි.
	(iii) කොමිෂන් සභාවේ සේවයේ නියුතු ස්ථිර සේවකයන් සඳහා උපරිමය රු.මිලියන 5 ක සහ ආපසු ගෙවීමේ කාලය අවුරුදු 5 කට යටත්ව වාහන සඳහා ණය යෝජනා ක්‍රමයක් 2018 මාර්තු 15 දිනැති අංක 212 කොමිෂන් සභා පත්‍රිකාව මඟින් අනුමත කර තිබුණ ද, එම යෝජනා ක්‍රමය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් දෙදෙනෙකු විසින් ලබාගෙන තිබූ එකතුව රු.6,500,000 ක ණය මුදල වෙනුවෙන් පොලිය ලෙස රු.248,088 ක් කොමිෂන් සභාව විසින් බැංකුව වෙත ප්‍රතිපූර්ණය කර තිබුණි.
	(iv) කොමිෂන් සභාවේ ස්ථිර සේවකයන් සඳහා රු. මිලියන 8 උපරිම සීමාව හා අවුරුදු 15 කාල සීමාවට යටත්ව නිවාස හා දේපල ණය යෝජනා ක්‍රමය සඳහා 2018 අගෝස්තු 18 දිනැති අංක 220 කොමිෂන් සභා පත්‍රිකා මඟින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 18 දෙනෙකු විසින් ලබා ගන්නා ලද එකතුව රු.78,140,610 ක නිවාස හා දේපළ ණය වෙනුවෙන් රු.3,157,723 ක් පොලී වශයෙන් කොමිෂන් සභාව විසින් බැංකුව වෙත ප්‍රතිපූර්ණය කර තිබුණි.

2015 මැයි 25 දිනැති අංක PED 1/2015 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 3.3 ඡේදය	නිල වාහන හිමි නිලධාරීන්ට රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව ගෙවිය යුතු ඉන්ධන දීමනාව ඉක්මවා පහත පරිදි ගෙවීම් කර තිබුණි.

තනතුර	චක්‍රලේඛයට අනුව හිමි ඉන්ධන දීමනාව (ලීටර්)	කොමිෂන් සභාව මඟින් අනුමත කර තිබූ ඉන්ධන දීමනාව (ලීටර්)
අධ්‍යක්ෂ ජනරාල්	150	300
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	140	225
අධ්‍යක්ෂ	120	150

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර කොමිෂන් සභාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ විධිවිධාන ප්‍රකාරව විදුලිය, බනිජතෙල් හා ජලය පිළිබඳ කර්මාන්ත නියාමනය කිරීම.	ශ්‍රී ලංකාවේ විදුලිය, බනිජතෙල් හා ජල කර්මාන්ත නියාමනය කිරීම සඳහා 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවට බලය ලැබී තිබුණ ද, බනිජතෙල් නීතිගත සංස්ථාව හා ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩල පනත් මගින් එම නියාමනය කිරීමේ නීතිමය රාමුව සකස් වී නොතිබුණි. කොමිෂන් සභාව ස්ථාපිත කර වර්ෂ 19 කට අධික කාලයක් ගත වී තිබුණත්, බනිජතෙල් හා ජල කර්මාන්ත කොමිෂන් සභාවේ නියාමනයට යටත්වන පරිදි අදාළ පනත් සංශෝධනය කර ගැනීමට නොහැකි වී තිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති නොමැති බව

2.3 වෙනත් කරුණු

2.3.1 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්

2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වාර්ෂික නියාමන ගාස්තු ශේෂය රු. 82,544,592 ක් වන අතර, ඒ තුළ 2014 හා 2015 වර්ෂයන්ට අදාළ ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු රු. 81,852,700 ක ශේෂයක් පැවතුණි.

2.3.2 මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 14(2) වගන්තිය ප්‍රකාරව ඉටුකළ යුතු කර්තව්‍යයන් සඳහන් කර තිබුණද එම ක්‍රියාකාරකම් සිදු කිරීම වෙනුවට මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන වෙනුවෙන් සමස්ථ මෙහෙයුම් වියදම වූ රු.177,630,486 කින් රු. 86,808,538 ක් එනම් සියයට 49 ක් වැය කර තිබුණි. එසේම එය ඉකුත් වර්ෂයට වඩා රු. 74,976,422 ක එනම් සියයට 633 කින් පිරිවැය වැඩි වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශය



ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

මූල්‍ය ප්‍රකාශන

2021

අන්තගර්තය

	පිටු අංකය
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	**01**
විස්තීරණ ආදායම් ප්‍රකාශනය	**02**
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	**03**
ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය	**04**
ගිණුම්කරණ ප්‍රතිපත්ති	**05-10**
අදාළ පාශර්ව හෙළිදරව් කිරීම්	**11**
දේපල පිරියත සහ උපකරණ	**12**
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	**13-17**

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන්	2021 රු.	2020 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	**1**	59,993,214	31,917,717
කෙරීගෙන යන ප්‍රාග්ධන කාර්යන්	**1.1**	7,376,322	-
අස්පෘශ්‍ය වත්කම් - මෘදුකාංග	**1.2**	1,414,883	-
ආපදා ණය		5,052,626	6,263,793
මුළු ජංගම නොවන වත්කම්		**73,837,046**	**38,181,510**
ජංගම වත්කම්			
ආයෝජන	**2**	589,707,190	514,868,339
ඉන්වෙන්ටරි	**3**	797,006	76,303
ලැබිය යුතු දෑ	**4**	222,974,991	167,222,062
තැන්පතු, අත්තිකාරම් සහ පෙරගෙවුම්	**5**	10,842,082	7,739,100
මුදල් සහ මුදල් සමාන දෑ		6,897,984	4,460,627
මුළු ජංගම වත්කම්		**831,219,254**	**694,366,431**
මුළු වත්කම්		**905,056,300**	**732,547,942**
අරමුදල් සහ වගකීම්			
අරමුදල්			
සමුච්චිත අරමුදල	**6**	784,517,162	675,027,631
ප්‍රත්‍යාගණිත සංචිත		57,063,763	24,849,786
		841,580,925	**699,877,417**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික ප්‍රතිපාදන	**8**	**19,768,528**	**16,973,374**
		19,768,528	**16,973,374**
ජංගම වගකීම්			
ගෙවිය යුතු ගිණුම්	**7**	41,906,846	14,897,151
විගණකාධිපතිවරයාගේ ගාස්තු	**9**	1,800,000	800,000
සුරැකුම් තැන්පතු - ලං.වි.ම.		-	-
මුළු වගකීම්		**43,706,846**	**15,697,151**
		905,056,300	**732,547,942**

පිටු 05 සිට 11 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සාමාජිකයින් වගකිව යුතුය.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙනුවෙන්

ජනක රත්නායක
සභාපති

කොමිෂන් සභාවේ සාමාජික

දමිත කුමාරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

තිළිණ රණසිංහ
අධ්‍යක්ෂ - මූල්‍ය

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වෂර්ය සඳහා වන

විස්තීරණ ආදායම් ප්‍රකාශනය

	සටහන්	2021 රු.	2020 රු.
ආදායම			
විවල්‍ය ලියාපදිංචි ගාස්තුව	**10**	240,947,478	141,145,406
වාෂර්ක නියාමන ගාස්තු	**11**	190,434,186	189,818,981
බලපත්‍ර අයදුම්පත් ගාස්තු	**12**	525,000	474,000
වෙනත් ආදායම්	**13**	25,353,379	27,685,191
මුළු ආදායම		**457,260,044**	**359,123,578**
වියදම්			
පුද්ගල පඩිනඩි	**14**	143,136,589	113,800,954
උපදේශන සේවා		26,908,532	5,455,619
මෙහෙයුම් වියදම්	**15**	177,630,486	94,251,588
මුල්‍ය පිරිවැය	**16**	6,390	11,185
මුළු වියදම්		**347,681,997**	**213,519,345**
වසර සඳහා වූ මෙහෙයුම් අතිරික්තය		**109,578,047**	**145,604,233**
වෙනත් විස්තීරණ ආදායම්			
ප්‍රත්‍යාගණික ලාභය		32,213,977	-
සත්‍ය ලාභ/(අලාභ)		(88,516.00)	1,171,741
වසර සඳහා මුළු අතිරික්තය		**141,703,508**	**146,775,974**

පිටු අංක 05 සිට 11 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මුල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
2021 දෙසැම්බර් 31 මස දිනෙන් අවසන් වූ වසර සඳහා වන
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2021 රු.	2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
වෂර්යේ මෙහෙයුම් අතිරික්තය / (හිඟය)	109,578,047	145,604,233
ගැළපුම් කළා		
ක්ෂය වීම්	18,390,112	19,631,935
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	3,266,888	3,414,485
ස්ථාවර වත්කම් අපහරණයෙන් ලද ආදායම	(181,219)	81,120
පොලී ආදායම	(25,045,688)	(27,571,802)
මූල්‍ය පිරිවැය	-	
	106,008,139	**141,159,971**
කාරක ප්‍රාග්ධනයේ සිදුවූ විචලනයන්		
ඉන්වෙන්ටරිවල (ඉහළ) / පහළ යාම	(720,703)	129,481
තැන්පතු (ඉහළ) / පහළ යාම	(252,000)	(9,000)
ලැබිය යුතු දෑ (ඉහළ) / පහළ යාම	(55,752,929)	104,072,005
ගෙවිය යුතු දෑ (ඉහළ) / පහළ යාම	28,009,696	(40,768,596)
අත්තිකාරම්, පෙර ගෙවීම්(ඉහළ) / පහළ යාම	(1,639,815)	1,220,107
කාරක ප්‍රාග්ධනයේ ශුද්ධ විචලනයන්	**(30,355,751)**	**64,643,997**
මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් උත්පාදිත/(භාවිතා කරන ලද) මුදල්	**75,652,388**	**205,803,968**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් උත්පාදිත මුදල් ප්‍රවාහය		
ස්ථාවර වත්කම් අපහරණයෙන් ලැබූ ආදායම	225,050	154,189
ස්ථාවර වත්කම් මිලදී ගැනීම	(15,710,346)	(3,114,374)
සිදු කෙරෙමින් පවත්නා කායර්යන් වෙත එකතු කිරීම	(7,376,322)	
ලද පොලිය	25,045,688	26,900,902
ස්ථාවර තැන්පතු ආපසු ගැනීම	92,000,000	50,000,000
පාරිතෝෂික ආයෝජන ඉහළ යාම්	(1,158,303)	(1,318,376)
ස්ථාවර තැන්පතු/භාණ්ඩාගාර බිල්පත් සහ ඇමතුම් තැන්පතු වල ආයෝජන	(165,680,548)	(275,000,000)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් උත්පාදිත (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය	**(72,654,781)**	**(202,377,659)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් උත්පාදිත මුදල් ප්‍රවාහය		
පාරිතෝෂික ගෙවීම්	(560,250)	(157,710)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් උත්පාදිත (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහ	**(560,250)**	**(157,710)**
වෂර්ය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	**4,460,627**	**1,192,028**
වෂර්ය තුළ ශුද්ධ මුදල් ප්‍රවාහය	**2,437,357**	**3,268,599**
වෂර්ය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	**6,897,984**	**4,460,627**
මුදල් සහ මුදල් සමාන දෑ		
අතැති සහ බැංකුගත මුදල්	**6,897,984**	**4,460,627**

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන

ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය

	සමුච්චිත අරමුදල	ප්‍රත්‍යාගණිත සංචිත	එකතුව
2020 ජනවාරි මස 1 වන දිනට ශේෂය	**675,027,631**	**24,849,786**	**699,877,417**
ආදායම් ප්‍රකාශයේ අතිරික්තය	**109,578,047**	**32,213,977**	**141,792,024**
වෙනත් විස්තීරණ ආදායම්	**(88,516)**		**(88,516)**
2021 දෙසැම්බර් මස 31 දිනට ශේෂය	**784,517,162**	**57,063,763**	**841,580,925**

සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති

01 .**සාමාන්‍ය**

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) ස්ථාපිත කර ඇත්තේ සුසංයෝගී ජාතික ප්‍රතිපත්තියකට අනුව ඇතැම් උපයෝගිතා කමර්ාන්ත නියාමනය කිරීම සඳහා ය.
ඉහත ප්‍රතිපත්තියට අනුකූල ව, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත බලාත්මක කිරීමත් සමඟ ශ්‍රී ලංකාවේ විදුලිබල කමර්ාන්තය නියාමනය කිරීම පිණිස මහජන උපයෝගිතා කොමිෂන් සභාවට පූණර් බලතල හිමි විය .

02 . සැකසුම් පදනම

2.1 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, 2002 අංක 35 දරණ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ අවශ්‍යතා සහ 1995 අංක :15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතට අනුකූල වන පරිදි මුල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

2.2 මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මුල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන සකස් කර ඇත. අඛණ්ඩ පැවැත්ම පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති කාල සීමාව පුරාවට ස්ථාවර ව යෙදී ඇත.

2.3 මූල්‍ය කාල පරිච්ඡේදය

කොමිෂන් සභාවේ මුල්‍ය වෂර්ය ලිත් වෂර්ය විය යුතු ය.

03. සංසන්දනාත්මක තොරතුරු

කොමිෂන් සභාව විසින් යොදන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති, වෙනත් ආකාරයකින් ප්‍රකාශිත නම් විනා, පෙර වසරේ භාවිතා කළ ඒවාට අනුකූල වේ. පෙර වසරේ සංඛ්‍යා සහ වාක්‍ය ඛණ්ඩ වත්මන් වසරේ ඉදිරිපත් කිරීම් හා අනුගත වන වන පරිදි අවශ්‍ය ඕනෑ ම තැනක ප්‍රති-සැකසුම්කරණය කර ඇත.

04. ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

සියලු ප්‍රමාණාත්මක පශ්චාත් ශේෂ පත්‍ර විශේෂ සිදුවීම් සලකා බලා, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වල සුදුසු ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

05. **වත්කම් තක්සේරුකරණය සහ ඒවාහි මිනුම් පදනම**

5.1 දේපල පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණ පහත දක්වා ඇති පරිදි පිරිවැය/අඩු සමුච්චිත ක්ෂයවීම් හෝ ප්‍රත්‍යාගණනය කිරීම හෝ ප්‍රයෝජනවත් ජීව කාලය සංශෝධනය කිරීම මගින් වාතර්ා කරනු ලැබේ. දේපල පිරියත සහ උපකරණවල පිරිවැය යනු වත්කම් ඒවාහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමේ දී දරනු ලබන ඕනෑම වියදමක් වේ නම් ඒවා ද සමහින් ඒවා මිලදී ගැනීමට හෝ ඉදි කිරීමට වැය වූ පිරිවැයයි.

වත්කම්වල සාධාරණ වටිනාකම විශ්වාසදායක ලෙස මැනිය නොහැකි බැවින් මෝටර් වාහන සඳහා හැර අනෙකුත් සියලු ම වත්කම් පිරිවැය/අඩු සමුච්චිත ක්ෂයවීම් යටතේ වාතර්ා කර ඇත. අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරන ලද කමිටුවක් මගින් 2021 ඔක්තෝම්බර් 14 වන දින මෝටර් රථ නැවත තක්සේරු කර ඇති අතර වත්කම්වල පවතින අගය ප්‍රමාණය වැඩි කර නැවත තක්සේරු සංචිතවලට බැර කර ඇත. සෑම වසර දෙකකට වරක් මෝටර් රථ නැවත තක්සේරු කිරීමට තීරණය විය.

LKAS 8 (ගිණුම්කරණ ප්‍රමිත) අනුව තවමත් භාවිතයේ පවතින සම්පූර්ණ ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සංශෝධනය කිරීමටත් ගිණුම් ඇස්තමේන්තුවල වෙනසක් ලෙස ක්ෂයවීම් වාතර්ා කිරීමටත් තීරණය කරන ලදී.

5.2 ක්ෂය වීම

දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය පිරිවැය සම්බන්ධයෙන් සරල රේඛීය පදනම භාවිතා කිරීම මගින් ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ. ඒ අනුව වත්කම්වල ක්ෂයවීම් අනුපාත පහත පරිදි වේ:

1. ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	20%
2. පරිගණක සහ කාර්යාල උපකරණ	
බහු මාධ්‍ය ප්‍රොජෙක්ටරය/SAN ආචයනය	25%
ඩෙස්ක්ටොප් පරිගණක	25%
ලැප්ටොප් පරිගණක	25%
ජංගම දුරකථන	33 1/3 %
අතේ ගෙන යා හැකි දෘඩ තැටිය/සේවාදායක දෘඩ තැටිය	33 1/3%
LTO ටේප් ධාවකය	33 1/3 %
LTO ටේප්	33 1/3 %
UPS	50%
වෙනත්	20%
3. වාහන	20%
4. මෘදුකාංග	33 1/3%
5. කාර්යාල උපකරණ	20%

වත්මන් වෂර්ය තුළ දේපල, පිරියත සහ උපකරණ මිලදී ගත් දින සිට ක්ෂයවීම් ගණනය අදාළ වේ.

වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය, අවශේෂ අගයන් සහ ක්ෂයවීම් ක්‍රම එක් එක් මූල්‍ය වෂර්ය අවසානයේ සමාලෝචනය කර අවශ්‍ය නම් ප්‍රත්‍යාගණනයට ලක් කෙරේ.

5.3 කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කාර්යයන්

වෂර්ය තුළ දරන ලද නමුත් වාතර්ා කරන දිනට සම්පූණර් නොකළ ප්‍රාග්ධන වියදම් කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කායර්යන් ලෙස දක්වන අතර වෂර්ය තුළ සම්පූණර් කර භාවිතයට ගත හැකි ප්‍රාග්ධන වත්කම් දේපල පිරියත සහ උපකරණ වෙත මාරු කරනු ලැබේ.

06. **ඉන්වෙන්ටරි**

ඉන්වෙන්ටරි අගය කරනු ලබන්නේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩා අඩු අගයට ය. ඉන්වෙන්ටරි වල පිරිවැය පැමිණෙන්නේ ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් නිකුත් කිරීම් (FIFO) පදනම භාවිතා කිරීමෙනි.

07. **ආයෝජන**

කොමිෂන් සභාවට ලැබෙන ප්‍රතිලාභ උපරිම කිරීම සඳහා කොමිෂන් සභාව සිය අතිරික්ත ආදායම් ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කරනු ලබයි.

08. **ලැබිය යුතු දෑ**

ලැබිය යුතු ඒවා උපලබ්ධි කිරීමට ඇස්තමේන්තුගත කර ඇති ගණුන් අනුව ප්‍රකාශ කෙරේ. බොල් හෝ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන සලසා නැත.

9. අත්තිකාරම් සහ පෙරගෙවුම්

පෙරගෙවුම් ගිණුමට නිශ්චිත කාල සීමාවක් සඳහා සේවා සපයන්නන් ලබා ගැනීමට විවිධ සැපයුම්කරුවන්ට ගෙවන වාරිකයේ කොටසක් හා සමාලෝචිත කාල සීමාවට අදාළ නොවන (නමුත් අනාගත කාලසීමාව සඳහා) ගෙවනු ලබන මුදල ඇතුළත් වේ. අත්තිකාරම් ලබා ගෙන 2021-12-31 දිනට පියවා නොමැති අත්තිකාරම් ද අත්තිකාරම් ගිණුමට ඇතුළත් වේ.

10. **මුදල් සහ මුදල් සමාන දෑ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් සහ මුදල් සමාන දෑ බැංකුවේ සහ අතේ ඇති මුදල් වලින් සම්න්විත වේ.

11. **විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය**

11.1 1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුව, සේවකයකුට පාරිතෝෂික සඳහා වගකීම පැන නගින්නේ කොමිෂන් සභාවේ අඛණ්ඩ සේවා කාලය වසර පහක් සම්පූණර් කිරීමෙන් පසුව පමණි. PUCSL විසින් LKAS 19 සමඟ තහවුරු කිරීම සඳහා පාරිතෝෂික වගකීම් වාතර්ා කිරීම සඳහා ආයුසනක තක්සේරුව අනුගමනය කර ඇත. ආයුසනක තක්සේරුව වෘත්තීය ආයුසනක තක්සේරුකරුවන් වන Acturial and Management Consultant (pvt) Ltd විසින් සිදු කරන ලදී.

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම යන්න මූල්‍ය තත්ඔය ප්‍රකාශයෙන් පිළිගෙන ඇති අතර, එමඟින් නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වතර්මාන

වටිනාකම නියෝජනය කරනු ලබයි. මූල්‍ය කායර් සාධනය සහ අනෙකුත් විස්තීණර් ආදායම් ප්‍රකාශය තුළ සියලු ම ආයුගණක ලාභ සහ අලාභ සැණින් හඳුනා ගැනේ.

බැරකම් සඳහා ප්‍රතිපාදන බාහිර ව ආයෝජනය කරනු ලබන්නේ ශේෂ පත්‍ර දිනයෙන් පසුව ය.

11.2 සේවක අථර්සාධක අරමුදල සහ සේවක භාර අරමුදල

සුදුසුකම් ලත් සියලු ම සේවකයින් සම්බන්ධයෙන් අදාළ ප්‍රඥප්ති සහ රෙගුලාසි වලට අනුකූලව දායක මුදල් ලබා දෙන ලදී.

2013 ඔක්තෝබර් 1 දින සිට බල පැවැත්වෙන පරිදි සේවක අථර්සාධක අරමුදලේ දායකත්වය සේවායෝජකයා විසින් 12% සිට 15% දක්වා සහ සේවකයා විසින් 8% සිට 10% දක්වා වැඩි කිරීම.

12. රජයේ ප්‍රදාන

දේපල, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම සඳහා ලබා දෙන රජයේ ප්‍රදාන විලම්භිත ආදායමක් ලෙස හඳුනා ගෙන වත්කම්වල ප්‍රයෝජනයට වෙන් කරනු ලැබේ. එම ප්‍රදාන ලැබිය යුතු දෑ බවට පත් වූ විට ඉතිරි ප්‍රදාන ආදායමක් ලෙස පිළි ගැනේ.

13. බැරකම් හඳුනා ගැනීම

පවත්නා බැරකම් පියවීමක් මඟින් ආථර්ික ප්‍රතිලාභ මූතර්මත් වන පරිදි සම්පත් පිටතට ගලා යාමක් සිදුවීමට සම්භාවිතාවක් ඇති විට පියවීම සිදුවන ප්‍රමාණය විශ්වාසදායක ලෙස මැනිය හැකි වීමේ වැඩි ශක්‍යතාවක් පවතින විට ශේෂ පත්‍රය තුල බැරකමක් හඳුනා ගනු ලබයි. ගෙවිය යුතු මුදල ඒවායේ පිරිවැය අනුව ප්‍රකාශ කෙරේ.

ආදායම් ප්‍රකාශනය

14. ආදායම් හඳුනා ගැනීම

14.1 විවල්‍ය ලියාපදිංචි (බලපත්‍ර) ගාස්තු

ශ්‍රී ලංකා රජය සමඟ ක්‍රියාත්මක කරන ලද "ලිහිසි තෙල් ගිවිසුමේ" 2 වැනි වගන්තිය අනුව, ලිහිසි තෙල් වෙළෙඳපොළ සහභාගිවන්නන් විසින් ද්වි-වාෂර්ිකව ලක්ෂ 25ක් (රු. මිලියන 2.5) හෝ එම කාල සීමාව සඳහා මුළු ඉන්වොයිසි අලෙවියෙන් 0.75% ක් යන දෙකෙන් වැඩි අගය ගෙවිය යුතු ය. එක් එක් වෂර්යේ ජනවාරි 1 වැනිදා හෝ ඊට ප්‍රථමයෙන් රුපියල් විසි පන් ලක්ෂයක් ද (රුපියල් මිලියන 2.5) ජූනි මස 30 වැනි දින හෝ ඊට ප්‍රථමයෙන් තවත් රුපියල් විසි පන් ලක්ෂයක් ද (රුපියල් මිලියන 2.5ක්) ඛනිජ තෙල් සම්පත් සංවධර්න අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නමට බැර වන සේ ගෙවිය යුතු වේ. ද්වි-වාෂර්ික කාලය තුළ වෙළඳපල සහභාගිවන්නෙකුගේ ඉන්වොයිසිගත සමස්ත අලෙවියෙන් 0.75%ක් රුපියල් විසි පන් ලක්ෂය ඉක්මවන්නේ නම් එම කාලය අවසන් වී දින 30ක් ඇතුළත එම අතිරේක මුදල මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු ය.

14.2 **වාෂර්ික නියාමන බද්ද**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 46 වැනි වගන්තියට අනුව වාෂර්ික නියාමන බද්දක් පැනවීමට කොමිෂන් සභාවට බලය පවරා ඇති අතර සෑම බලපත්‍රලාභියෙකුගෙන් ම අදාළ වෂර්යේ ජුනි මස 30 වැනි දිනට පෙර එය අය කර ගත යුතු ය. මෙම පනත 2009 අප්‍රේල් 8 වන දින සහතික කරන ලද අතර එදින සිට කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලදී.

14. 3 **බලපත්‍ර අයදුම්පත් ගාස්තු**

පනවා ඇති බදු වලට අමතර ව, ශ්‍රී ලංකා විදුලිබල පනතේ 11 වැනි වගන්තියට අනුව, විදුලිබල උත්පාදනය, සම්ප්‍රේෂණය හෝ බෙදා හැරීම සඳහා බලපත්‍ර අයදුම්පත් සමඟ අයදුම්පත් පිරි සැකසීමේ ගාස්තුවක් අය කර ගැනීමට කොමිෂන් සභාවට බලය ඇත.

14.4 **පොලී ආදායම**

පොලී ආදායම උපචිත පදනම මත ගණනය කරන ලදී. ආදායම හඳුනාගනු ලබන්නේ ගනුදෙනුව හා සම්බන්ධ ආර්ථික ප්‍රතිලාභ කොමිෂන් සභාව වෙත ගලා ඒමේ සම්භාවිතාව ඇති විට පමණි.

15. **වියදම් හඳුනා ගැනීම**

කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අයවැය ප්‍රතිපාදන මත පදනම් ව ආදායම් ප්‍රකාශනය තුළ වියදම් හඳුනා ගෙන ඇත.

17. **අදාළ පාශර්ව හෙළිදරව් කිරීම්**

17.1 **ප්‍රධාන කළමනාකරණ පුද්ගල වන්දි**

ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින් මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ කොමිෂන් සභා සාමාජිකයින්ගෙන් සමන්විත වන අතර වන්දි මුදල් විස්තර පහත පරිදි වේ;

	2021	2020
කෙටි කාලීන සේවක ප්‍රතිලාභ	1,958,625	1,968,000
පශ්චාත් සේවක ප්‍රතිලාභ		
වෙනත් දිගු කාලීන ප්‍රතිලාභ		
අවසන් කිරීමේ ප්‍රතිලාභ		
	1,958,625	**1,968,000**

සටහන 01
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
2021 දෙසැම්බර් මස 31 වන දිනට
දේපල, පිරියක සහ උපකරණ

	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	පරිගණක සහ කායර්ාල උපකරණ	කායර්ාල උපකරණ	වාහන	මෙවලම්	එකතුව
	රු.	රු.		රු.	රු.	රු.
වසර ආරම්භයේ දී	23,666,279	48,580,066	515,279	5,751,023		78,512,647
වසර තුළ එකතු කිරීම	3,751,453	11,913,894	45,000			15,710,346
මාරු කිරීම්	448,516	(3,760,874)	20,640			(3,291,718)
කෙරීගෙන යන වැඩවලින් මාරු කිරීම්						-
ප්‍රත්‍යාගණනය කිරීම්				32,213,977		32,213,977
වෂර්ය තුළ අපහරණය කිරීම්	(573,663)	(1,665,726)				(2,239,389)
වසර අවසානයේ දී	27,292,585	55,067,359	580,919	37,965,000	-	120,905,863
ක්ෂය වීම						
වසරේ ආරම්භයේ දී	16,606,730	38,211,587	483,361		-	55,301,678
වසර සඳහා අය කිරීම	2,900,887	6,560,671	34,827	1,293,326		10,789,711
පෙර වසර සඳහා ගැලපීම්						-
මාරු කිරීම්	447,973	(3,431,992)	837			(2,983,182)
අපහරණය මත ක්ෂය වීම්	(550,029)	(1,645,529)				(2,195,558)
වසර අවසානයේ දී	**19,405,561**	**39,694,737**	**519,025**	**1,293,326**	**-**	**60,912,649**
2021 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	**7,887,024**	**15,372,622**	**61,894**	**36,671,674**	**-**	**59,993,214**

2021 ඔක්තෝම්බර් 14 වැනි දින ප්‍රත්‍යාගණනය දිනය දක්වා ක්ෂයවීම් සමඟ වෂර්ය සඳහා වාහන ක්ෂයවීම් ගාස්තුව රුපියල් 6,838,969.94 කි.

වාතර්ා කරන දිනය වන විට තවමත් භාවිතයේ පවතින සම්පූණර්යෙන්ම ක්ෂය වූ දේපල පිරියක සහ උපකරණවල පිරිවැය පහත පරිදි වේ;

	2021	2020
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	13,970,230	4,007,737
පරිගණක සහ කායර්ාල උපකරණ	29,259,735	18,660,534
කායර්ාල උපකරණ	473,879	292,524
මෘදුකාංග	14,563,055	11,027,066
	58,266,899	**33,987,861**

1.2 අස්පෘශ්‍ය වත්කම් -මෘදුකාංග

වසර ආරම්භයේ දී	15,302,022
මාරු කිරීම්	3,291,718
වෂර්ය තුළ අපහරණය කිරීම	(135,240)
වසර අවසානයේ දී	**18,458,500**
ක්‍රමක්ෂය	
වසරේ ආරම්භයේ දී	12,140,917
වසර සඳහා අය කිරීම	2,054,758
මාරු කිරීම්	2,983,182
අපහරණය කිරීමේදී ක්ෂය වීම	(135,240)
වසර අවසානයේ දී	**17,043,617**
2021 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	**1,414,884**

සටහන :1.1 කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කටයුතු

බලපත්‍ර කළමනාකරණ පද්ධතිය	2,341,760
සිද්ධි වාතර්ාකරණ පද්ධතිය	1,573,660
LISS නවීකරණය	258,000
DRS නවීකරණය	122,400
PUCSL අන්තර්ජාලය	586,000
කාමර්ික ශිල්පී තොරතුරු පද්ධතිය	1,067,502
HRD පද්ධතිය නවීකරණය	140,000
UAT සඳහා විසඳුම	183,600
ව්‍යාපාර බුද්ධි පද්ධතිය	1,103,400
	7,376,322

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
2021 ජනවාරි 1 දින සිට දෙසැම්බර් 31 දින දක්වා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	2021 රු.	2020 රු.
02. ආයෝජන		
ස්ථාවර තැන්පතු	570,680,547.99	497,000,000
පාරිතෝෂික අරමුදල් ආයෝජනය	19,026,642.27	17,868,339
	589,707,190.26	**514,868,339**
03.ඉන්වෙන්ටරි	**797,005.60**	**633,925**
04. ලැබිය යුතු දෑ		
විවිධ්‍ය ලියාපදිංචි ගාස්තු		
වෙච්රොන් ලුබ්රිකන්ට්ස් සමාගම	66,104,702	38,920,489
ලංකා අයිඕසී සමාගම	23,936,236	12,879,182
මැක්ලරන්ස් ලුබ්රිකන්ට්	11,273,572	1,967,587
ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව	5,595,123	2,000,000
ලාන්ස්	6,882,041	7,336,579
ඉන්ටර්ෂන් සවර්සස් සමාගම	1,125,656	0
ඇසෝසියේටඩ් මෝටවෙර්ස්	2,500,000	500,000
ටී.වී.එස්.ලංකා පුද්. සමාගම (හාරත් බනිජතෙල් සංස්ථාව)	565,236	1,781,924
යුනයිටඩ් මෝටසර්	4,458,468	2,402,057
ටොයෝටා ලංකා පුද්. සමාගම	10,399,495	8,556,885
එන්.එම්.ඩිස්ට්‍රිබියුටසර් පුද්.සමාගම	2,536,334	2,683,559
	135,376,863	**79,028,263**
වාෂර්ක නියාමන බදු	82,544,592	82,904,421
අඩු කිරීම්:බොල් ණය වෙන් කිරීම්		
ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී	4,927,138	5,203,929
වෙනත් ලැබිය යුතු දෑ	126,398	85,449
	222,974,991	**167,222,062**
05. තැන්පතු, අත්තිකාරම් සහ පෙරගෙවුම්		
තැන්පතු		
තැන්පතු ඩයලොග් ඇක්සියාටා පී.එල්.සී.	1,500.00	1,500
BOC දේපල සංවර්ධන සමාගම	826,570.80	826,571
එස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරනායක අනුස්මරණ පදනම් අරමුදල	252,000.00	-
ගලඊ ෆ්‍රෙන්ඩ්ලි ඇසෝසිඒෂන්	57,500.00	57,500
	1,137,571	885,571
අත්තිකාරම් සහ පෙර ගෙවීම්		
අත්තිකාරම්	815,633	9,000
තැපැල් දෙපාර්මේන්තුව	49,416	18,457
පෙර ගෙවීම්	6,100,504	4,305,241
සම්පත් වෙබ් කාඩ්පත	2,068	3,847
	6,967,621	**4,336,545**
ආපදා ණය	2,640,858	2,491,785
උත්සව අත්තිකාරම්	96,032	25,200
සමස්ත තැන්පතු, අත්තිකාරම් සහ පෙරගෙවුම්	**10,842,082**	**7,739,100**
06. සමුච්චිත අරමුදල		
2020 ජනවාරි 1 වෙනි දිනට ශේෂය	675,027,631	528,251,661
21/12/31 දිනට අතිරික්තය /(හිඟය).	109,578,047	146,775,974
පෙර වසරේ ගැලපීම් (6.1)		-
	784,605,678	675,027,631
07. ගෙවිය යුතු ගිණුම්		
මුද්‍රණය සහ ප්‍රචාරණය	6,722,211.34	3,038,080
සන්නිවේදන	297,130.67	405,645
මල් සැකැස්ම	13,200.00	-
වෙනත් දීමනා	5,498,897.69	138,647
පුවත්පත්	-	9,420
අතිකාල	588,741.49	60,114
ප්‍රවාහන	55,709.28	-
ගමන් වියදම්	16,000.00	18,750

	2021 රු.	2020 රු.
විදේශ ගමන්	-	-
වෙනත් ගිවිසුම්	289,698.40	465,473
කායර්ාල ගොඩනැගිල්ල නඩත්තු කිරීම	211,616.92	-
කායර්ාල වාහනය නඩත්තු කිරීම	13,314.10	-
ජල	21,461.19	12,833
විදුලිබලය	106,629.93	95,413
මහජනතාව දැනුවත් කිරීම	7,610,455.73	180,413
උපදේශනය	10,112,190.00	8,772,303
ගෙවිය යුතු මුද්දර බදු	5,275.00	5,225
සනීපාරක්ෂක සේවා	133,311.89	90,270
තැපැල්	-	17,475
රක්ෂණ	6,308.29	3,592
ගෙවිය යුතු සිදු වෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු	-	-
රඳවා තබා ගත් මුදල්	199,952	199,952
උපචිත පරිගණක සහ උපකරණ	4,494,758.05	1,042,680
උපචිත ගෘහ භාණ්ඩ සහ උපාංග	254,576.52	-
මෘදුකාංග නඩත්තු කිරීම	3,804,684.16	
පරිගණක සහ උපකරණ නඩත්තු කිරීම	-	-
ලිපි ද්‍රව්‍ය (ඉන්වෙන්ටරි)	510,948.00	-
පයෙර්ෂණ සහ සම්ක්ෂණ	-	-
පරිභෝජ්‍ය ද්‍රව්‍ය	133,425.00	-
සුභසාධන සහ මහජන සම්බන්ධතා	3,080.00	-
පරිවතර්නය	-	189,598
ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු	-	-
ගෙවිය යුතු වෙනත්	803,271.02	151,269
	41,906,846.35	**14,897,151**

08. පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන

2020 ජනවාරි 01 වන දිනට අථර් දක්වා ඇති ප්‍රතිලාභ වගකීම් වල වතර්මාන අගය සඳහා ප්‍රතිපාදන	16,973,374	14,888,340
කාල සීමාව සඳහා පොලී පිරිවැය	1,357,870	1,563,276
කාල සීමාව සඳහා වත්මන් සේවා පිරිවැය	1,909,019	1,851,209
වසර තුළ ගෙවන ලද පාරිතෝෂිකය	(560,250)	(157,710)
අථර් දක්වා ඇති ප්‍රතිලාභ වගකීම් වල වතර්මාන අගයහි සත්‍ය ලාභය/අලාභය	88,516	(1,171,741)
2021 දෙසැම්බර් 31 දිනට අථර් දක්වා ඇති ප්‍රතිලාභ වගකීම් වල වතර්මාන අගය සඳහා ප්‍රතිපාදන	**19,768,529**	**16,973,374**

කායර් මණ්ඩල පිරිවැටුම	වයස අවුරුදු 54 දක්වා 6% සහ ඉන් පසුව ශූන්‍ය	වයස අවුරුදු 54 දක්වා 6% සහ ඉන් පසුව ශූන්‍ය
විශ්‍රාමයාමේ වයස	60	60
වට්ටම් අනුපාතය	11.5%	8%
වැටුප් වධර්ක අනුපාතය	6%	5%

08.2 සංවේදීතා විශ්ලේෂණය

අනෙකුත් සියලුම උපකල්පන නොවෙනස්ව පවතින අතර විචල්‍යය වෙනස් විය		
වට්ටම් අනුපාතය 1% වැඩි වීම	18,597,139	15,987,598
වට්ටම් අනුපාතය 1% අඩු වීම	21,097,925	18,084,249
වැටුප් වධර්ක අනුපාතය 1% කින් වැඩි වීම	21,188,735	18,132,669
වැටුප් වධර්ක අනුපාතය 1% කින් අඩු වීම	18,503,055	15,929,633

09. විගණකාධිපති ගාස්තු

ඉදිරියට ගෙන ආ ශේෂය	800,000	1,627,600
වෂර්ය තුළ ගෙවීම්	0.00	(1,497,600)
වෂර්ය තුළ ප්‍රතිපාදන	1,000,000	800,000
පෙර වසර සඳහා ඌණ/අධි වෙන් කිරීම	-	(130,000)
	1,800,000.00	**800,000**

10.විවිධ ලියාපදිංචි ගාස්තු

ලංකා අයිඕසී සමාගම	40,181,910	18,521,384.24
වෙව්රොන් ලුබ්රිකන්ට් ලංකා	112,475,790	74,434,400.84
මැක්ලරන්ස් ලුබ්රිකන්ට්	22,911,592	7,949,202.98

	2021 රු.	2020 රු.
ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව	7,381,400	3,847,082.80
ලාෆ්ස් ලුබ්රිකන්ට්ස් සමාගම	14,798,731	10,995,904.71
ඉන්ටඔෂන් සවර්සස් සමාගම	2,703,086	-
ඇසෝසියේටඩ් මෝටවෙර්ස්	4,502,517	1,155,372.00
ටී.වී.එස්.ලංකා පුද්. සමාගම	1,473,740	3,519,168.49
යුනයිටඩ් මෝටවෙර්ස්	7,320,371	3,079,497.16
ටොයෝටා ලංකා පුද්. සමාගම	19,554,046	14,651,390.63
එන්.එම්.ඩිස්ට්‍රිබියුටසර් පුද්.සමාගම	4,646,019	3,475,889.36
	237,949,202	**141,629,293**
එකතු කළා: වැරදි නිවැරදි කිරීම සහ අධි වෙන් කිරීම් ආපසු හැරවීම	**2,998,277**	**(483,887)**
	240,947,478	**141,145,406**

11.විෂමික නියාමන බදු

උත්පාදන	60,644,586	58,400,781
සම්ප්‍රේෂණ	25,005,600.00	24,554,800
බෙදා හැරීම	104,784,000.00	106,863,400
	190,434,186	**189,818,981**

12. බලපත්‍ර අයදුම්පත් ගාස්තු	**525,000.00**	**474,000**
	525,000	**474,000**

13. වෙනත් ආදායම්

පොලිය	25,045,688.24	27,571,802
නිදහස් කිරීමේ ගාස්තුව	6,000.00	9,000
විවිධ ආදායම්	120,472.05	185,509
ජංගම දුරකථන ලබා ගැනීම සඳහා සේවකයින් විසින් ගෙවන ලද මුදල		-
ආදායම: ස්ථාවර වත්කම් අපහරණය	181,218.77	(81,120.18)
ප්‍රදාන-පුනරාවතර්න		
පාරිතෝෂික ප්‍රතිපාදන මත සත්‍ය ලාභය		-
	25,353,379	**27,685,191**

14.පුද්ගල පිරිවැය

පුද්ගල පඩිනඩි

කොමසාරිස්වරුන්ගේ වේතනය	1,958,625.00	1,694,000
වැටුප්	71,270,348.30	59,117,662
වෙනත් දීමනා	49,278,376.19	37,795,786
අතිකාල	4,517,736.80	1,146,437
සේවක අර්ථසාධක අරමුදල සඳහා දායකත්වය	10,703,846.25	8,860,486
සේවක භාරකාර අරමුදල සඳහා දායකත්වය	2,140,769.16	1,772,097
පාරිතෝෂික වියදම්	3,266,887.50	3,414,485
	143,136,589.20	**113,800,954**

15.මෙහෙයුම් වියදම්

පුහුණු සහ ගමන් වියදම් - විදේශීය සහ දේශීය		
විදේශීය සහ දේශීය පුහුණුව	1,146,000.00	678,918
විදේශ ගමන් වියදම්	0.00	186,500
අනියම් / දෛනික	0.00	-
සංචාර (දේශීය)	1,180,050.00	156,140
	2,326,050	**1,021,558**
පාරිභෝජ්‍ය ද්‍රව්‍ය		
ලිපි ද්‍රව්‍ය	1,776,751.58	1,184,736
ඉන්ධන සහ වාහන ගාල් කිරීම	5,013,902.00	4,498,444
පාරිභෝජ්‍ය ද්‍රව්‍ය	735,033.45	168,991
විනෝදාස්වාදය	246,779.40	37,684
	7,772,466	**5,889,855**

	2021 රු.	2020 රු.
ප්‍රවාහන සහ වාහන කුලී	11,943,631.77	11,045,672
පුවත්පත් සහ තැපැල් ඇතුළු සන්නිවේදනය	3,496,562.76	3,742,983
මුද්‍රණය සහ දැන්වීමිකරණය	4,931,890.40	6,253,876
සමීක්ෂණ	0.00	(47,500)
ගොඩනැගිලි සඳහා කුලී සහ ගාස්තු	19,677,558.50	18,559,912
විදුලිබලය	1,320,289.78	1,166,848
වෛද්‍ය	5,587,992.02	5,173,561
ජලය	223,968.15	211,710
රක්ෂණය	298,826.24	370,451
දායකත්ව මුදල්	0.00	-
සනීපාරක්ෂක සේවා	1,191,184.69	1,051,615
නීති සහ විමශර්න ගාස්තු	1,031,000.00	1,566,500
වෙනත් ගිවිසුම්	879,394.83	836,286
	50,582,299.14	**49,931,915**
වෙනත් සේවා		
මහජනතාව දැනුවත් කිරීමේ පිරිවැය	86,808,538.80	11,832,116
විගණකාධිපති ගාස්තු	1,000,000.00	670,000
සුභසාධනය සහ මහජන සම්බන්ධතා	228,065.30	281,386
මල් සැකසුම්	98,000.00	31,860
සේවක නියැලීම්		-
SARRC සිදුවීම්		-
විවිධ සහ වෙනත්	543,383.80	472,205
	88,677,988	**13,287,567**
ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා සහ නඩත්තු සහ ක්ෂය වීම		
වාහන නඩත්තු	1,960,106.95	1,154,103
කාර්යාල ගොඩනැගිල්ල නඩත්තුව	557,544.13	20,852
පරිගණක, උපකරණ සහ මෘදුකාංග නඩත්තුව	7,354,307.37	3,313,804
ගෘහ භාණ්ඩ සහ උපාංග නඩත්තුව	9,612.00	-
ක්ෂය වීම් ගාස්තු	18,390,111.96	19,631,935
	28,271,682	**24,120,693**
සමස්ත මෙහෙයුම් පිරිවැය	**177,630,486**	**94,251,588**
මූල්‍ය පිරිවැය		
බැංකු ගාස්තු	6,390	11,185
	6,390	**11,185**

විගණන කමිටු වාර්තාව

විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම-2021

විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය

2010 දෙසැම්බර් 14 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාතර්මේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර තිබෙන අංක පීඩී /55 දරන චක්‍රලේඛය අනුව 2020 වෂර්ය සඳහා පහත සඳහන් නිලධාරීන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් වශයෙන් පත්කර තිබුණි.

සාමාජිකයාගේ නම	විගණන හා කලමනාකරණ කමිටුවේ දරන තනතුර	නියෝජනය / තනතුර
උදේනි වික්‍රමසිංහ මහතා	විගණන කමිටු සභාපති	උප සභාපති- මහජන උපයෝගිතා කොමිශන් සභාව
මොහාන් සමරනායක මහතා	විගණන කමිටුවේ උප සභාපති	සාමාජික - මහජන උපයෝගිතා කොමිශන් සභාව
ජානකී මානෙල් විතානගම මහත්මිය	විගණන කමිටු ලේකම්	ලේකම් - මහජන උපයෝගිතා කොමිශන් සභාව
කේ.එස්.එම්.ද සිල්වා මහතා	භාණ්ඩාගාරයේ නියෝජිත	අධ්‍යක්ෂ - ජාතික අයවැය
බන්දුල අබේරත්න මහතා	භාණ්ඩාගාරයේ නියෝජිත	ප්‍රධාන අභ්‍යන්තර විගණක - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ආර්.පී.ඒ විමලවීර මහතා	නියෝජිත-රේඛීය අමාත්‍යාංශය	අතිරේක ලේකම් - රේඛීය අමාත්‍යාංශය
ඒ ඒ ටී අධිකාරි මහත්මිය	නියෝජිත-රේඛීය අමාත්‍යාංශය	ප්‍රධාන මූල්‍ය නිලධාරී - රේඛීය අමාත්‍යාංශය
ජී.එන්.කුමාරි මෙනවිය	නියෝජිත-රජයේ විගණන කායර්ාලය	විගණන අධිකාරී - රජයේ විගණන දෙපාතර්මේන්තුව
දමිත කුමාරසිංහ මහතා	නියෝජිත - මහජන උපයෝගිතා කොමිශන් සභාව	අධ්‍යක්ෂ ජනරාල් - මහජන උපයෝගිතා කොමිශන් සභාව
තිළිණ රණසිංහ මහතා	නියෝජිත - මහජන උපයෝගිතා කොමිශන් සභාව	අධ්‍යක්ෂක – මූල්ය , මහජන උපයෝගිතා කොමිශන් සභාව
එම් පී ධම්ර්රත්න මහතා	කැඳවුම්කරු	අභ්‍යන්තර විගණක - මහජන උපයෝගිතා කොමිශන් සභාව

2021 වසරේ පැවති විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා නියෝජිතයින්ගේ පැමිණීම

සාමාජිකයාගේ නම	**විගණන හා කලමනාකරණ කමිටුවේ දරන තනතුර**	**පළමු රැස්වීම 2021/03/10**	**දෙවන රැස්වීම 2021/10/28**	**තෙවන රැස්වීම 2021/12/23**
උදේනි වික්‍රමසිංහ මහතා	විගණන කමිටු සභාපති	√	√	√
මොහාන් සමරනායක මහතා	විගණන කමිටුවේ උප සභාපති	√	-	√
ජානකී මානෙල් විතානගම මහත්මිය	විගණන කමිටු ලේකම්	√	√	√
කේ.එස්.එම්.ද සිල්වා මහතා	භාණ්ඩාගාරයේ නියෝජිත	√	√	√
බන්දුල අබේරත්න මහතා	භාණ්ඩාගාරයේ නියෝජිත	√	-	-
ආර්.පී.ඒ විමලවීර මහතා	නියෝජිත-රේඛීය අමාත්‍යාංශය	-	√	-
ඒ ඒ ටී අධිකාරි මහත්මිය	නියෝජිත-රේඛීය අමාත්‍යාංශය	-	√	√
ජී.එන්.කුමාරි මෙනවිය	නියෝජිත-රජයේ විගණන කායර්ාලය	√	√	√
දමිත කුමාරසිංහ මහතා	නියෝජිත - මහජන උපයෝගිතා කොමිශන් සභාව	√	√	√
තිළිණ රණසිංහ මහතා	නියෝජිත - මහජන උපයෝගිතා කොමිශන් සභාව	√	√	√
එම් පී ධම්රත්න මහතා	කැඳවුම්කරු	√	√	√